# කලා
## සඟරාව

වැනි වෙළුම
- 5 කලාප



ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ ප්‍රකාශනයකි

I

# කලා සඟරාව

සිව්මාසිකය

ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ ප්‍රකාශනයෙකි.


1 වැනි වෙළුම (නව පෙළ)

4-5 වැනි කලාප (2009 ජනවාරි - අගෝස්තු)



සංස්කාරක මණ්ඩලය

මහාචාර්ය වෝල්ටර් මාරසිංහ (ප්‍රධාන සංස්කාරක)

මානවවිද්‍යාඥ පණ්ඩුල ඇඳගම



ශ්‍රී ලංකා කලා මණ්ඩලය,
ජාතික කලා භවන,
ආනන්ද කුමාරස්වාමි මාවත,
කොළඹ - 07.

මෙම සඟරාවේ ඇතුළත් ලිපිවල අන්තර්ගත අදහස් හා ප්‍රකාශ පළිබඳ වගකීම ඒ ඒ ලේඛකයන් සතු වන අතර, ඒවා අවශ්‍යයෙන් ම ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ අදහස් පිළිබිඹු නොකරන බව සැලැකුව මනා ය.

පිට කවරය හා පරිගණක අක්ෂර සැකැසුම
කසුන් ගීවන්ත විසිනි.

මුද්‍රණය
වී.ඩී.කේ. ප්‍රින්ටර්ස් විසිනි.

# III

සංස්කාරකයන් ගෙන්.........

ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ වාර ප්‍රකාශනය වූ "කලා" සඟරාව මෙවර වෙන් කරනු ලැබුවේ 2009 සාහිත්‍ය කලා මහෝත්සවය නිමිත්තෙන් එය පැවැත්වුණු පුලතිසි පුර නොහොත් පොළොන්නරු රාජධානිය තේමා කොටගෙන එහි උරුමයන් පිළිබඳ විමසා බැලීමට ය. සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය විසින් පුලතිසි වංශය (මෙය පුලතිසි පුර වංශය ය යි නිවැරදි විය යුතු ය) නමින් ප්‍රදේශය ම අළලා විවිධ ක්ෂේත්‍රයන්ට පැතුරුණු දැනුම් සම්භාරයක් ගෙන දෙන කෘතියක් පළ කරන බව ද සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් පොළොන්නරුව තේමා කොටගත් විවිධ පොත පත පළ කරන බව ද ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ සාහිත්‍ය අනුමණ්ඩලය ද සාහිත්‍යය නම් වූ වාර්ෂික ප්‍රකාශනය පොළොන්නරුව තේමා කොටගෙන පළ කරන බව ද සැලකිල්ලට ගත් කලා මණ්ඩලය "කලා" සඟරාව ද පොළොන්නරුව සාහිත්‍ය කලා ක්ෂේත්‍රයට වෙන් කිරීම වැළැක්විය නොහැකි බව අමුතුවෙන් කිය යුතු නො වේ. එහි දී කලා සඟරාවේ අවධාරණය වෙනස් මගකට ගෙන ඇත. පොත් සිය ගණනින් පළ කරනු ලැබුව ද මෙරට දීර්ඝ ඉතිහාසයේ පොළොන්නරු රාජධානි සමයේ සුවිශේෂී විජයග්‍රහණයන් විමර්ශනය කොට අවසන් කළ නොහැකි තරම් විශාල වන බව අමතක කළ නොහැකි ය.

කලා සඟරාව මෙරට දැනුම් පිපාසිත පාඨක ලෝකයා අතර පමණක් නො ව නවමු මතවාද ඉස්මතු කරන විද්වත් සමූහයන් අතර ද ඉතා ජනප්‍රිය ඥාන කෝෂයක් ලෙස පිළිගැනෙන බව නොරහසකි. එහෙයින් ම අපි විශ්වවිද්‍යාලය විද්‍යාර්ථීන්ට විශේෂ ඉල්ලීමක් කරමින් තම පර්යේෂණ ලිපි පළ කිරීම සඳහා කලා සඟරාව යොදාගන්නා ලෙස දන්වා සිටි අතර රටේ අවශේෂ විද්වතුන්, ලේඛකයනට ද තම නිර්මාණාත්මක ලිපි ලේඛන ඊට යොමු කරන ලෙස ආරාධනා කෙළෙමු. කිනම් හෝ හේතුවක් නිසා විද්වතුන් ගේ ලිවීමේ උනන්දුවේ හීනකමක් හෝ ලියන දෑ පළකිරීමේ දුෂ්කරතා අත්විඳීම නිසා හෝ පර්යේෂණ ලිපි ලැබෙන ප්‍රමාණය අඩු වෙමින් පවතින බව අකැමැත්තෙන් වුව ද පෙන්වාදිය යුතු ය. විද්වත් සමාජය කරා පියමං කිරීමට සූදනම් වන මොවුන් ගේ ගෝල බාලයන්ට කියවීම සඳහා සුදුසු පොත පත හිඟ වීමෙන් අනාගතයේ දී ගුණාත්මක බවින් අඩු උගතුන් බිහිවීමේ ප්‍රවණතාවක් ඇති විය හැකි බවට අනතුරු හැඟවීම අපේ යුතුකමක් කොට සලකන බැවින් එය නොසඟවා කියමු.

එහෙයින් නැවත නැවතත් විද්වත් සැමට තම වටිනා හරවත් නිර්මාණ කලා සඟරාව වෙත යොමු කිරීමෙන් පාණ්ඩිත්වය ප්‍රදර්ශන කරන අතර ම ඊළඟ පරම්පරාව දැනුමෙන් පොහොසත් කරන ලෙස අපි ආරාධනා කරමු.

# පටුන


| | පිටුව |
|---|---|
| 1. ජාතික උරුමයට පොළොන්නරුව එකතු කළ දේශීය පරිපාලන සම්ප්‍රදය<br>මහාචාර්ය මාලනී ඇඳගම | 1-22 |
| 2. පොළොන්නරු යුගයෙන් උදා වූ සිංහල සම්භාව්‍ය සාහිත්‍යය<br>මහාචාර්ය ආනන්ද අබේසිරිවර්ධන | 23-30 |
| 3. පොළොන්නරු යුගයේ කලාශිල්ප<br>සිරි නිස්සංක පෙරේරා | 31-51 |
| 4. පොළොන්නරුව බිතු සිතුවම්වල ප්‍රතිබිම්බිත කථාන්තරය<br>සිරිකුමාරසිංහ | 52-65 |
| 5. කලාවට තෝතැන්නක් වන සෞන්දර්ය විශ්වවිද්‍යාලයීය පුස්තකාලය<br>ඉමල්කා ප්‍රියදර්ශනී තිලකරත්න | 66-79 |
| 6. පොළොන්නරුව යුගයට අයත් ලොව පැරණිතම සාම ගිවිසුම<br>ඒ.එම්. කරුණාරත්න | 80-94 |
| 7. දැන් පශ්චාද් යුද්ධ සාහිත්‍යයක් බිහි වියයුතුයි<br>මහාචාර්ය තිස්ස කාරියවසම් | 95-102 |

# V

## ලේඛකයෝ

**මහාචාර්ය මාලනී ඇඳගම,** ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉතිහාසය හා පුරාවිද්‍යා අංශයේ හිටපු මහාචාර්ය. B.A. (ශ්‍රී ලංකා), Ph.D. (ශ්‍රී ලංකා)

**මහාචාර්ය ආනන්ද අබේසිරිවර්ධන,** සිංහල ශබ්ද කෝෂයේ ප්‍රධාන කර්තෘ. විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ සිංහලාංශයේ හිටපු මහාචාර්ය.

**සිරි නිස්සංක පෙරේරා,** සංස්කෘතික දෙපාර්තමේන්තුවේ හිටපු සහකාර අධ්‍යක්ෂ වරයෙකි.

**සිරි කුමාරසිංහ,** සංස්කෘතික අමාත්‍යාංශයේ කජුගම අනුරූ පාසැලේ ආරම්භක ප්‍රධානියා ය. ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ නර්තන මුද්‍රා නාට්‍ය හා රූකඩ රූපණ අනුමණ්ඩලයේ සාමාජිකයෙකි.

**ඉමල්කා ප්‍රියදර්ශනී තිලකරත්න,** B.A.(පේරාදෙණිය), 1 ශ්‍රේණිය පුස්තකාලය සහකාර - සෞන්දර්ය විශ්වවිද්‍යාලය, ප්‍රධාන පුස්තකාලය.

**ඒ.එම්. කරුණාරත්න,** B.A., M.A., ප්‍රවීණ ලේඛකයෙකි. සම්මානනීය ගත්කරු, විශ්‍රාම ලත් රාජ්‍ය පරිපාලන නිලධාරියෙකි.

**මහාචාර්ය තිස්ස කාරියවසම්,** ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිංහලාංශයේ හිටපු මහාචාර්ය වරයෙකි. මෙරට අග්‍රගණ්‍ය පර්යේෂක ග්‍රන්ථ කතුවරයෙකු මෙන්ම දේශකයකු ද වන එතුමා 2009 රාජ්‍ය සාහිත්‍ය කලා සම්මාන උළෙලේ දී "සාහිත්‍ය රත්න" සම්මානයෙන් පිදුම් ලැබුවේය. එදින ප්‍රධාන දේශනය පවත්වන ලද්දේ ද එතුමා විසිනි.

## ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ විධායක සභාව

මානවවිද්‍යාඥ පණ්ඩුල ඇඳගම (සභාපති)

මහාචාර්ය වෝල්ටර් මාරසිංහ (උප සභාපති)

විශ්වනාදන් සදානන්දම්

රෝහණදේව පෙරේරා

ආචාර්ය ලීල් ගුණසේකර

කමල් බී. දිසානායක (ලේකම් වැ.බ.)

# ජාතික උරුමයට පොළොන්නරුව එකතු කළ දේශීය පරිපාලන සම්ප්‍රදායය

මහාචාර්ය මාලනී ඇඳගම

ශ්‍රී ලංකාව අපරදිග ජාතීන් ගේ පාලනයට නතු වෙන තෙක් ම දේශීය පරිපාලන රටාව පදනම් වූයේ "පෙර සිරිත" හෙවත් සම්ප්‍රදායයන් මත ය. රජරට රාජධානි අවධියේ අගනුවර ලෙස සියවස් පහළොවක් පමණ තිස්සේ පැවති අනුරාධපුරය සහ පොළොන්නරුව මතු පරපුර සඳහා මෙම සම්ප්‍රදායයන් සුරක්ෂිත කොට දුන් මධ්‍යස්ථාන විය. ජාතික අනන්‍යතාව ගොඩනැගීමට මුල් වී ඇති මෙම සම්ප්‍රදායයන් අතුරෙන් පොළොන්නරුව කේන්ද්‍රකොට ගෙන සුරැකුණු කලාව, සාහිත්‍යය, වාරි තාක්ෂණය, වැනි විවිධ ක්ෂේත්‍රවලට අයත් සම්ප්‍රදායයන් අතර දේශීය පරිපාලන රටාවට අයත් "පෙර සිරිත" කැපී පෙනේ. රජු, රාජ සභාව සහ මැති ඇමතිවරුන් විසින් ක්‍රියාත්මක කරන ලද මධ්‍යම ආණ්ඩුවට අමතර ව ප්‍රාදේශීය සහ පළාත් පාලන ක්ෂේත්‍රවල ක්‍රියාත්මක වූ පරිපාලන රටාව තුළ විවිධ අවධිවල දී, විවිධ වෙනස්කම් වර්ධනය වී චිරාගත සම්ප්‍රදායයන්ට එකතු වී ඇත. මෙරට පරිපාලන රටාවේ විප්ලවීය වෙනස්කම් රැසක් සිදු කරන ලද 19 වැනි සියවසේ බ්‍රිතාන්‍ය පාලන අවධිය වන තෙක් පොළොන්නරුව කේන්ද්‍ර කොටගෙන වර්ධනය වූ ප්‍රාදේශීය සහ පළාත් පාලන රටාවෙන් දේශයට උරුම කොටදෙන ලද සම්ප්‍රදායයන් හඳුනාගැනීම ජාතිය ගොඩනැගීමේ නව කර්තව්‍යයට අත ගසා සිටින වර්තමාන ජන බලවේගයට බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත.

වර්තමාන පොළොන්නරුව දිස්ත්‍රික්කය නමැති පරිපාලන ඒකකය තමන්කඩුව, ඇළහැර, හිඟුරක්ගොඩ, මැදිරිගිරිය, ලංකාපුර වැලිකන්ද සහ දිඹුලාගල යන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ හතට අයත්

භූමි ප්‍රදේශයෙන් සමන්විත වන අතර මෙරට ඉතිහාසය තුළ විවිධ වකවානුවල දී එය විවිධ ප්‍රමාණයන් ගෙන් යුක්ත විය. ජනනාථපුර, පුලතිසපුර, කඳවුරු නුවර, විජයරාජපුර සහ පසුකාලයේ දී තමන්කඩුව ආදී විවිධ නාමවලින් හඳුන්වන ලද පොළොන්නරුව රජරට රාජධානිය පැවති අවධිය පුරා ම රජවරුන් ගේ විශේෂ අවධානයට යොමු වූ ප්‍රදේශයක් විය. අනතුරු ව වන්නියාර්වරුන් යටතේ පාලනය වූ මෙම ප්‍රදේශය උඩරට රජවරුන් බලවත් ව සිටි අවධියේ එම රාජ්‍යයට යටත් විය. 1815 දී උඩරට රාජ්‍යයේ සෙසු ප්‍රදේශ සමග ඉංග්‍රීසි පාලනයට නතු වූ පොළොන්නරුව එතැන් පටන් ඉංග්‍රීසීන් යටතේ හඳුන්වා දෙන ලද විවිධ පරිපාලන ප්‍රතිසංස්කරණ සමග වර්ධනය විය. 1948 දී ඉංග්‍රීසි පාලනයෙන් නිදහස් වීමෙන් පසු ව ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ක්‍රියාත්මක කරන ලද විවිධ ප්‍රාදේශීය සහ පළාත් පාලන ආයතන සමග ඉදිරියට යමින් පැරණි සෞභාග්‍යවත් අවධිය යළි ගොඩනැඟීමේ ප්‍රයත්නයක යෙදී සිටිනු අද දැකිය හැකි ය.

**අනුරාධපුර රාජධානිය අවධියේ පොළොන්නරුවේ පරිපාලන සම්ප්‍රදාය**

අනුරාධපුරය අගනුවර ලෙස පැවති අවධියේ පොළොන්නරුව දෙවෙනි අගනුවර ලෙස සැලකෙන තරමට වැදගත් විය. මහවැලි ගඟ අසබඩ පිහිටීම නිසා වාරිමාර්ග හා කෘෂිකාර්මික කටයුතුවලට අතිශය යෝග්‍ය වූ බැවින් අනුරාධපුර අවධියේ පවා රජවරුන් ගේ ආර්ථික ශක්තිය ගොඩනගා ගැනීම උදෙසා ඔවුහු පොළොන්නරුව සහ අවට ප්‍රදේශවල වාරි කර්මාන්ත ඉදි කළහ. ඒ අවධියේ මහසෙන් රජු (ක්‍රි.ව. 276-303) විසින් ඉදිකරන ලද ඇළහැර, මින්නේරි, කවුඩුලු ජල සම්පාදන ව්‍යාපාරය ද දෙවෙනි අග්බෝ රජු (ක්‍රි.ව. 608-618) විසින් ඉදිකරන ලද වර්තමානයේ කන්තලේ වැව ලෙස හැඳින්වෙන ගඟතලා වැව සහ ගිරිතලේ වැව ද අනුරාධපුර අවධියේ පොළොන්නරුව සහ ඒ අවට ප්‍රදේශවල ඉදිකරනු ලැබූ ප්‍රධාන වාරි ව්‍යාපෘති කිහිපයකි.

අනුරාධපුර රජධානි අවධියේ බොහෝ රජවරු අනුරාධපුරයට අමතර ව පොළොන්නරුවේ මාලිගා ඉදි කොට ඇතැම් කාලවල ඒවායේ වාසය කළහ. වසර 16 ක් (ක්‍රි.ව. 667-683) රජ කළ හතරවෙනි අග්බෝ රජු සිය පාලන කාලයෙන් වැඩි කලක් පොළොන්නරුවේ

වාසය කළ අතර, පළමු වරට එහි රාජකීය වාසය සඳහා මාලිගාවක් ද ඉදි කළේ ය. මෙම රජු මියගියේ ද පොළොන්නරුවේ දී ය.[1] සවැනි අග්බෝ රජු ද (ක්‍රි.ව. 772-777) බොහෝ කලක් පොළොන්නරුවේ වාසය කළ අතර ඔහු ද මියගියේ පොළොන්නරුවේ දී ය. පළ වෙනි උදය හෙවත් දෙවෙනි දප්පුල රජුට විරුද්ධ ව ඔහු ගේ පුත්‍රයා සහ සේනාධිනායක කුමන්ත්‍රණ කළ අවස්ථාවේ ඔවුන් මරවා රජතුමා පොළොන්නරුව තම වාසස්ථානය බවට පත් කොටගත්තේ ය.

ඉම් අනුව ජාතික සංවර්ධන කර්තව්‍යයේ දී ආර්ථික සංවර්ධනය උදා කොටගැනීමට අවශ්‍ය දයාද රැසක් ආරක්ෂා කොට පවත්වාගැනීමට පොළොන්නරුව උර දී සිටිනු දැකිය හැකි ය. අහසින් වැටෙන එක ම දිය බිඳුවක් හෝ ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලායාමට ඉඩ දිය යුතු නොවන බව පෙන්වාදුන් මහා පරාක්‍රමබාහු රජතුමා වැනි නරපතීන් එම ජලය රැස් කොට තබාගැනීමට ඉදි කොට ඇති මහ වැව් පමණක් නො ව ජාතික සංවර්ධනය උදෙසා වර්තමාන පාලක-පාලිත ජනතාවට එමගින් ලබා දී ඇති ආදර්ශය මෙරට ජාතික අනන්‍යතාව ඔප් නැංවීමට පොළොන්නරුව විසින් රැකගෙන සිටින සම්ප්‍රදායානුකූල ජාතික උරුමයකි.

අනුරාධපුර අවධියේ විවිධ කාලවල දී යම් යම් සුළු වෙනස්කම් සිදු වූ නමුත් සාමාන්‍ය තත්ත්වය ගත් කළ පාලන පහසුව සඳහා රජු ගේ සහායට යුවරජ, ඈපා, මාපා ආදී නම්වලින් හැඳින්වුණු පාලකයන් යටතේ පාලනය වූ ප්‍රාදේශීය පාලන ඒකක තුනක් තිබිණ. රුහුණු, මායා, පිහිටි යනුවෙන් හැඳින්වුණු එම පාලන ඒකක අතරින් පිහිටි හෙවත් රජරට සෘජු ව ම මහරජු යටතේ පැවති අතර එය පස්ලඳු නමින් හැඳින්වුණු ප්‍රාදේශීය පාලකයන් යටතේ පාලනය වූ කොටස් හතරකට බෙදා තිබිණි. උත්තර පස්ස, දක්ඛිණ පස්ස, පාචීන පස්ස, පශ්චිම පස්ස යනුවෙන් හැඳින්වුණු එම පරිපාලන ඒකක අතුරින් පොළොන්නරුව පාචීන පස්සට අයත් විය.

වසභ රජු ගේ රාජ්‍ය සමයට (ක්‍රි.ව. 67-111) අයත් වල්ලිපුරම් රන් සන්නසෙහි දැක්වෙන ආකාරයට උත්තර පස්සෙහි නකදිව, ඉසගිරි නමැති ඇමැති කෙනකු යටතේ පාලනය වූ ආකාරයට ම

ප්‍රාචීන පස්ස ට අයත් කාසිමොට්ටේ සෙල්ලිපිය අනුව වර්තමාන මඩකලපු දිස්ත්‍රික්කය දේවනක නම් ඇමතියකු යටතේ පාලනය වී ඇත. අලිමංකඩින් උතුරේ මුළු ප්‍රදේශය ම එකල නකදිව ලෙස හැඳින්වුණු බව ද එය උත්තර පස්සයට අයත් වූ බව ද පිළිගැනෙන[2] බැවින් වල්ලිපුරම් රන් සන්නස අනුව ඉසගිරි ඇමතිවරයා මුළු උත්තර පස්සය ම පාලනය කළ පස්ලදු තනතුර දැරුවාට සැක නැත. එපරිද්දෙන් එම රජු ගේ පාලන සමයේ දී ම මඩකලපුව කේන්ද්‍ර කොට පාලන කටයුතු කළ බව සඳහන් වී ඇති දෙවනක ඇමතියා ද ප්‍රාචීන පස්ස පාලනය කළ පස්ලදු තනතුර දරන්නට ඇතැ යි අනුමාන කළ හැකි ය. කෙසේ වුව ද වසභ රජු ගේ පාලන සමයට අයත් මෙම සෙල්ලිපි අනුව අනුරාධපුර රාජධානි අවධියේ ඉතා විධිමත් ප්‍රාදේශීය පාලන ක්‍රමයක් පැවති බව පැහැදිලි වන අතර, පොළොන්නරුව ප්‍රදේශය ප්‍රාචීන පස්සයේ පස්ලදු යටතේ පැවති බව පැහැදිලි ය.

සිදත්සඟරාව, පූජාවලිය, සද්ධර්මාලංකාරය, සද්ධර්මරත්නාවලිය වැනි මූලාශ්‍රය ගැඹුරින් අධ්‍යයනය කෙරෙමින්[3] අනුරාධපුර අවධියේ සහ ඉන් පසු කාලයේ ප්‍රාදේශීය පරිපාලනය පිළිබඳ කරුණු ඉදිරිපත් කොට ඇති එම්.බී. ආරියපාල මහතා ගේ නිගමනය[4] වනුයේ අනුරාධපුර අවධියේ පස්ස, දිසාව, රට සහ ගම වැනි ඉහළ සිට පහළට විහිදී ගිය පරිපාලන ඒකක තිබුණු බවත් පස්ලදු, දිසානා, රටලදු හෙවත් රටනා සහ විදනෙ හෙවත් ගම්ලදු හෙවත් ග්‍රාමභෝජක යනාදී නම්වලින් හැඳින්වුණු නිලධාරීන් විසින් රජු ගේ මෙහෙයවීම යටතේ ඒවා පාලනය කරනු ලැබූ බවත් ය. ඒ අනුව අනුරාධපුර රාජධානි අවධියේ ප්‍රධානතම උපනගරය වශයෙන් වැදගත් වූ පොළොන්නරුව පස්සට පහළින් වූ දිසාවක් ලෙස පාලනය වන්නට ඇතැ යි අනුමාන කළ හැකි ය. එපරිද්දෙන් ආර්ථික මෙන් ම දේශපාලන මධ්‍යස්ථානයක් වූ පොළොන්නරුව ප්‍රාදේශීය පරිපාලන ඒකකයක් ලෙස ක්‍රියාත්මක වෙමින් මහරජු යටතේ එක්සේසත් ව පැවති රාජ්‍යයෙහි ඒකීය ආණ්ඩුක්‍රමයක් පිළිබඳ සම්ප්‍රදායක් ගොඩනැංවීමට දායක වී ඇති බව දැකිය හැකි ය.

## පොළොන්නරුව රාජධානී අවධිය

අනුරාධපුර රාජධානිය බිඳ-දමා රජරට බලය ලබාගත් චෝළ පාලකයෝ පොළොන්නරුව සිය අගනුවර ලෙස පවත්වාගත්හ. ඔවුන් පරාජය කොට යළි දේශයේ ස්වාධීනත්වය ප්‍රතිෂ්ඨාපිත කළ සිංහල රජවරු ද අඛණ්ඩව පොළොන්නරුව සිය අගනුවර ලෙස පවත්වාගත්හ. ඒ අනුව එම ප්‍රදේශය අගනුවරට සුදුසු පරිදි ගොඩනැගූ අතර විශේෂයෙන් මහා පරාක්‍රමබාහු රජතුමා අගනුවර විධිමත් ව සැලසුම් සහගත ව ගොඩ නැඟී ය. නගරයේ පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ගත් කල අනුරාධපුර නගරයේ පැවති නාගරික පාලන ක්‍රමය පොළොන්නරුව නගරයේ ද ක්‍රියාත්මක වූවා නිසැක ය.

අනුරාධපුර අවධියේ ක්‍රියාත්මක වූ ප්‍රාදේශීය සහ පළාත් පාලන ක්‍රම පිළිබඳ තොරතුරු ලැබී ඇත්තේ ස්වල්ප වශයෙනි. අනුරාධපුර අවධියේ පාලන ක්‍රමය පිළිබඳ යම් යම් තොරතුරු විශේෂයෙන් සෙල්ලිපි ඇසුරෙන් ලබාගෙන ඇති අතර මෙහි ඉහත දක්වා ඇති එම ක්‍රමය පොලොන්නරු අවධියේ ද වැඩි වෙනසක් නැති ව ක්‍රියාත්මක වෙන්නට ඇති බව උගතුන් ගේ පිළිගැනීම වේ.[5]

පොළොන්නරුව අවධියේ රජු ගේ පරිපාලන කාර්යභාරය පහසු කොටගැනීම සඳහා ප්‍රාදේශීය පරිපාලන ක්ෂේත්‍රයේ දී සමස්ත රාජ්‍යය රජරට, දක්ෂිණ දේශය සහ රුහුණු රට යනුවෙන් ප්‍රධාන ඒකක තුනකට බෙදා තිබිණි. අනුරාධපුර අවධියේ මායාරට ලෙස හැඳින්වුණු ප්‍රදේශය පොළොන්නරුව අවධියේ හැඳින්වුණේ දක්ඛිණ දේශය නමිනි. අනතුරු ව ඒවා දිසා, රට, සහ ගම් වශයෙන් ප්‍රාදේශීය ඒකකවලට ද බෙදා ඒවාට රජු ගේ පාලනය යටතේ ක්‍රියා කළ නිලධාරීන් පත් කළ බවට සාධක ඇත. අනුරාධපුර අවධියේ දී ඔටුන්න හිමි කුමාරයා යුවරජු ලෙස රුහුණු රටේ පාලක තනතුර දැරීම සාමාන්‍ය තත්ත්වය වුවත්, පොලොන්නරු අවධියේ දී යුවරජු ගේ පාලන ප්‍රදේශය බවට පත් වී තිබුනේ දක්ඛිණ දේශය යි. දිසා සහ රට නමැති ඒකකවලට රජු ගේ සිතැඟි පරිදි නිලධාරීන් පත් කළ අතර ග්‍රාම පාලකයන් වශයෙන් නිරතුරු ව පත්කරනු ලැබුවේ ඒ ඒ ගම්වල ජ්‍යෙෂ්ඨ පුද්ගලයන් අතුරෙන් තෝරාගත් අය බව දැකිය හැකි ය. දේශයේ ඉතිහාසය පුරා ජාතික අනන්‍යතාවයේ අංගයක් ලෙස තහවුරු

වී ඇති මෙම සිරිත වර්තමාන සංවර්ධන සහ පරිපාලන කාර්ය භාරයට ජනතාව සහභාගී කරවා-ගැනීමේ මාර්ගයක් ලෙස උපයෝගී කොටගත හැකි දේශයට උචිත අනර්ඝ උරුමයකි.

අනුරාධපුර රාජධානි අවධියේ පලාත් පාලන ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වූ ආකාරයේ ආයතන කිහිපයක් පොළොන්නරුව රාජධානි අවධියේ ද ක්‍රියාත්මක වූ බව සාමාන්‍ය පිළිගැනීම වේ. ඒ අනුව අගනුවර සඳහා නගර ගුත්තික හෙවත් නගරාධිපතිවරයකු ගේ ප්‍රධානත්වයෙන් පැවති විධිමත් නාගරික පාලන ආයතනයක් ද රටේ සෙසු ප්‍රදේශවල ගමේ ජ්‍යෙෂ්ඨයන් ගෙන් සැදුම්ලත් ගම් සභා ද ක්‍රියාත්මක වී ඇත. අනුරාධපුර රාජධානි සමයේ වර්ධනය වූ ගම් සභාව ග්‍රාමීය පලාත් පාලන ආයතනයක් වශයෙන් පොළොන්නරු රාජධානි සමයේ දී ද අඛණ්ඩ ව ක්‍රියාත්මක වූ බව නිසැක ය. ග්‍රාමීය ජනතාව වෙත පැවරුණු වගකීම් ඉටු කිරීම ග්‍රාම නායකයකු ගේ උපදෙස් පිට සිදු කෙරුණු බව දක්වේ.[8] දක්ෂිණ දේශයේ ධාන්‍ය නිෂ්පාදනය දියුණු කිරීමට අදහස් කළ මහා පරාක්‍රමබාහු රජතුමා ග්‍රාම නායකයන් කැඳවා තම තමන් ගේ වැඩ කටයුතු ඉටු කිරීමට ඔවුන් උනන්දු කළ බව සඳහන් වේ.[9] පොළොන්නරු රාජධානි සමය වන විට ගම්සභා ක්‍රමය වඩාත් ව්‍යාප්ත වී වර්ධනය වී ග්‍රාම නායකත්වයක් බිහි වී තිබූ බව එයින් පැහැදිලි වේ. රජුට හෝ ප්‍රාදේශීය පාලකයකුට ගම සමග සම්බන්ධතා පැවැත්වීම ගමේ නායකයකු මගින් කළ හැකි තරමට ගම් සභාවේ සාමාජිකත්වය හිමි වූ පවුල් ප්‍රධානීන් අතුරෙන් නායකයකු හෙවත් එක් ප්‍රධානියකු නැගී ආ බව දැකිය හැකි ය.

ප්‍රාදේශීය පරිපාලන නිලධාරීන් වෙත මෙන් ම ගම් සභා වෙත සාමාන්‍ය පරිපාලන කටයුතු ඉටු කරලීම, ජනතාව ගෙන් රජයට අයවිය යුතු ආදායම් එකතු කිරීම සහ අධිකරණ කටයුතු ද පැවරී තිබිණි. ගොවිතැන් කටයුතුවලට අවශ්‍ය ජලය සම්පාදනය කෙරෙන වැව්, අමුණු, ඇළවේලි පාලනය සහ නඩත්තු කිරීම, ගමේ පාරවල්, ඒදඬු, පාලම්, නාන ළිං, පන්සල්, සොහොන් පිටි ආදිය ඉදි කිරීම සහ නඩත්තු කිරීම ප්‍රාදේශීය නිලධාරීන් ගේ උපදෙස් සහ අධීක්ෂණය යටතේ ඉටු කිරීම ගම් සභා වෙත පැවරී තිබූ සාමාන්‍ය

පරිපාලන කාර්යභාර විය.

ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරීන් සහ ආයතන වෙත පැවරී තිබූ වැදගත් ම කාර්යභාරය වූයේ නඩු හබ විසඳීම යි. ගමේ සිදු වන සියලු නඩු හබ මුලින් ම අදාළ ගම් සභාව වෙත ඉදිරිපත් කිරීම එකල පිළිගත් සම්ප්‍රදය විය. ගම් සභාවේ සාමාජිකයන් වූ ගමේ ජ්‍යෙෂ්ඨයන් ගමේ සිදු වන අපරාධ සහ වැරදි පිළිබඳ නඩු විසඳූ අන්දම අටද සන්නයේ සඳහන් වී ඇති බව මහාචාර්ය සිරිමල් රණවැල්ල දක්වා ඇත.[10] රජු ගේ උසාවිවල නඩු විසඳූ පිළිවෙළ අනුගමනය කෙරෙමින් ගම් සභාව ද දෙපක්ෂයේ සාක්ෂිකරුවන් ගේ ප්‍රකාශයන්ට ඇහුම්කන් දී චාරිත්‍ර ධර්ම සහ පූර්වාදර්ශ සලකා බලා තීන්දුව දුන් බව දක්වේ. ගම් සභාවල විනිශ්චය කටයුතුවල විශේෂ ලක්ෂණය වූයේ දෙපාර්ශ්වය සාමාදාන කිරීම ය. වැරදිකරුවන් බව ඔප්පු වූ අයට දඩ ගැසීම ද සිදු කෙරිණි. බදු ගෙවීම පැහැර හරින අයට සහ ණය ගෙවීම මග හරින අයට ඒවා ගෙවීමට බල කිරීමේ ක්‍රමයක් වූ "වැලැක්ම දැමීමේ" උපක්‍රමය ක්‍රියාත්මක කිරීමට ගම්සභාවලට බලය පැවරීම හෝපිගම සෙල්ලිපියෙන් සිදු කොට ඇත.[11] අනුරාධපුර අවධියේ 10 වැනි සියවසේ දී ක්‍රියාත්මක වූ මෙම දඬුවම් ක්‍රමය මහනුවර යුගයේ දී ද ක්‍රියාත්මක වූ බවට සාධක ඇති[12] බැවින් එය පොලොන්නරු අවධියේ දී ද ප්‍රාදේශීය නිලධාරීන් සහ ගම් සභා විසින් ක්‍රියාත්මක කරන ලද බව නිසැක ය. එය පොලොන්නරු අවධියේ මෙන් ම මෙරට සමාජයේ දීර්ඝ කාලයක් තිස්සේ ක්‍රියාත්මක කෙරුණු සම්ප්‍රදායානුකූල උපක්‍රමික දඬුවම් ක්‍රමයක්[13] විය.

ගම් සභාවෙන් දෙනු ලබන තීන්දුවක් පිළිගැනීමට අකමැති පාර්ශ්වයට ඊට ඉහළ මට්ටමේ රටනා හෝ දිසානා වැනි ප්‍රාදේශීය නිලධාරියකු වෙත අභියාචනාවක් ඉදිරිපත් කළ හැකි විය. අනතුරු ව ඔවුන් ගේ තීන්දුවට ද එකඟ නොවන්නේ නම් රටේ ඉහළ ම උසාවිය වූ රජු ගේ උසාවිය වෙත අභියාචනා ඉදිරිපත් කිරීමට අවසර තිබිණි. ඒ අනුව අනුරාධපුර රාජධානි අවධියේ රට පුරා ක්‍රියාත්මක වූ ප්‍රාදේශීය සහ පලාත් පාලන ක්‍රමය වැඩි වෙනසක් නැති ව පොළොන්නරුව රාජධානි අවධියේ ද ක්‍රියාත්මක වූ බව ද, සාම්ප්‍රදායානුකූල සිරිත්-විරිත් මත පදනම් වූ එම ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් වූ බව

ද පැහැදිලි ය.

යහපාලනය සාර්ථක කොටගැනීම සඳහා පොදු මහජනතාව සංවර්ධන සහ පරිපාලන කටයුතුවලට සහභාගී කරවාගැනීම නූතන සංකල්පයක් ලෙස වර්තමානයේ ලොව පුරා ප්‍රචලිත ව ඇතත් මෙරට ඉතිහාසයේ පණ්ඩුකාභය රාජ්‍ය සමයේ සිට ගම් සභා මගින් එම මූලධර්මය ක්‍රියාත්මක කොට ඇති බව පැහැදිලි ය. ඉංග්‍රීසි පාලකයන් විසින් නොසලකා හරින ලද ගම් සභා ක්‍රමය මෙරට ග්‍රාම පාලනයේ දී පරිපාලන මෙන් ම අධිකරණ කාර්යභාරයන් ලාභයටත් පහසුවටත් ඉටු කිරීම සඳහා කදිමට ගැළපෙන බව අවබෝධ කොටගැනීමෙන් පසුව "කෘෂිකාර්මික සමූහාණ්ඩු ක්‍රමයක්" ලෙස හඳුන්වා එය නව මුහුණුවරකින් 1872 දී ස්ථාපිත කරනු ලැබී ය. එපරිද්දෙන් මෙම ග්‍රාම පාලන ආයතනය මෙරට ජාතික සම්ප්‍රදාය මාලාවට එකතු වී වර්ධනය වීමේ දී පොළොන්නරුව රාජධානි අවධියේ එය සුරක්ෂිත කිරීමට ලබා දී ඇති දායකත්වය අතිවිශාල ය.

## පොළොන්නරුවේ වන්නිවරුන් උරුම කළ පරිපාලන සම්ප්‍රදාය

දහතුන්වැනි සියවසේ දී පොළොන්නරුව රාජධානිය බිඳ වැටී ජනතාව තෙත් කලාපයට සංක්‍රමණය වෙද්දී අගනුවර ද ක්‍රමයෙන් වෙනස් විය. දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පල, කෝට්ටේ ආදී වශයෙන් වූ රාජධානි අවධි කිහිපයක් පසු කොට 17 වැනි සියවස ආරම්භය වන විට සෙංකඩගල නුවර මධ්‍යස්ථානය කරගත් උඩරට රාජ්‍යය බලවත්ව නැගී-එන්නට විය. ඒ අතරතුර එනම්, පොළොන්නරුව රාජධානිය බිඳ වැටුණු 13 වෙනි සියවසේ සිට 17 වෙනි සියවස දක්වා කාලය තුළ, පැරණි රජරට ශිෂ්ටාචාරය ප්‍රබල ව පැවති අනුරාධපුර සහ පොළොන්නරුව අවට ප්‍රදේශ විශාල ලෙස ජනශූන්‍ය තත්ත්වයකට පත් විය. එසේ වුව ද, වාරි ශිෂ්ටාචාරය ප්‍රබල ව පැවති අනුරාධපුරය සහ පොළොන්නරුව අවට ප්‍රදේශවල කුඩා වාරිමාර්ග කේන්ද්‍ර කොටගෙන සුළු ජන කණ්ඩායම් වාසස්ථාන පිහිටුවාගත් ගම්මානවලින් යුක්ත ප්‍රදේශ බිහි විය. ඒවා "වන්නි" ප්‍රදේශ නමින් හැඳින්වුණු අතර, වනගත ප්‍රදේශයක පාලකයා යන අර්ථය ඇති "වන්නියාර්" ලෙස හැඳින්වුණු ස්වාධීන පාලකයන් යටතේ ඒවා පාලනය විය. දඹදෙණිය රාජධානිය පිහිටුවාගත් තුන්වෙනි

විජයබාහු රජු ද තම බලය ගොඩනැගීම ආරම්භ කළේ වන්නියාර්වරයකු ලෙස බව සෙනරත් පරණවිතාන මහතා ගේ අදහස වේ.[14] එබඳු වන්නි පාලකයන් 18 ක් පමණ සිටි බව කියැවේ.[15]

මෙම වන්නියාර්වරුන් ගැන පළමුවෙන් ම අසන්නට ලැබෙන්නේ 13 වෙනි සියවසේ දී ය. උතුරෙන් යාපන රාජ්‍යය සහ දකුණෙන් උඩරට රාජ්‍යයටත් කෝට්ටේ රාජ්‍යයටත් අතර මැද හලාවත සිට යාල දක්වා විහිදි ප්‍රදේශයේ වන්නිය, නුවර-කලාවිය, තමන්කඩුව (පොළොන්නරුව), බින්තැන්න, යාල, පානම වැනි ප්‍රදේශවල වන්නියාර්වරුන් ගේ පාලනය පැවතිණි. මෙම වන්නියාර්වරුන් අතුරෙන් ඇතැම් අය යාපනයේ පාලකයන්ට ද තවත් අය උඩරට සහ කෝට්ටේ රජවරුන්ට ද කප්පම් ගෙවමින් ඔවුන්ට අවනත ව තම ප්‍රදේශ පාලනය කළහ. ඒ අනුව එකල තමන්කඩුව ලෙස හැඳින්වුණු වර්තමාන පොළොන්නරුව සහ අවට ප්‍රදේශ එද වන්නියාර්වරයකු යටතේ පාලනය වූ ප්‍රදේශයක් ව පැවතිණි.

කෝට්ටේ රජවරුන් බලවත් ව සිටි අවස්ථාවල වන්නිවරුන් සියලු දෙනා ම තම අණසක යටතට ගැනීමට ද එම රජවරු සමත් වූහ. විශේෂයෙන් ලක්දිව අවසන් වරට එක්සේසත් කළ 6 වෙනි පරාක්‍රමබාහු රජතුමා එම වන්නි පාලකයන් 18 දෙනා ම යටත් කොටගත් බව සඳහන් වේ. එසේ වුව ද, පසුකාලීන ව කෝට්ටේ රාජ්‍යය සහ යාපනය රාජ්‍යය දුර්වල වෙමින් පෘතුගීසින් අතට පත් වෙද්දී උඩරට රාජ්‍යය ශක්තිමත් ව නැගී සිටි අතර, වන්නියාර්වරු උඩරට රජු ගේ ආධිපත්‍යය පිළිගත්හ. ඒ අනුව, තමන්කඩුව හෙවත් පොළොන්නරුව වන්නියාර් පාලන ප්‍රදේශය උඩරට රාජ්‍යයට අයත් ප්‍රදේශයක් බවට පත් විය.

සෙසු වන්නියාරුවරුන් මෙන් ම තමන්කඩුවේ වන්නියාර්වරයා ද බොහෝ අවස්ථාවල යාපනයේ හෝ මහනුවර හෝ කෝට්ටේ හෝ රජකෙනකුට කප්පම් ගෙවා අවනතභාවය දැක්වූ නමුත්, ඔහු සිය පාලන ප්‍රදේශය තුළ ස්වාධීන පාලකයෙක් විය. වන්නි රජවරු, වන්නි නිරින්දෝ, වන්නිවරු, වන්නි බණ්ඩාරවරු, ආදී විවිධ නම්වලින් හැඳින්වුණු වන්නි පාලකයෝ තම පාලන

ප්‍රදේශය තුළ ආධිපත්‍යය උරුම කොටගත් එක් පාලක පරපුරක් ගොඩනැගූහ. මොවුන් ගෙන් ඇතැම් අය ශ්‍රී මහා බෝධීන්වහන්සේ වැඩමවාගෙන පැමිණි වංශවත් පවුල්වලින් පැවත එන බවට අදහස් ඉදිරිපත් වී ඇති නමුත්, විල්හෙල්ම් ගයිගර් සහ සෙනරත් පරනවිතාන යන වියතුන් ගේ මතය අනුව මෙම වන්නියාර්වරුන් පැවත එන්නේ මාඝ ආක්‍රමණයට පෙර පැවති රජරට සමාජයේ පාලක ප්‍රභූ පන්තියෙනි.[16] මාඝ ගේ කුලීන ජන සංහාරයට හසු නොවී පැනගත් පිරිස කලක් වනගත ව සිට ඔහු ගේ බලය තුරන් වූ පසු ආපසු පැමිණ යළිත් සමාජ නායකත්වය බාරගත්හ. එතැන් පටන් වන්නිවරුන් ලෙස හැඳින්වුණු මොව්හු දඹදෙණි යුගයේ සිට එන කාලපරිච්ඡේදය මුළුල්ලේ නුවර කලාවිය හා තමන්කඩුව ඇතුළු ව පැරණි රජරට ශිෂ්ටාචාරයේ මුල් බිම් ප්‍රදේශවල සමාජ දයකත්වය සහ ප්‍රභූත්වය දරමින් පාලන කටයුතු කළහ.

තමන්කඩුව හෙවත් පොළොන්නරුව වන්නි ප්‍රදේශය තුළ පාලන බලය උරුම කොටගත් රදළ පෙලැන්තියක් ලෙස වන්නිවරු වර්ධනය වූහ. ඔව්හු තම ප්‍රදේශවල ගොවිතැන් කටයුතුවලට අවශ්‍ය වාරි මාර්ග පහසුකම් සැපයීමට මුල් වී ක්‍රියා කළ අතර, ඒ සඳහා බදු මුදල් එකතු කළහ. නඩු හබ විසඳීම වන්නියාර්වරුන් විසින් නම් කරන ලද විවිධ තරාතිරමේ නිලධාරීන් විසින් ඉටුකරන ලදී. සාමාන්‍ය තත්ත්වයන් යටතේ විවිධ රාජධානි අවධිවල රදළ පෙලැන්තිවලට අයත් වූ ආකාරයේ නින්දගම් හෙවත් ගම් වසම් මෙම වන්නියාර්වරුන්ට නොතිබුණු නමුත් ඔවුන් විසින් අත්පත් කොටගත් ඉඩම් කොටස් ඔවුන් සතු ව පැවති අතර, ඒවා සාමාන්‍ය ගම්වාසීන් ලවා වගා කරවාගත්හ. එම ඉඩම්වලින් ලැබෙන අස්වැන්න, ඒවායේ පදිංචිව සිටි අය ගෙන් ලැබෙන බදු මුදල් පහළ මට්ටමේ නිලධාරීන් ගෙන් ලැබුණු නොයෙකුත් තෑගි බෝග සහ රටසභා වාරවල දී එකතු කරන ලද දඩ මුදල් යනාදිය වන්නිවරුන් ගේ ප්‍රධාන ආදායම් මාර්ග විය.

එකල කුල ක්‍රමය මත පදනම් වී තිබූ සමාජ සංස්ථා දැඩි ව ක්‍රියාත්මක කෙරෙමින් එම ක්‍රමය ආරක්ෂා කොට පවත්වාගැනීම සඳහා සම්ප්‍රදයානුකූල ව ගොඩ නැගී ඇති "රට සභා" ක්‍රමය මෙම

වන්නි පාලන ක්‍රමය යටතේ මෙරට පරිපාලන ක්ෂේත්‍රයට එකතු කොට ඇති සුවිශේෂී සම්ප්‍රදයානුකූල ආයතනයක් වේ.[17]

## උඩරට රාජධානිය යටතේ පාලනය වූ පොළොන්නරුව රැකදූන් පරිපාලන සම්ප්‍රදය

වන්නියාර්වරුන් යටතේ පාලනය වූ තමන්කඩුව (පොළොන්නරුව) උඩරට රාජ්‍යයට අයත් වූයේ කවදා ද යන වග පැහැදිලි නැත. එසේ වුව ද ආක්‍රමණශීලී ව උඩරට අත්පත් කොටගැනීමේ ප්‍රබල උත්සහායක යෙදුණු පෘතුගීසීන් පරාජය කොට ඔවුන් මුහුදුබඩ ප්‍රදේශවලට සීමා කොට අනතුරු ව ඔවුන් එම ප්‍රදේශවලින් ද එලවා-දැමීමේ ජයග්‍රාහී සටන් මාලාවක නිරත වූ පළ වෙනි විමලධර්මසූරිය (1592-1604) සහ දෙවෙනි රාජසිංහ (1635-1687) යන රජවරුන් ගේ පාලන කාලවල දී නුවර කලාවිය සහ තමන්කඩුව යන ප්‍රධාන වන්නි ප්‍රදේශ ඇතුළු සෙසු වන්නි ප්‍රදේශ ද උඩරට රජවරුන් යටතට පත් වූ බව පිළිගනු ලැබේ.

පැරණි අනුරාධපුර රාජධානි අවධියේ සිට ක්‍රමයෙන් වර්ධනය වූ අංග ලක්ෂණවලින් යුක්ත විධිමත් පාලන රටවක් උඩරට රාජ්‍යයේ ක්‍රියාත්මක විය.[18] ඒ අනුව, ප්‍රාදේශීය පාලන සංවිධාන ව්‍යුහය යටතේ උඩරට රාජ්‍යය ප්‍රධාන වශයෙන් අදිකාරම් කොට්ඨාශ දෙකකට බෙදා තිබිණි. අනතුරු ව එම ඒකක දෙක දිසාවන් 12 කට සහ රට නැමැති ඒකක 9 කට බෙදා තිබූ අතර දිසාවනි දිසාවේවරයෙකු යටතේ ද රට නමැති ඒකකය රටේ මහත්මයා කෙනෙකු යටතේ ද පාලනය විය. එම සංවිධාන ව්‍යුහය අනුව තමන්කඩුව (පොළොන්නරුව) දිසාවනියක් වූ අතර එය දිසාවේවරයෙකු යටතේ පාලනය විය. උඩරට රාජ්‍යය අදිකාරම් කොට්ඨාශ දෙකට බෙදා තිබූ ආකාරය අනුව තමන්කඩුව දිසාවනිය පළවෙනි අදිකාරම් යටතේ පැවති ප්‍රදේශයක් විය. උඩරට රාජ්‍යයට යටත් වීමෙන් කලකට පසුව ප්‍රධාන පෙළේ රදළ ප්‍රභූවරයකු තමන්කඩුව දිසාවනියේ දිසාවේවරයා ලෙස නම් කරනු ලැබූ කාලය තෙක් ම උඩරට රාජ්‍යය අවධියේ දී ද දීර්ඝ කාලයක් තිස්සේ එම ප්‍රදේශය වන්නියාර් පෙළපතේ උරුමකරුවන් විසින් ම පාලනය කරන ලදී.

තමන්කඩුවෙන් බොහෝ දුරස්ථ වූ අගනුවර වාසය කළ රජු ගේ සහ අදිකාරම්වරයා ගේ අවධානය එම ප්‍රදේශ කෙරෙහි යොමු වූයේ ඉතා කලාතුරකිනි. ඒ නිසා දිසාවේවරයාට පුළුල් ස්වාධීන බලතල ක්‍රියාත්මක කිරීමේ ඉඩප්‍රස්ථා හිමි විය. තමන්කඩුව ප්‍රදේශය ජීවත් වීමට පහසුකම් අවම මට්ටමක පැවති ඉතා දුෂ්කර ප්‍රදේශයක් වූ බැවින් ද රාජ සභාවේ කටයුතුවලට සහභාගී වීමේ පහසුව සඳහා සියලු ම දිසාවේවරුන් මහනුවර පදිංචි ව සිටීමේ සිරිතක් පැවති බැවින් ද තමන්කඩුවේ දිසාවේවරයා ද පදිංචි ව සිටියේ මහනුවර ය. එබැවින් දිසාවේවරයාට පහළ මට්ටමේ නිලධාරීන්ට පුළුල් බලතල ක්‍රියාත්මක කිරීමට අවස්ථාව සැලැසූ වාතාවරණයක් තමන්කඩුවේ පැවතිණි.

රජු ගෙන් පත්වීමක් ලැබූ දිසාවේවරයා කිසියම් නිශ්චිත මුදලක් රාජ්‍ය භාණ්ඩාගාරයට ගෙවිය යුතු විය. දිසාවේවරයාට ඔහුගේ බල ප්‍රදේශය තුළ යුක්තිය විසඳාලීම, ආදායම් එකතු කිරීම සහ සෙසු සියලු පරිපාලන කටයුතු අධීක්ෂණය කිරීමේ වගකීම පැවරී තිබිණි. දිසාවේවරයා ගේ සහායට සිටි සියලු ම උපප්‍රධානීන් සහ නිලධාරීන් පත් කිරීමේ බලය ද දිසාවේවරයාට තිබිණි. එම නිලධාරීන් සම්ප්‍රදායානුකූල ව වර්ධනය වී තිබූ ප්‍රධාන වන්නියාර් සහ සෙසු නිලධාරී පෙළපත්වල අය අතුරෙන් තෝරාගැනීම සාමාන්‍ය සිරිත විය. දිසාවේවරයා යටතේ සිටි ප්‍රධානතම නිලධාරියා වන්නි උන්නැහේ නම් විය. එම තනතුරට පත්කරනු ලැබුවේ ඒ සඳහා පරම්පරාගත උරුමය තිබූ පවුලේ සම්ප්‍රදානුකූල උරුමකරුවන් වූ බැවින් උඩරට රාජධානි අවධියේ ද තමන්කඩුවේ ප්‍රායෝගික ව ක්‍රියාත්මක වූයේ 13 වැනි සියවසේ සිට වන්නියාර්වරුන් යටතේ පැවති පරිපාලන ක්‍රමයට බෙහෙවින් සමාන ක්‍රමයක් බව පැහැදිලි ය.

උඩරට රාජධානියේ සෙසු දිසාවන් පරිපාලන ඒකක වශයෙන් කෝරළවලට ද කෝරළ පත්තුවලට ද බෙදා තිබිණි. එහෙත් නුවර කලාවිය සහ තමන්කඩුව වැනි පැරණි රජරට රාජධානි ප්‍රදේශවල දිසාවනි පත්තුවලට ද පත්තු තුලානවලට ද බෙදා තිබිණි. එම තුලානය වර්තමාන ග්‍රාමසේවක කොට්ඨාශයක් හා සමාන විය. මුල් කාලයේ දී තමන්කඩුව පත්තු 12 කට බෙදා තිබිණි.

මෙගොඩ පත්තුව, ගල්ලැල්ල පත්තුව, කච්චුලු පත්තුව, ගිරිතලේ පත්තුව, කැලේගම පත්තුව, එගොඩ පත්තුව, කුඩාකර පත්තුව, වැදි පත්තුව, මඩිගේ පත්තුව, මහවීදි පත්තුව, කටුනේ පත්තුව, වෙල්ලවීදි පත්තුව නම් වූ එම පත්තු 12 පසු කාලයේ දී පත්තු තුනක් බවට පත්කොට තිබිණි. උඩරට රාජ්‍යය ඉංග්‍රීසීන් යටතට පත් වූ අවධිය වන විට සිංහල පත්තුව, මැද පත්තුව සහ එගොඩ පත්තුව නමින් තමන්කඩුව පත්තු තුනකින් සමන්විත විය. මෙම පත්තු භාර ව වන්නියාා හෙවත් මුදියන්සේ හෙවත් මොහොට්ටාල නමින් හැඳින්වුණු වන්නි ප්‍රධානීන් සිටි බව අයිවර්ස් මෙන් ම 1815 ත්‍රිකුණාමලයේ "කලෙක්ටර්" වරයා වූ ලූසිග්නාන් විසින් ද දක්වනු ලැබ ඇත. රට සභා විනිශ්චය කටයුතුවල දී අයකරන ලද ගාස්තු සහ දඩ මුදල්වලින් කොටසක් මෙම වන්නියාර්ට ද ලැබිණි. එක සමාන සමාජ ආර්ථික සහ පරිපාලන ලක්ෂණ පැවැති නිසාම සම්ප්‍රදායානුකූල ව වර්ධනය වූ පොදු සංස්කෘතිකමය ලක්ෂණ අනුව, නුවර කලාවියේ මෙන් ම තමන්කඩුවේ ද ප්‍රාදේශීය සහ පළාත් පාලන නිලනාම ද එක සමාන වූ බව දැකිය හැකි ය. ඒ අනුව නුවර කලාවියේ මෙන් ම තමන්කඩුවේ ද තුලානවල බදු සහ දඩමුදල් එකතු කළා වූ ද රට සභා විනිශ්චය කටයුතුවලට සම්බන්ධ වූවා වූ ද නිලධාරීහු කිහිප දෙනෙක් වූහ. බැද්දේ රාළ, ලේකම්, ලියනරාළ සහ උණ්ඩිය රාළ ආදී වූ එම නිලධාරීහු[20] පොදුවේ "කාරියකරවන්නන්" ලෙස හඳුන්වනු ලැබූහ. මෙම නිලධාරීන් පත් කළ වන්නි උන්නැහේ එම කාර්යය ඉටු කිරීමේ දී තීරණවලට එළඹුණේ ඔවුන් ගේ පරම්පරා උරුමය මෙන් ම ඔවුන් ගෙන් ලැබුණු තෑගි බෝග සලකා-බැලීමෙන් පසු ව ය. ගම්මුන් ගෙන් අය කළ බදු සහ ගාස්තුවලින් කොටසක් ලබාගැනීමට මෙම සුළු නිලධාරීන්ට ද අවසර තිබිණි. වන්නි පාලනයේ මුල් අවධියේ මෙන් ම උඩරට රාජ්‍ය පාලන අවධියේ ද වන්නිවරුන් ගේ ප්‍රධාන ආදායම් මාර්ගය වූයේ රට සභා වාරවල දී එකතු කරන ලද ගාස්තු සහ දඩ මුදල් ය. වන්නිවරුන් ගේ ආධිපත්‍යයේ නීත්‍යානුකූල භාවය රාජකීය අනුමැතිය උඩ සිදු වෙන බවට පරම්පරාගත විශ්වාසයක් පැතිර තිබූ බැවින් එම ආධිපත්‍යය පිළිබඳ කිසිවකු හෝ ප්‍රශ්න කළේ නැත.[21]

එපරිද්දෙන් මෙරට ජාතික උරුමයේ සහ ජාතික අනන්‍යතාවේ පදනම සැකසූ අනුරාධපුරය සහ පොළොන්නරුව (නුවරකලාවිය සහ තමන්කඩුව) වන්නි පාලකයන් යටතේ පාලනය වූ අවධියේ පරිපාලන ක්ෂේත්‍රයට අපූර්වතම සම්ප්‍රදයයන් රැසක් එකතු කොට ඇත. වර්තමානයේ පවා එම ප්‍රදේශවල භාවිත කෙරෙන "තුලාන" වැනි ප්‍රාදේශීය ඒකක නාම, වන්නි උන්නැහේ, බද්දේරාළ වැනි ප්‍රාදේශීය පාලකයන් ගේ නාම, පමණක් නො ව මෙම ප්‍රදශවල පරිපාලන කටයුතු මෙහෙයවීම සඳහා රජ කෙනකු නොමැති තත්ත්වයක් යටතේ බලගතු වංශවත් ප්‍රභූ නිලධර පැලැන්තියක් වර්ධනය වීම ඒ අතර කැපී-පෙනේ. සියවස් 15 ක් පමණ තිස්සේ මෙම ප්‍රදේශවල ගොඩනැගුණු දේශීය සම්ප්‍රදයයේ මූලික ලක්ෂණ නොනසා රැකදීමට වනගත ප්‍රදේශවල දුඃඛිත ජීවිත ගත කළ පොළොන්නරුවේ වන්නිවරුන් ඉටු කොට ඇති දයකත්වය අතිවිශාල ය.

මෙම අවධියේ මෙරට සම්ප්‍රදායානුකූල ආයතන මාලාවට එකතු කරන ලද නවතම ආයතනය වූයේ රට සභා ක්‍රමය යි. රජරට රාජධානි අවධියේ ප්‍රධාන ජීවනෝපාය වූ කෘෂිකර්මයට අවශ්‍ය ජල සම්පාදනයේ දී වැව් අමුණු ඉදිකිරීම සහ නඩත්තු කිරීම හා බැඳුණු සම්ප්‍රදයයන් ගොඩනැගුණු අතර ඒවා ක්‍රියාත්මක කෙරෙමින් පවත්වා-ගැනීම සඳහා ගම්සභා ක්‍රමය ද සම්ප්‍රදායානුකූල ව ආරම්භ වී වර්ධනය විය. එහෙත් රජරට අවධියේ පැවැති සෞභාග්‍යවත් වාරි සභ්‍යත්වය බිඳ-වැටී වනගත ප්‍රදේශවල සුළු ගම්මාන පමණක් ඉතිරි වී තිබූ වන්නි පාලකයන් ගේ අවධියේ ගම් සභාව වැනි පරිපාලන ආයතනයක අවශ්‍යතාවක් නො වී ය. එසේ වුව ද, විශේෂයෙන් කුල ක්‍රමය මත පදනම් වී තිබූ එම සමාජ ක්‍රමය පවත්වා-ගැනීමට කිසියම් විධිමත් ක්‍රමයක් අවශ්‍ය විය. ඒ සඳහා බිහි වූ සම්ප්‍රදායානුකූල සමාජ සංස්ථාවක් ලෙස රටසභා ක්‍රමය කැපී-පෙනේ. වන්නි පාලකයන් ගේ අවධියට පෙර රජරට ශිෂ්ටාචාර අවධියේ ක්‍රියාත්මක වූ බවට සාධක නොමැති වූ ද ඉංග්‍රීසීන් යටතේ නවතම පරිපාලනය සංස්ථා හඳුන්වාදීමත් සමග ක්‍රමයෙන් බිඳ-වැටුණා වූ ද සමාජ සංස්ථාවක් වුව ද රටසභා ක්‍රමය පොළොන්නරුව කේන්ද්‍රකොට මෙරට උරුමයට එකතු කරන ලද වැදගත් සම්ප්‍රදායානුකූල දයාදයකි.

රට සභා ක්‍රමය[21]

නුවරකලාවිය සහ තමන්කඩුව ආදී වූ ප්‍රදේශ වන්නියාර්වරුන් යටතේ මෙන් ම උඩරට රජවරුන් යටතේ පාලනය වූ අවධිවල එම ප්‍රදේශවලට විශේෂ වූ ගම් මට්ටමේ සමාජ සංස්ථාවක් ලෙස රටසභා ක්‍රමය ක්‍රියාත්මක විය. මෙම ක්‍රමය ආරම්භ වූයේ කවද ද, කෙසේ ද, සහ එහි ක්‍රියාත්මක වූ නීති රීති මොනවා ද යනු පැහැදිලි නැත. මූලික අරමුණු සහ ප්‍රතිපත්ති සමාන වුවත් විවිධ ප්‍රදේශවල රටසභා විසින් ඒවාට ආවේණික සිරිත්, විරිත්, සම්ප්‍රදායයන් අනුගමනය කළ බැවින් රට සභා ක්‍රමය පදනම් වී තිබූ කිසියම් ඒකවිධ නීති රීති මාලාවක් දැක්වීම අසීරු ය. ග්‍රාමීය ආයතනයක් වශයෙන් රට සභාවේ කැපී-පෙනෙන ලක්ෂණය වනුයේ එය ගම් සභාව මෙන් දේශපාලන හෝ ආර්ථික හෝ කාර්යභාරයක් ඉටු නොකිරීම සහ සමාජයීය වශයෙන් වැදගත් වූ කුල ගෝත්‍ර සම්බන්ධතා සහ පවුල් සංස්ථාව විධිමත් ව පවත්වා-ගැනීමට අවශ්‍ය පරිදි සුළු ආරවුල් විසඳාලීමේ අධිකරණ කාර්යභාරයක් ඉටු කළ සංස්ථාවක් ලෙස ක්‍රියාත්මක වීම යි.

මෙරට ඉතිහාසය පුරා ම වර්ධනය වෙමින් ක්‍රියාත්මක වූ කුල ක්‍රමය වනාහී බටහිර ජාතීන් විසින් හුවා දක්වා ඇති ආකාරයට සමාජ විෂමතා පදනම් කොට-ගත් භේදවාදී ක්‍රමයකට වඩා සමාජ සම්බන්ධතා විධිමත් කරනු ලැබූ ශිල්ප ශ්‍රේණි ක්‍රමයක් විය. ඒ අනුව, වන්නි ප්‍රදේශවල මෙන් ම මහනුවර රාජධානි සමයේ සියලු ම කුල සහ වරිගවලට අයත් පුද්ගලයන් විසින් මහත් ඉහළින් පිළිගනු ලැබූවා වූ ද, අගය කරනු ලැබූවා වූ ද, අනුගමනය කරන ලැබුවා වූ ද සමාජ සම්මත ක්‍රමයක් වූ කුල ක්‍රමය සුරක්ෂිත ව පවත්වා-ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද රට සභා ක්‍රමය එම ප්‍රදේශවල ජනතාවට කදිමට ගැලපුණු ක්‍රමයක් විය. සෑම කුලයක් ම සම්ප්‍රදායානුකූල ව එයට හිමි වූ සීමාවන් තුළ තැබීම ද, අසම්මත ලෙස කුල අතර විවිධ සම්බන්ධතා ඇති කොට-ගැනීම මගින් සමාජය ව්‍යාකූල තත්ත්වයකට පත් කිරීම වළක්වාලීම ද රට සභාවෙන් ඉටුකරන ලද ප්‍රධාන කාර්යයක් විය.[22]

රටසභාව සම්ප්‍රදායානුකූල ආයතනයක් වුව ද එය ක්‍රියාත්මක

වූයේ රාජ්‍ය අනුග්‍රහය ඇතිවය. එය ක්‍රියාත්මක කළ නිලධාරීන් පත් කරනු ලැබුවේ දිසාවේවරයා විසිනි. නුවරකලාවිය, තමන්කඩුව වැනි වන්නි ප්‍රදේශවල දිසාවේවරයාට පහළ මට්ටමේ නිලධාරීන් ගේ නිලනාම උඩරට සෙසු දිසාවන්වල භාවිත කෙරුණු නිලනාමවලට වඩා වෙනස් විය. ඒ අනුව සෙසු දිසාවන්වල දිසාවේට පහළින් සිටි කෝරාළ හා සමාන මට්ටමේ නිලධාරියා තමන්කඩුවේ දී හැඳින්වූයේ මොහොට්ටාල වශයෙනි. එසේ ම කෝරාළට පහළින් වූ අතපත්තු නිලය බද්දේරාළ වශයෙන් ද අතපත්තුට පහළින් වූ ආරච්චිල නිලය ලේකම වශයෙන් ද හැඳින්විණි. ඒ අනුව, මොහොට්ටාල, බද්දේරාළ, ලේකම, විදානෙ සහ විදානෙ ජේඩියා (Wacherman) සම්ප්‍රදයානුකූල ව දිසාවේවරයා විසින් රටසභාවට පත් කරන ලද ප්‍රධාන නිලධාරීහු වූහ. ඊට අමතර ව ආචාරියා, කන්දයා, බඩහැලයා, බෙරවායා ආදීන් ද රටසභාවට පත් කළ අතර, ඔවුන්ට පැවරී තිබුනේ රට සභාව රැස්වීමට අවශ්‍ය මඩුව සෑදීම, ඉහුම් පිහුම් සඳහා මෙවලම් සහ හැළිවලං සැපයීම ආදිය යි. එහෙත් විදානෙ ජේඩියාට රට සභාවේ රැස්වීම් ශාලාව සූදානම් කිරීමේ අවස්ථාවේ සිට අවසානය දක්වා ම පැවරුණ නිශ්චිත කාර්යභාරයන් රාශියක් තිබුණු බැවින් ඔහු ගේ සහභාගිත්වය ප්‍රධාන නිලධාරීන් සතර දෙනා ගේ සහභාගිත්වය තරමට ම අත්‍යවශ්‍ය විය.

රටසභාව සාමාන්‍යයෙන් දිසාවනිය බල ප්‍රදේශය කොට ක්‍රියාත්මක වූ බව පැහැදිලි වන්නේ දිසාවේවරයා විසින් තෝරා පත් කරනු ලබන රට සභාවකට ඔහු ගේ පාලන කොට්ඨාශය පුරා ම ක්‍රියාත්මක වීමේ බලය තිබුණු බැවිනි. උසස් ය යි සම්මත කුලයක කාන්තාවක පහත් යයි සම්මත කුලයක පිරිමියකු සමග පලායාම, කිසියම් ගැහැනියක හෝ පිරිමියකු පහත් ය යි සම්මත කුලයක අයකු සමග ස්වාමිපුරුෂයා සහ භාර්යාව ලෙස ජීවත් වීම, නීත්‍යානුකූල ව හෝ විවෘත ව පිළිගත හැකි ස්වාමිපුරුෂයකු නොමැති ව කිසියම් ස්ත්‍රියක ගැබ් ගැනීම, එකිනෙකට වෙනස් වරිග දෙකකට අයත් දෙදෙනකු විවාහ වීම, පහත් ය යි සම්මත කුලයකට අයත් කෙනකු ගේ නිවසක, එම නිවසේ අයට අයත් හැළිවලංවල, එම නිවසේ අය විසින් පිළිවෙළ කරන ලද ආහාර උසස් ය යි සම්මත කුලයක කෙනකු විසින් අනුභව කිරීම ආදී වශයෙන් කුල දූෂ්‍ය සහ වරිග

ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඉදිරිපත් කෙරෙන පැමිණිලි සහ රට සභාවක් රැස් වෙන අවස්ථාවල දී ඊට සම්ප්‍රදයානුකූල ව පිළිගත් පරිදි අඩුක්කු සැපයීමට අසමත් වීම, වැරදි ආකාරයට අඩුක්කු සැපයීම සහ සුළු ප්‍රමාණයේ අත් වැරදි සහ කට වැරදි සම්බන්ධ චෝදනා ද විභාග කිරීම රට සභාවට පැවරී තිබූ ප්‍රධාන කාර්යභාරය විය.

රට සභාවට කිසියම් පැමිණිල්ලක් ඉදිරිපත් වූ විට සමාප්‍රදයානුකූල ව ක්‍රියාත්මක කෙරෙන ආකාරයට එම පැමිණිල්ල විසඳීමට ක්‍රියා කිරීම මොහොට්ටාල විසින් ආරම්භ කරනු ලැබේ. පළමුවෙන් ම විත්ති පක්ෂයට ඉලව්, මඟුල්, තැටිපියා[23] තහනම් කොට රට සභාව රැස්වීමට දින නියම කොට ඊට සූදනම් වන ලෙස දන්වනු ලැබේ. රට සභාවේ රැස්වීම පැවැත්වීමට නියමිත ගමේ ඒ සඳහා විශේෂ මඩුවක් ඉදි කොට නියමිත පරිදි ආසන පනවා රට සභා විනිශ්චය ශාලාව සූදනම් කෙරේ. ගමට පැමිණෙන රට සභා නිලධාරීන්ට පමණක් නො ව මෙම අවස්ථාව දැක බල- ගැනීමට පැමිණෙන අයට ද ඔවුන් ගේ කුලය, වරිගය, තරාතිරම අනුව රැස්වීමට ආසන පැනවීම, ඉඩ ප්‍රස්ථා සැපයීම සහ ආහාර සැපයීම ද අදාළ ගම්වාසීන් විසින් සිදු කළ යුතු වේ.

මොහොට්ටාල මුල සුන දරන රට සභාවේ බද්දේරාළ, ලේකම, විදානෙ පේඩියා යන නිලධාරීන්ට අමතර ව සුළු ගම්මුලාදෑනීන් ද ගමරාළ සහ වෙනත් වැඩිහිටියන් ද අසල්වැසි ගම්වාසීන් ද එම ස්ථානයට රැස්වීම සම්ප්‍රදයානුකූල ව සිදු කෙරේ. ආසන පැනවීමේ දී තරාතිරම අනුව විවිධ මට්ටමින් සිදු කෙරෙන අතර නිලධාරීන් ඇතුළු රට සභාවේ ප්‍රධාන නිලධාරීන් තිදෙනාට එක උඩ එක වශයෙන් පැදුරු දෙකක් එලා ඊට උඩින් ඇතිරිල්ලක් දැමූ අතර සෙසු සුළු මුලාදෑනින්ට සහ ගම්වැසියන්ට එක් පැදුරක් එලා ඇතිරිල්ලක් දමනු ලැබී ය. විදානෙ පේඩියාට එලනු ලැබුවේ එක පැදුරක් පමණි.[24]

නිලධාරීන්ට වතුර නම්බු කිරීමෙන් (මුහුණ, කට සෝද- ගැනීමට වතුර ලබාදීමෙන්) සහ බුලත් ඉලත්තට්ටු පිරිනැමීමෙන් පසු ව නඩුව විනිශ්චය කිරීම ආරම්භ කෙරේ. නියමිත පරිදි කුල

ගෝත්‍රවලට අනුකූල ව කාන්තාවන් විසින් ආහාර පිළිවෙළ කරනු ලැබේ.[25]

රටසභාවේ කටයුතු සිදුවෙද්දී විත්ති පැමිණිලි දෙපක්ෂය මෙන් ම රැස්ව සිටින සියලු දෙනා හැසිරිය යුතු ආකාරය මොහොට්ටාල විසින් පැහැදිලි කිරීමෙන් පසු ව නඩු විනිශ්චය ආරම්භ කෙරේ. පළමුවෙන් විත්ති පක්ෂයෙන් ද අනතුරු ව පැමිණිලි පක්ෂයෙන් ද රටසභාවේ නිලධාරීන් විසින් දිගින් දිගට ම ප්‍රශ්න කරනු ලැබේ. විත්තිය කාන්තාවක් නම් ඇගේ ස්වාමිපුරුෂයාට හෝ ඇගේ සහෝදරයකුට ඇය වෙනුවෙන් ඉදිරිපත් විය හැකි ය. අවසානයේ ඇය ගෙන් ද ප්‍රශ්න එක දෙකක් අසනු ලැබේ. එවිට ඇය සබකෝලයෙන් යුතු ව මදක් ඉදිරියට පැමිණ, ලජ්ජාවෙන් සහ භය පක්ෂපාතී ව සිහින් හඬින් එම ප්‍රශ්නවලට පිළිතුරු දී එතැනින් ඉවත්වීම සම්ප්‍රදායානුකූල ව සිදු කෙරේ. පූරා දිනයක් හෝ දින කිහිපයක් හෝ අඛණ්ඩ ව සාක්ෂි විමසමින් නඩුව අවසානය වනතෙක් විනිශ්චය කිරීමෙන් පසු ව මොහොට්ටාල විසින් දඬුවම් නියම කරනු ලැබේ. දඩ ගැසීම සහ කුලයෙන් හෝ වරිගයෙන් පහ කිරීම රටසභාව විසින් පනවන ලද ප්‍රධාන දඬුවම් ක්‍රම විය. අයකරනු ලබන දඩ මුදල් සම්ප්‍රදායානුකූල ව නියමිත පරිදි දිසාවේවරයා ද ඇතුළු රටසභා වාරයට සහභාගී වූ නිලධාරීන් අතර බෙදා ගනු ලැබී ය.

වන්නියාර්වරුන් යටතේ මෙන් ම උඩරට රජවරුන් යටතේ ද තමන්කඩුව ප්‍රදේශයේ ප්‍රචලිත ව ක්‍රියාත්මක වූ මෙම ප්‍රාදේශීය අධිකරණ ආයතනය ඉංග්‍රීසීන් ගේ පරිපාලන ක්‍රම හඳුන්වා-දීමත් සමඟ ක්‍රමයෙන් පරිහානියට පත් විය. 1833 සිදු කරන ලද සිවිල් සේවා සහ අධිකරණ ප්‍රතිසංස්කරණ යටතේ සෙසු ප්‍රදේශවල ගම් සභාව මෙන් ම වර්තමාන උතුරු මැද පළාතට අයත් නුවරකලාවිය සහ තමන්කඩුව වැනි ප්‍රදේශවල ප්‍රචලිත ව පැවති රටසභා ක්‍රමය ද යටපත් විය. එහෙත් ග්‍රාම පාලන ආයතනයක් වශයෙන් ගම් සභාවේ වටිනාකම අවබෝධ වූ 19 වැනි සියවස මැද භාගයේ දී ක්‍රමයෙන් නව මුහුණුවරකින් එම ආයතනය ප්‍රතිෂ්ඨාපිත කෙරිණ.[26] එහෙත් ඉංග්‍රීසීන් විසින් හඳුනාගන්නා ලද පරිදි කුල ක්‍රමය ආරක්ෂා කිරීම

සඳහා වූ රටසභාව පිළිබඳ ව ඔවුන් ගේ කිසිදු තැකීමක් හෝ නො වී ය. ඒ නිසා 20 වැනි සියවස ආරම්භක අවධියේ දී තමන්කඩුව ප්‍රදේශයේ සාම්ප්‍රදායික ප්‍රාදේශීය ආයතනයක් වූ රටසභාව අභාවයට පත් විය. රටසභා ක්‍රමය පිළිබඳ ව දැනට ලැබී ඇති හොඳ ම විස්තරය ලියා ඇති කපුරුහාමි 1909-1910 කාලයේ දී "දැනට තනි කකුලෙන් නැගී සිටින රටසභාවල බිඳ-වැටීම පෙනෙන මානයේ යැ" යි කිවූ පරිදි ම එය වැඩි කල් නොගොස් අභාවයට පත් විය.

1815 මාර්තු මාසයේ ඉංග්‍රීසීන්ට උඩරට රාජ්‍යය පවරා-දුන් ගිවිසුමට තමන්කඩුවේ දිසාවේවරයා වූ ගලගම ද අත්සන් කෙළේ ය. එම ගිවිසුමේ 4 වෙනි වගන්තියෙන් උඩරට ප්‍රධානීන් ගේ නිලතල, බලතල සහ වරප්‍රසාද ආරක්ෂා කොට-දීමට පොරොන්දු වූ බැවින් ගලගම දිසාවේවරයාට තව දුරටත් තමන්කඩුවේ දිසාවේ තනතුර හිමි වූ අතර සෙසු වන්නි ප්‍රධානීන්ට ද ඔවුන් දරමින් සිටි නිලතල හිමි විය. එසේ වුව ද, 1818 පළවෙනි නිදහස් සටන සුණුවිසුණු කළ ඉංග්‍රීසිහු මුහුදුබඩ ප්‍රදේශවල සිදු කොට තිබූ ආකාරයට ම උඩරට ප්‍රදේශවල දේශීය නිලධාරීන්ගේ සහ මූලාදෑනිවරුන් ගේ ද බලතල සිඳ-බිඳ දැමීමට පියවර ගත්හ. 1833 දී මධ්‍යම ආණ්ඩුවේ මෙන් ම ප්‍රාදේශීය පරිපාලන ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කළ ප්‍රතිසංස්කරණ හේතු කොට ඇතැම් දේශීය ආයතන දුර්වල වූ අතර, ඇතැම් ආයතන බිඳ වැටුණි. ඒ හේතු කොට ප්‍රධාන වශයෙන් එතෙක් ක්‍රියාත්මක වෙමින් පැවති සම්ප්‍රදායානුකූල ප්‍රාදේශීය පරිපාලන ආයතන සහ මූලාදෑනි පැළැන්තිය වෙනුවට විදේශීය පරිපාලන සහ අධිකරණ රටාවක් සහ නිලධර පැළැන්තියක් මෙරට ස්ථාපිත කිරීමත් සමග පොළොන්නරුව ද එම තත්ත්වයට මුහුණදීම පුදුමයට කරුණක් නො වේ.

නිදහස් නිවහල් රාජ්‍යයක් සහ යහපාලනයක් ගොඩනැගීමේ දී දේශයේ ඉතිහාසය මගින් හෙළිකරනු ලබන ජාතික උරුමයෙන් ආදර්ශ ලබාගැනීම අනිවාර්යයෙන් සිදු විය යුතු බව ප්‍රචලිත මෙන් ම ප්‍රත්‍යක්ෂ කරුණකි. එබැවින් දේශයේ පැවැත්ම සුරක්ෂිත කිරීම සඳහා මුලින් ම දෙවෙනි අගනුවර වශයෙන් ද, අනතුරුව ප්‍රධාන අගනුවර වශයෙන් ද එය බිඳ වැටීමෙන් පසු ව, කුඩා ස්වාධීන වන්නි පාලකයන් යටතේ සුරක්ෂිත වූ ඒකකයන් වශයෙන් ද, ඉක්බිති විදේශීය

ආක්‍රමණයට යටත් නො වී දේශයේ ස්වාධීනත්වය රැකගත් උඩරට රාජ්‍යයට එකතු වෙමින් ද පැවති පොළොන්නරුව කේන්ද්‍ර කොටගෙන වර්ධනය වූ ප්‍රාදේශීය ආයතන සහ මූලාදෑනි පැළැන්තිය ජාතියේ උරුමය රැකදුන් ආකාරය ඉතිහාසයේ ලියැවී ඇත. එබැවින් වර්තමානයේ ජාතික සංවර්ධනය මෙහෙයවන නායකයන් විසින් ඒවා අධ්‍යයනය කොට සුදුසු පරිදි ආදර්ශ ලබාගැනීම සංවර්ධනය වේගවත් වීමටත් පලදායක වීමටත් ජනතාවට සමීප වීමටත් හේතු වනවා නිසැක ය. එවිට සංවර්ධනය සාර්ථක වනු ඇත; අර්ථවත් වනු ඇත.

## සටහන්

1. නිකලස්, සී.ඩබ්ලිව්, පරනවිතාන. එස් - සංක්ෂිප්ත ලංකා ඉතිහාසයක් (සිංහල පරිවර්තනය. I මුද්‍රණය 2004, නුගේගොඩ) 190 පිටුව.
2. මේධානන්ද ස්ථවිර. එල්ලාවල - පාචීන පස්ස, උත්තර පස්ස, නැගෙනහිර පලාත හා උතුරු පලාතේ බෞද්ධ උරුමය (දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ, 2003) 21 පිටුව.
3. Ariyapala. M.B. - Society in Medieval Ceylon (Dept. of Cultural Affairs - Colombo. 19968) pp. 118-120
4. - එම කෘතිය - 120 පිටුව.
5. ලංකා විශ්වවිද්‍යාලය - ලංකා ඉතිහාසය. පළමෙනි වෙළුම, දෙවෙනි කාණ්ඩය. (1976 කැලණිය)
6. Ariyapala. M.B. - Society in Medieval Ceylon (Dept. of Cultural Affairs - Colombo. 19968) pp. 120
7. - එම - 119 පිටුව.
8. ලංකා විශ්වවිද්‍යාලය - ලංකා ඉතිහාසය I වෙළුම දෙවෙනි කාණ්ඩය (1976 කැළණිය) 526 පිටුව.
9. - එම -
10. Ranawella, Sirimal - Vevalkatiye slab Inscription and its Coties(1996 Colombo)
11. E.Z. Vol 3 No 4 Line B14.
12. නොක්ස්. රොබට්, එද හෙළදිව - පරිවර්තනය

13. "වැලැක්ම දැමීම" දඬුවම් ක්‍රමය අනුව සිදුවුණේ බදු ගෙවීම හෝ ණය මුදලක් ගෙවීම හෝ පැහැර හරින අයෙකුට එම මුදල් ගෙවා දැමීමට බල කිරීම යි. හිඟබදු අය කිරීම සඳහා නම් අදාළ නිලධාරියාට මග තොටේ දී වුව ද බදු පැහැර හැරිය පුද්ගලයා මුණ ගැසුන හොත් මෙම දඬුවම් ක්‍රමය ක්‍රියාත්මක කළ හැකි විය. ණය ගෙවීම පැහැර හැරිය අයෙකු සම්බන්ධයෙන් ගම් සභාවට මෙම දඬුවම ක්‍රියාත්මක කළ හැකි විය. මෙහි දී සිදු වුණේ වරදකරු අල්ලාගෙන ශක්ති සම්පන්න පුද්ගලයන් කිහිප දෙනෙකු ඉදිරිපිට පොළොවේ රවුමක් සලකුණු කොට ඒ රවුම තුළ වරදකරු හිඳුවා තැබීම යි. උක්කුටික ස්වභාවයෙන් සිඳුවා තබන වරදකරුට හිඟ බදු මුදල් හෝ ණය මුදල් ගෙවා-දමන තෙක් එතැනින් ඉවත්වීමට ඉඩ නොදී රඳවා තබා-ගැනීම "වැලැක්ම දැමීම" නම් වේ. බොහෝ විට වරදකරු එසේ රඳවා තබනු ලබන්නේ තද අව් රශ්මිය ඇති ස්ථානයක යි. වරදකරු හිතවක්කාර හෝ දඩබ්බරවීමට උත්සාහ කරන අයෙකු හෝ නැතහොත් පෙර අවස්ථාවක දී ඇප පිට නිදහස් වී ගොස් පොරොන්දුව ඉටු නොකළ පුද්ගලයෙකු හෝ වුවහොත් ඔහුගේ ශාරීරික මෙන් ම මානසික පීඩනය වැඩි කිරීම සඳහා උරහිස මත ගලක් ද පටවනු ලැබේ. උක්කුටිකයෙන් ඉඳගෙන උරහිස මත ගලක් ද පටවාගෙන සිටීම ඉතා අසීරු වුවත් එම ගල විටින් විට උරයෙන් උරයට මාරු කිරීමට විනා එය බිම තැබීමට ඉඩ දෙන්නේ නැත. මේ තත්ත්වයෙන් වේදනාවට සහ පීඩාවට පත් වන වරදකරු හැකි ඉක්මණින් කිසියම් හිතවතකු ගේ මාර්ගයෙන් ණය ගෙවා-දැමීම හෝ නැතහොත් මතු දිනයක දී ගෙවීම සඳහා ඇපකරුවකු ගේ මාර්ගයෙන් නිදහස ලබාගැනීමට පෙළඹේ. මේ අනුව වැලැක්ම දැමීම ප්‍රාදේශීය නිලධාරීන් සහ ගම් සභාව මගින් ක්‍රියාත්මක කරන ලද සම්ප්‍රදයික උපක්‍රමික දඬුවමක් විය.

14. නිකලස්. සී.ඩබ්ලිව්, පරණවිතාන. එස් - සංක්ෂිප්ත ලංකා ඉතිහාසය (සිංහල පරිවර්තනය. 2004. නුගේගොඩ)

15. - එම - 433 පිටුව.

16. කරුණානන්ද. උක්කුබණ්ඩා - නමන්කඩුව 1815 - 1900 (කඩවත 1993) VI පිටුව.

17. බලන්න පහත පිටු.

18. ඩොයිලි. ජෝන් - පරිවර්තනය ඇල්මලපොල එච්.එම්. සෝමරත්න. (බොරලැස්ගමුව 2005) සිංහලේ ආණ්ඩුක්‍රමය පිළිබඳ ලුහුඬු සටහන්

19. Eevers R.W. - The Meannual of the North Central Province (Colombo 1889) Page 11.
කරුණානන්ද. උක්කුබණ්ඩා - ඉහත සඳහන් කෘතිය. 7 පිටුව.
20. පීරිස්. රල්ෆ් - සිංහල සමාජ සංවිධානය (1994 කොළඹ) 258 පිටුව.
21. Kapuruhamy. K.A. - Rata Sabhawa. J.R.A.S.(Ceylon) Vol. xxx viii pp. 42-68. මෙම ලිපිය 20 වැනි සියවස මුල් දශකයේ දී එනම් 1909-1910 කාලයේ රට සභා ක්‍රමය පරිහානියට පත් වෙමින් තිබූ අවධියේ එම ක්‍රමය ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳ ව එච්.ඩබ්ලිව්. කොඩ්රිංටන් ගේ ඉල්ලීම පරිදි මඩුකන්ද රටේ මහත්මයා වූ කේ.ඒ. කපුරුහාමි විසින් සම්පාදනය කරන ලද සටහනකි.
22. - එම -
23. ඉලව්, මගුල් තහනම යනු අවමංගල සහ මංගල උත්සව තහනම් කිරීම යි. කිසියම් වරදක් කළ බවට කිසියම් පුද්ගලයකුට එරෙහි ව චෝදනා එල්ල වීම නිසා රට සභාවේ ප්‍රධානීන් විසින් ඔහුට ඉලව්, මගුල් තහනම් කිරීමෙන් පසු ව එම පුද්ගලයාට තම වරිගයේ හෝ තම කුලයේ හෝ කිසිවකු ගේ ඉලව්, මගුල්වලට සහභාගීවීම තහනම් වේ. එසේ ම එම චෝදනා එල්ල වී සිටින පුද්ගලයා ගේ පවුලේ එබඳු අවස්ථාවලට සහභාගී වීම එම වරිගයේ හෝ කුලයේ සියලු දෙනාට ද තහනම් වේ. එසේ වුව ද, චෝදනා ලබා සිටින පුද්ගලයා ගේ නිවසට යාම, ඔහුට අවශ්‍ය උදව් කිරීම, ඔහු ගේ වරිගයේ හෝ කුලයේ අයට තහනම් නො වේ. එහෙත් ඔහු ගේ නිවසේ පිඟාන්වල ආහාර ගැනීම, කුලයේ සහ වරිගයේ අයට තහනම් වන අතර, චෝදනා ලබා සිටින පුද්ගලයාට ඔවුන් ගේ නිවෙස්වල අයගේ පිඟාන්වල ආහාර දීම ද තහනම් වේ. මෙය "තැටිපියා" තහනම නම් වේ.
24. Kapuruhamy. K.A. ඉහත සඳහන් කෘතිය 50 පිටුව.
25. මොහොට්ටාල ඇතුළු නිලතලවලට අනිවාර්යයෙන් ම පත් වීම ලැබුයේ ගොවි කුලයේ අය යි. පහත් ය යි සම්මත කුලයක ජනයා වාසය කළ ගමක රට සභාව පැවැත්වූයේ නම් එගම වැසියන් නොපිසූ ආහාර ද්‍රව්‍ය සපයා දිය යුතු වූ අතර ඒවා පිසගැනීම සඳහා ගොවි කුලයේ කාන්තාවන් ද කැඳවාගත් අතර බඩහැලයා සහ අනිකුත් ශිල්පීන් විසින් ඒ සඳහා අවශ්‍ය හැලිවලං සහ අනෙකුත් උපකරණ ද සපයා දිය යුතු විය.
26. ඇඳගම. මාලිනී - ශ්‍රී ලංකාවේ ගම් සභා ක්‍රමයේ ඉතිහාසය (1997 දිවුලපිටිය) 6 පරිච්ඡේදය. 78-110 පිටු.

මේ කරුණු නිසා යුද බියෙන් තොර වුණු රටක, රාජ්‍ය නායකයාට, ආර්ථික ප්‍රවර්ධනයට, ජාතික සංවර්ධනයට, දිළිඳුකම තුරන් කිරීමට 21 වැනි සියවසට ගැළපෙන බුද්ධියෙන් හා සදාචාරයෙන් පිරුණු සමාජයක් ඇති කිරීමට, බාල පරපුරට ඥානාර්ථික අධ්‍යාපනයක් ලබාදීමට, නව සංස්කෘතික වපසරියක් ඇති කිරීමට, ප්‍රබල අවශ්‍යතාවක් ඇත. මේ සියල්ලම ජය ගන්නට නම් රාජ්‍ය යාන්ත්‍රණය සමග කලාකරුවා හා ලේඛකයා ද ඇත්වැල් බැඳ ගත යුතුය. ඒ ගමනේ දී පරණ යටත් විජිත චින්තනයෙන් මිදී අප සියලු දෙනාටම ප්‍රගාමී පිම්මක් පනින්නට අවශ්‍ය වන චෛතසික විපර්යකාරක වීමට කලාකරුවාට හා ලේඛකයාට බරපතළ සමාජ වගකීමක් තිබෙන බව සිතට ගැනීම අවශ්‍යයි.

මෙය ප්‍රාදේශික, තාවකාලික, පුද්ගලික අවශ්‍යතාවක් නොව ජාතික, ස්ථාවර, පොදු වුවමනාවකි. මේ අලුත් මාර්ගය රට පුරා සිටින බාල, මහලු, තරුණ සාහිත්‍යය කලාකරුවන්ට යා යුතු සංදේශය යි. මෙය අමතක නො කොට ඉටු කළ යුතු ජාතික ප්‍රබෝධයකට දොරවල් විවෘත කිරීමකි.

2010 වසරේ ජනවාරියේ සිට මාස් පතා පළාත් වශයෙන් ඒ ඒ පළාත්වල, කලාකරුවන්ගේ හා සිහිත්‍යකරුවන්ගේ අනුග්‍රහයෙන් පවත්වන සාහිත්‍ය කලා උළෙලවල පරිසමාප්තිය කොළඹ ජාතික මහෝත්සවයෙන් නිමා කරණට හැකිදැයි සොයා බලන ලෙස මම අමාත්‍යවරුන්ගෙන්, ලේකම්ගෙන්, කලා මණ්ඩලයෙන් හා සාහිත්‍ය අනුමණ්ඩලයෙන් ඉල්ලමින් නවතිමි.

- 2009.09.14 වැනි දින ජනාධිපති කාර්යාලයේ
පැවැත්වුණු සාහිත්‍ය ත්‍යාග ප්‍රදනෝත්සවයේ
"සාහිත්‍ය රත්න" සම්මාන ලැබූ අවස්ථාවේ
කළ දේශනය ඇසුරිනි. -

ගෙන යාමට හා ලොව බලගතු රාජ්‍යයක් බවට පත් වන්නට උත්තේජක ලැබුණේ මේ සාහිත්‍යයෙනි. හරුකි මුරකමි, කසුධ ඉෂි ගුරො, යො කො මෙගාවා වැනි අලුත් ලේඛකයෝ පශ්චාද් යුද්ධ සමයෙහි ඉපිද දෙවැනි ලෝක යුද්ධයෙන් ජපානය විනාශ වුණු ආකාරය පෙන්වන්නේ ඒ විනාශයෙන් මතු වන්නට ජපානය ගත යුතු මග හසර අපට හඳුන්වා දෙමිනි.

මේ පසුතලය මත අලුත් ලංකාවේ, අලුත් සාහිත්‍යයක් ඇති කිරීමේ බරපතළ වගකීම ලේඛකයන්ට හා කලාකරුවාට පැවැරී තිබේ. සියල්ලටම කලින් අපේ රටේ පාසැල් පද්ධතියේත්, උසස් අධ්‍යාපන ආයතනවලත් උගන්වන යල් පැන ගිය සාහිත්‍ය විචාර වාද ඒවායෙන් අතු ගා දැමිය යුතුය. සාහිත්‍ය කලා පහළ වන්නේ රටක ජනතාව අතරෙනි. ජනතා ව්‍යාපාර හා සමාජය අතරිනි. ටී.එස්. එලියට් ලෝක සංග්‍රාමය නිසා මේ ධරණීතලය අළු ගොඩක් බවට පත්වුණු බව "මුඩුබිම" කාව්‍යයෙහි පෙන්වා දුන්නේය. එලියට් ජනතාවට අලුත් මගක් පෙන්වා දුන්නේය. මෙවැනි අවස්ථාවකට මුහුණ දෙන රටක වාසය කරන ලේඛකයා කළ යුත්තේ අවස්ථාවෙන් ප්‍රයෝජන ගෙන ආත්මාර්ථකාමී ධනවතුන් වීමට ගීත ලියා පාලම් හද ව්‍යාජ වර්ණනා කිරීම නොවේ. ස්ථාවර පරමාදර්ශී මාර්ගයක් සොයා ගත යුතුය.

මෙවැනි තත්වයන් මීට පෙර ලංකාවේ ඇති විණි. සමහර විටක අපි නියම මඟ සොයා ගත්තෙමු. විටක මග අතර මං විය. රට පුරා රේන්දය වෙන්දේසියෙන් ගෙන අරක්කුවලින් රට නැවූ යුගයක තැබෑරුම්වල මත්පැන් අලෙවි කළ යුගයක "නොබොන සමාගම්" ව්‍යාපාරය, කොග්ගල, බණ්ඩාරවත්තේ පී.ඒ. සිල්වා ආරම්භ කළ අවස්ථාවෙහි රට පුරා කවියෝ එම සටනට උපකාර කළහ. එය දශකයක් පමණ බලයෙහි පැවැතුණ ද, 1912 අමද්‍යප පණිත සමඟ මතු වුණු ව්‍යාජ අමද්‍යප ව්‍යාපාරය නිසා යටපත් වී යාම හොඳ නිදසුනකි. අනිත් අවස්ථාව ලෙස මා දක්වන්නේ 1945 මැයි මාසයෙහි සංග්‍රාමය නතර වීමත් සමග ලංකාව සාමාන්‍ය තත්වයට ගෙන ඒමට බ්‍රිතාන්‍ය රජය හා පාලකයින් හඳුන්වා දුන් නවීන මාර්ගය යි.

හඬ මෙන්ම සාහිත්‍යයික වීරයා ද වූයේය. කථාන්තර කීමෙහි ඔහු ලත් ප්‍රාගල්භ්‍යය ඉහළම ඇගැයුමට ලක් විය. කලක් ඔහු දේශපාලනික වශයෙන් මාක්ස්වාදී අදහස් ගරු කරන්නෙක් ද වූයේය. දවමු හිටි නම් දේශපාලනයෙහි නිරත වුණු පවුලක උපන් ඔහු හද වඩා ගත්තේ සේවකයෝය. තෝකියෝ විශ්වවිද්‍යාලයට ඇතුල් වී ඔහු ප්‍රංශ සාහිත්‍යය හැදෑරුවේය. 1930 වන විට ඔහුට මාක්ස්වාදයත් දේශපාලනයට තිබුණු කැප වීමත්, සමාජ ආයතන කෙරෙහිත් අවිශ්වාසයත් උපන්නේය.

1930 සිට 1937 අතර කාලය තුළ ඔහු තුන් වරක් සියදිවි නසා ගන්නට තැත් කළේය. ඔසමු දසයි මෙහිදී මා නිදසුන් කර ගන්නේ ඔහුගේ ජීවිතය අනුකරණය කළ යුතු යයි කීමට නොවන බව තරයේ කියා සිටිමි. සමහර මුග්ධයෝ මෙවැනි වචනවල උඩු පිට පමණක් බලා මැසිවිලි නගති. දසයි ශයෝ (බැස යන හිරු) ලියන්නේ 1947 දී ය. එය පශ්චාත් සංග්‍රාම සාහිත්‍යයක ඇති ලක්ෂණ හඳුන්වයි. ඒ සමය ජපාන ජීවිතය හා ජපාන සමාජය අති මහත් පරිවර්තනයකට ලක් වූ අවධියක් විය. ඇමෙරිකානු හමුදාවලට හා මිත්‍ර හමුදාවලට යටත් වුණු ජපානයට එම පරාජය දරිය නොහැකි විය. බැස යන හිරු නවකතාව කියන්නේ මේ පසුතලයෙහි සුළු රදලවාදී පවුලක් බිඳ වැටෙන අන්දමයි.

මත්පැනට ඇබ්බැහි වීම, නිදි බෙත් ගැනීම, මුහුදට පැන සියදිවි නසා ගන්නට තැත් කිරීම වැනි නරුම වැඩ ඔහු ගේ පුද්ගල ජීවිතය පුරා පැතිර යයි. එසේ වුවත් අප දසයි මෙහිලා ඉදිරිපත් කරන්නේ ආදර්ශයට ගන්නට නොවන බව තරයේ කියා සිටිය යුතුව ඇත. ඔහු විස්තර කරන අවුලින් බර වුණු ජීවිතය, මත්ද්‍රව්‍ය ලෝලිත්වය, මත්පැන් පානය, පෙම් සබඳතා, විශාදය, අපේක්ෂා භංගත්වය හා විප්ලවකාරී ප්‍රචණ්ඩත්වයට ළං වීම යන සියල්ලම යුද්ධය විසින් ජපානයේ මෝදුවන පරම්පරාවට දුන් බියකරු දායාදයි. කතුවරයා විග්‍රහ කරන්නේ මේ කුරුරි රටාව නිර්මාණය කළ යුද්ධය ගැනයි.

ජපානයට, ජපාන වැසියන්ට තම දේශය නවීකෘත ලොවකට

ඇමරිකාවට ගමනක්" හදවත කම්පා කරවන සුළුය. යුද්ධය නිසා පවුල් කැඩී බිඳී විසිරී යන ආකාරය මෙහි චිත්‍රිතයි.

ඇඩොල්ෆ් හිට්ලර් වැනි දුර්දාන්ත පාලකයෙකු කළ ජනතා ඝාතන ව්‍යාපාරය, වධකාගාර හා ඝාතන කඳවුරු ගැන ලියැවුණු හා නිර්මිත කලා කෘතිවල ඇති සියල්ල සත්‍යයයි. එහෙත් කලාකරුවා කරන්නේ ඇරිස්ටෝටල් වර්ෂ දෙදහස් පන්සියයකට පමණ පෙර කී ආකාරයට ඉතිහාසය කියන සත්‍යය හා කලාකරුවා දකින සාර්වීය සත්‍යය අතර වෙනසක් ඇති බව කීමය. කලාකරුවා දකින්නේ සාර්වීය සත්‍යය බව මහාචාර්ය ඒ.වී. සුරවීර ද සඳහන් කර ඇත්තේ මේ සත්‍යය යි. චිත්‍රපටි කරුවන්, නවකතා කරුවන්, කවියන් විසින් මෙවැනි ඝාතන පසුබිම් කර ගෙන කළ ශ්‍රේෂ්ඨ නිර්මාණ සාහිත්‍යයේ තිබේ. රවීන්ද්‍ර විජයවර්ධන කැබලි හා අවුල්විට්ස් ප්‍රේමය හා නවකතා දෙකම පරිවර්තනය කර ඇත්තේ මේ සාහිත්‍යයෙනි.

ඇමෙරිකානු ඉතිහාසය යම්තම් ශතවර්ෂ දෙකකට නොවැඩි වුවත්, අද ප්‍රධාන ලෝක බලවතකු වී ඇත්තේ මේ යුද පසුබිම හා සම්බන්ධ කර ගෙන විස්තාරිත ළමා හා වැඩිහිටි නිර්මාණ සාහිත්‍යය ආශ්‍රයෙනි. දරුවා ගේ මනසට මානවයා ගේ උත්තරීතර භාවය හා ජාතියේ අද්විතීයභාවයත් ඇමෙරිකානු ජන හදවතට කැවිවේ ඒ නව සාහිත්‍යය සම්බන්ධ කර ගෙනයි. මේ එක ද පොතකවත් හෝ "සිවිල් යුද්ධය" වැනි පද භාවිතය පවා තහනම් වචන විය. මේ පොත්වල රචනා ක්‍රමය වැඩිහිටියන් කියන විට ළමයින්ට අසා ගෙන සිටින ආකාරයට ද රචිතය. මේ සාහිත්‍යයේ මූලික අදහස ළමයාට තමා උපන් රට, ගම, ජාතිය, හා තම නායකයින් ගැන දැනීම ඇති කිරීමයි.

දෙවැනි ලෝක සංග්‍රාමය නිසා බලවත් ව්‍යසනවලට ලක් වුණු රටකි, ආසියාවේ ජපානය. යුද්ධය පරාජය වීම, අපේක්ෂා නැතිව යාම හා පරාජයත් සමග ජීවත් වන්නට සිදු වීම රට තුළ තිබුණු ගැටලු වේ. ඔසමු දසයි (1909-1948) මෙවැනි පශ්චාත් සංග්‍රාම සාහිත්‍යයක් බිහි කිරීමට මුල් වූ රචකයෙකි. දෙවැනි ලෝක යුද්ධය අවසානය වන විට ඔසමු දසයි ඔහු අයත් පරම්පරාවේ සාහිත්‍යයික

පිළිබඳ කරුණු කෙරෙහි මුල් අවධානය යොමු කළද;s පසුව එය ජීවිතයට මුහුණදීමට හා නිදහස සොයා යාමට යන මාර්ගයක් බවට පත් විය. සිවිල් යුද්ධය ගැන ලියැවුණු රසවත් ළමා සාහිත්‍යයක් බිහි වීම නිසා ඇමෙරිකානු ජනතාව අදත් තම රට හා ජාතිය කෙරෙහි මහත් ඇල්මක් ප්‍රදර්ශනය කරති. මේ කෘතිවල විස්තර කරන්නේ දේශපාලනික ගැටලු නොව මානව දයාව හා මානව ගැටලුය. පැට්‍රීෂියා බීටි ගේ කෘතියෙහි තම අයියා මිය යාමෙන් කම්පනයට පත් වුණු චාලි බෙර වාදකයෙකු ලෙස එක්සත් හමුදාවට බැඳීමත්, යුද්ධයේ භයංකර පක්ෂයට මුහුණ දෙන විට, පැන යාමත් කියවෙයි. හමුදාවල සේවය කළ සහෝදරයන් පමණක් නොව පියවරුන් මිය යාම ද ළමා සිත් කම්පනය කරන ආකාරය මේ නව ළමා සාහිත්‍යයේ විස්තර වේ.

අවාසනාවකට මෙන් විසිවැනි ශතවර්ෂයේ ලෝක ඉතිහාස කථාවේ වැඩි කොටස වෙන් වී ඇත්තේ යුද්ධ පිළිබඳ කථාවලටයි. යුද්ධවල ඇති දුෂ්ඨ, භයංකර භාවය තරුණ පරපුරට ප්‍රදර්ශනය කළේ සාහිත්‍යයයි. මිනිසා තවත් මිනිසකුට සලකන අමනුස්ස භාවය වැඩිපුර විස්තර වූයේ මෙහිදී වුවත් පුද්ගලිකව මානවයා දන්වන අනුකම්පාවත් අපරිමිත ධෛර්යයත් සාහිත්‍යයෙන් ප්‍රතිබිම්බනය විය. ලෝක යුද්ධය පසුබිම් කර ගත් සාහිත්‍ය කෘති රාශියක් රචනා වූයේ දෙවැනි ලෝක සංග්‍රාම අවධිය පසුබිම් කර ගෙනය. එයිනුත් බොහොමයක් හිට්ලර් ජර්මනියේ කළ සමූල ඝාතන ව්‍යාපාරය පසුබිම් කර ගෙනය. මෙහි දී ළමා මනසට බල පෑම කළ හැකි වන පරිදි චිත්‍ර සහිත කථාන්තර පොත් ලියැවිණි. දෙවැනි ලෝක යුද්ධය ආසියාවේ ජපානයට බලපෑම කියන තොෂි මරුකිගේ හිරෝෂිමා නො පිකා හා තත්සුහරු කොදමාගේ මින්ගේ ට්‍රයිසිකලය යන කෘතීවල පරමාණු බෝම්බය ජපානයට කළ විනාසය ගැන ළමා මනසෙහි කම්පාවක් ඇති කළ කෘතියි.

නට්සීන් ගෙන් සැඟ වී ජීවිතය බොහෝ කල් ගත කළ වැඩිහිටියන් ගේ කතා ද මේ ළමා සාහිත්‍යයට මෙන්ම වැඩිහිටි සාහිත්‍යයට ඇතුළත් වී තිබේ. කවර ගැටලුවක් ආවත්, පවුල් එකමුතුකම රැක ගත් අන්දම කියැවෙන සෝනියා ලෙවිට්න් ගේ "

ලෝක සංග්‍රාම, 1950 ගණන්වලින් පටන් ගන්නා කොරියානු, වියට්නාම් යුද්ධත් සමග දේශීය සාහිත්‍යයේ නව සම්ප්‍රදායන් හා අලුත් රීති පහළ විණි. බලය පිළිබඳ සිහින ලෝකයේ සැරිසරමින්, කම්කරුවන් ඇතුළු නිර්ධන පන්තිය මුළා කළ කුජීත විචාරක ප්‍රතිරූපකයෙකු මා ධනවාදී රටවල් තෝරා ගත්තේ ඇයි දැයි ප්‍රශ්න කරනු ඇත. අද අපි ලෝකය බවටත්, ලෝකය අප බවටත් පත්ව සිටින්නෙමු. යටත් විජිත ඇමෙරිකාව, නූතන ඇමෙරිකාවට පත් වන අතරත මෙවැනි අලුත් මාර්ග ගන්නට සාහිත්‍ය කරුවන්ට සිදු විය. යටත් විජිතයට වාසනාව සොයා ගිය පිරිස ගේ ගමන ළමා පරපුරට බලපාන ආකාරය ගැන රචනා වුණු ළමා සාහිත්‍යයකින් මේ ගමන ආරම්භ වූ බව පෙනේ. පිලිප් රජුගේ යුද්ධය නම් දේශීය ඇමෙරිකානු නැගී ඒමක් 1675 දී මැසචුසෙට්හි සිදු විය. පෝල් සැමුවෙල් ජේකබ් රචනා කළ "ජේම්ස් ප්‍රින්ටර් : කැරැල්ලේ නවකතාවක්" විස්තර කරන්නේ යුද්ධයේ බියකරු කතුය. සුදු ඇමෙරිකානු පවුලක් ළඟ හැදුණු වැඩුණු ස්වදේශික ඇමෙරිකානුවකු වූ ප්‍රින්ටර්, ඒ පවුලේ මුද්‍රණාලයේ අත් වැඩ කාරයෙක් වෙයි. කථාව කියන්නේ ග්‍රීන් නමැති ඒ පවුලේ ළමයාය. කථාව මැදින් දිව යන්නේ යුද්ධයේ බිහිසුණු භාවය මැද කෙනෙකු තම ශිල්පයට හා තම ජනතාවට දක්වන ආදරය යන දෙකෙහි කළ යුතු තෝරා ගැනීම විස්තර කිරීමයි.

ඉන් වසර හතකට පමණ පසුව ලියැවුණු පෝල් ෆ්ලීෂ්මන් ගේ 'සැටර්නේලියා' හි කියැවෙන්නේ මැසචුසෙට්ස් හමුද ප්‍රහාරයකට මැදි වූ දහහතර හැවිරිදි දරුවකු ගේ අත්දැකීම් ය. අමෙරිකානු විප්ලවය සමඟ නව ළමා සාහිත්‍යයක් බිහි වීමට මඟ පැදිණි. එස්තර් ෆෝර්බ්ස් ලියූ ජොනී ට්‍රෙමේන් නවකථාවේ යුද්ධය සමඟ මිනිසා ඇති කර ගත යුතු ආත්ම ශක්තිය කියා පාන්නකි. "මගේ සොහොවුරා - සදම් මිය ගියේය." සටන් අවධියක අහිංසකයා මත වැටෙන අසාධාරණ කමේ බලගතුකම කියයි. තම බාල සහෝදරයා කථකයා ලෙස පෙනී සිටින මෙහි බලය හා අවනීතිය සාමාන්‍ය මිනිසා මර්දනය කරන ආකාරය කියා පායි.

දහනවවැනි ශතකයේ ඇමෙරිකානු ඉතිහාසයේ වැදගත් කාරණය වූයේ සිවිල් යුද්ධයයි. ඊට කලින් ඇති වුණු වහල් භාවය

බ්‍රිතාන්‍ය විදේශ බල කඳවුරු යන මේ සියල්ලම එක් පක්ෂයක් ගෙන කළ ජාත්‍යන්තර යුද්ධයක් මැයි මාසයෙහි අවසන් විය. ඒ ජයග්‍රහණය අපරාජිත වන්නේත්, විශිෂ්ට වන්නේත් වශයෙන් තනි රජයකට, රාජ්‍ය නායකයෙකුට, ආරක්ෂක හමුදාවන්ට මුහුණ දෙන්නට සිදු වුණු බලවේග එකමුතුවක ප්‍රබලකම සලකා බලන විටය.

එවැනි පරිසරයකින් මතු වුණු බියෙන්, සැකයෙන් තොරව, මරණ බියෙන් තොරව, වාසයට උචිත දේශයක් හා පසුතලයක් පහළ වීමත් සමගම ලාංකික කලා සාහිත්‍යය ගමන් කළ යුතු මාර්ගය කුමක් විය යුතු දැයි විමසීම අති කාලෝචිතයි. මේ ගමන් මඟ කුමන ස්වරූපයක් ගත යුතුද? මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා පසුගිය මාස තුන හතර ඇතුළත භාවිත කළ පදයක් මෙහි දී විශේෂයෙන් අපට ඒ මාර්ගය ඉඟි කරති යි මම සිතමි. එම පදය "අලුත්" යනුයි. අලුත් රටක්, අලුත් නිදහසක් ගැන කිහිප වරක් ම කියැවිණි. විවිධ මාධ්‍යවලින් මේ විශේෂණ පදය භාවිත විණි.

අලුත් රටක්, අලුත් නිදහසක් හා අලුත් ශ්‍රී ලංකාවක් යන ස්ථානවල යෙදෙන අලුත් යන පදය මේ ජාතික හා කාලීන අවශ්‍යතාව පැහැදිලි කරයි. මේ අලුත් විශේෂණ පදය රටේ හැම ක්ෂේත්‍රයක් පුරාම විසිරී පැතිරී යා යුත්තකි. මේ රටේ උගතුන්ට, පරිපාලකයන්ට, විශ්වවිද්‍යාලවලට, පාසැල්වලට, පරිපාලනයට, සංස්කෘතියට, සමාජ ජීවිතයට, චර්යා ධර්මවලට මෙන්ම සාහිත්‍ය කලාවන්ටත් යුද්ධ සමයකින් පසුව නව චින්තාවලියක් හා ගමන් මාර්ගයක් එක් වියයුතුය.

මෙලෙස අප කියන්නේ අතිගරු ජනාධිපති උතුමාණන් සටනෙන් ලත් විජයග්‍රහණය ගැන ඇතිවන උද්දාමය නිසා යයි සාවද්‍ය ලෙස නිගමනයකට නො ආ යුතුය. කලින් කළ මෙවැනි සමාජීය පරිවර්තනවලට පසුව ඒ හැම රටකම සාහිත්‍යයේත්, කලා ක්ෂේත්‍රයේත් තදනුබද්ධ අන්‍ය සකලවිධ ක්ෂේත්‍රයන්හිත් ඇති වුණු ගැටලු නිරාකරණය වූයේ එවැනි නව ගමන් මාර්ගයකට අවතීර්ණ වීමෙනි. අපද ඒ ගැන සිතා බැලිය යුතු කාලය එළඹ ඇත.

ඇමෙරිකාව වැනි රටක, සිවිල් යුද්ධය, පළමුවැනි හා දෙවැනි

# දැන් පශ්චාද් යුද්ධ සාහිත්‍යයක් බිහි වියයුතුයි.

මහාචාර්ය තිස්ස කාරියවසම්

1975 යාපනයේ නගරාධිපති ඇල්ෆ්‍රඩ් දුරෙයිඅප්පා ඝාතනයත් සමග අපේ රට අන්ධකාර, බියකරු ආභ්‍යන්තරික සටන් ප්‍රවාහයකට ප්‍රවිෂ්ට විය. එය ආභ්‍යන්තරික යයි විශේෂණ වත් කළ හැක්කේ භෞතික වශයෙන් ගත හොත් පමණි. දීපවංසය, මහාවංසය යන මුල් වංශකථාවල අපගේ රට ආක්‍රමණය කළ විදේශික සටන්කාමීන් ගැනත්, කොටස් වශයෙන් හෝ මුළුමනින් ම රට අල්ලා ගැනීම ගැනත් විස්තර ප්‍රකාශිතයි. ක්‍රි.ව. 1017 චෝළයන්ට යටත් වීමේ සටනත්, 1815 දී බ්‍රිතාන්‍යයන්ට මුළු ලංකාවම යටත් වීමේ තත්ත්වයක් මෙහි ලා සැලකිය හැකියි. 1017 දී රට මුළුමනින් ම සොළීන් අතට ද 1815 දී බ්‍රිතාන්‍යයන් අතටත් පත් විය.

2009 මැයි මාසය වන තුරු ලංකා ධරණී තලය මත ත්‍රස්තවාදයෙන් රට මුදා ගැනීමට කළ සටන මේ සියලුම සටන්වලට වඩා වෙනස් ස්වරූපයක යුද්ධයක් විය. එය තනි රාජ්‍ය නායකයෙකුට, සේනාධිනායක වරයෙකුට තම නායකත්වය දීමට සිදු වුණු අන්තර්ජාතික යුද්ධයක් වීම විශේෂත්වයකි. මෙය අභ්‍යන්තර ත්‍රස්තවාදී කල්ලියක් මහජන වරමින් බලයට පත් රාජ්‍යයකට විරුද්ධව කළ සටනකින් සීමාසහිත අර්ථකථනයක් දීම මුළු ඉතිහාස කථාවම සීමාසහිත අර්ථ කථනයක් දීම මුළු ඉතිහාස කථාවම අවතක්සේරු කිරීමක් හා සාවද්‍ය අර්ථ නිරූපණයකට ද ඉඩ සලස්වන්නකි.

රට ඇතුලත ජන මාධ්‍ය ආයතන, රාජ්‍ය විබද්ධ සංවිධාන, ප්‍රතිගාමී ජාතික බලාවේග, ආසියාතු, යුරෝපීය, ඇමෙරිකානු හා

24. මහාවංසය. 10 පරි. 4, 5 ගාථා.
25. - එම - 10 පරි. 104-105 ගාථා.
26. - එම - 71 පරි. 3, 4, 5 ගාථා
27. මලියදේව රහතන් වහන්සේ වැඩවිසූ මණ්ඩලාරාම මහා විහාරය - මහාචාර්ය එම්.ඩබ්. විමල් විජේරත්න.
28. මහාවංසය - සංඥාපනය ix පිටුව - සවිස්තර මහාවංශ අනුවාදය - මහාචාර්ය මංගල ඉලංගසිංහ. 46 පිට.
29. E.Z. Vol 4. P.1.
30. මහාවංසය. 70 පරි. 333-336 ගාථා.
31. E.Z. Vol I. Pp.50-56, 273

# සටහන්

1. මලියදේව රහතන්වහන්සේ වැඩවිසූ මණ්ඩලාරාම මහා විහාරය - මහාචාර්ය එම්.ඩබ්. විමල් විජේරත්න. 22 පිට
2. Epigraphia Zeylanica. Vol. 4 P.1
3. මහාවංසය. හික්කඩුවේ සුමංගල නාහිමි හා බටුවන්තුඩාව - පරිවර්තනය. 70 පරි. 320 - 327 ගාථා.
4. - එම - 70 පරි. 333 - 336 ගාථා.
5. පොළොන්නරු යුගය - ආචාර්ය විමල් වරණ ලෝ. 27 පිට.
6. මහාවංසය - 62 පරි. 40-41 ගාථා.
7. මහාවංසය - 68 පරි. 6 ගාථාව.
8. පොළොන්නරු යුගය - "I පරාක්‍රමබාහු රාජ්‍ය සමයට පසුබිම" මහාචාර්ය ඒ.එල්. බැෂම්. 23 පිට.
9. මහාවංසය. 61 පරි. 54-55 ගාථා.
10. - එම - 70 පරි. 106 ගාථා.
11. - එම - 70 පරි. 333-336 ගාථා.
12. - එම - 70 පරි. 336 ගාථාව.
13. - එම - 71 පරි. 4-5 ගාථා.
14. මහාවංසය.
15. Arthasastra - R. Shamasastry. tv. VI 2.
16. E.Z. Vol IV P.6.
17. මනෝරථපූරණීනාම අඞ්ගුත්තර නිකායට්ඨ කථා - 22, 23 පිටු
18. ධම්ම පදට්ඨකතා - දුතියො භාගො - 600-601 පිටු.
19. "රුහුණු රටේ මායිම" මහාචාර්ය සිරිමල් රණවැල්ල - ශ්‍රී සෝරත අනුස්මරණ ශාස්ත්‍රීය දේශනය. 1981. 5 පිට.
20. මහාවංසය. 23 පරි. 8 ගාථාව.
21. පපඤ්චසූදනීනාම මජ්ඣිම නිකායට්ඨ කථා. හතරවන කොටස. 218, 219 පිටු.
22. මනොරථපූරණීනාව අඞ්ගුත්තර නිකායට්ඨකථා - 22, 23 පිටු.
23. සම්මෝහවිනෝදනී නාම විනයගට්ඨ කථා .316 පිට.

ආචාරධර්මවලින් හික්මුණෝ වූහ. චිරකාල පූජිත මෙබඳු ආගමික පසුබිමකින් යුත් "දශරාජධර්මය"[31] එකල පාලකයෝ බොහෝ දුරට අනුගමනය කළහ. "අනුන් ගේ යහපත ම ධනය කොට ඇති" යන ශිලා ලිපියේ ඇති යෙදුම ද දශ රාජධර්මයට අදාළ වන්නා වූ නියමයකි. එදා රජ රට වැසියා ගේ සේවකයෙකි. ඔහු රට වැසියා වෙනුවෙන් රජකම් කරමින් ඔවුන් ගේ අවශ්‍යතාවන් ඉටු කළේ ය. "මහා සම්මත" සම්ප්‍රදය ද ගොඩනැගුණේ ඒ සංකල්පය මත ය.

"අප දෙදෙනා ගේ මේ ලියවිල්ල (ගිවිසුම) සඳහිරු පවත්නා තුරු" යන යෙදුම ද අප ආදිම යුගවල සිටි ජනතාව අතර තිබූ සංකල්පයකි. බොහෝ ස්ථාවර බව පෙන්වීමට මෙම වගන්තිය ආමද්‍ශ කර ඇත. පැරණි යුගවල නොයෙකුත් දීමනා සඳහා කරවා ඇති ශිලා ලේඛනවල ද මෙම වගන්තිය යොදා ඇති බව දක්නට ඇත.

මෙම ගිවිසුමේ ඇති වගන්ති අරුත් ගැන්වෙන ආකාරය සලකා-බලන විට ඒ යුගයේ මෙතරම් දැනුම් සම්භාරයක් තිබූ රාජ්‍ය තාන්ත්‍රිකයින් අප රටේ සිටි බව අසන්නට ලැබීම ද ඉමහත් ආස්වාදයක් ගෙන-දෙන්නකි. මෙම ගිවිසුම සටහන් කොට දැනට සියවස් නවයක් පමණ ඉක්ම ගොස් ඇත. මෙපමණ පැරණි ලිඛිත සාම ගිවිසුමක් ලෝකයේ කිසි ම රටක ආරක්ෂා වී ඇතැ යි සිතිය නොහැකි ය.

(කුරුණෑගල - දඹුල්ල මහා මාර්ගයේ ගොකරැල්ල නගරයේ සිට කිලෝමීටරයක් පමණ ඉදිරියට ගොස් 13 කණුව අසළ දෙළොස්දුහේ හන්දියෙන් දකුණට හැරී මැද්දකුටිය මාර්ගයේ කිලෝමීටර් දෙකක් පමණ දුර ගිය තැන සංගමු රජමහා විහාරස්ථානය හමුවේ.)

ගැන විමසීම මැනව යි සිතමි. "අප දෙදෙනා ගෙන් පළමුව මැරණකු ගේ (රාජ්‍යය) නොමැරී ජීවත් වන්නාට අයිති ය." මේ වන විට වියපත් ව සිටි ගජබාහු හා තරුණවියේ සිටි පරාක්‍රමබාහු අතර මෙබඳු තීරණයක් වීම සැබැවින් ම පරාක්‍රමබාහුට වාසි සහගත වන කරුණකි. මහාවංසය කියන පරිදි පරාක්‍රමබාහු ඒ වන විට නැවතී සිටින ගිරිතලාවට පැමිණෙන භික්ෂූන් වහන්සේලා "ගජබාහු දරුවකු සහෝදරයකු නැති අයකු මෙන් ම වයස්ගත අයකු බැවින් ඔහු ගේ මරණින් පසු පරාක්‍රමබාහුට එම රාජ්‍යය නිරායාසයෙන් ම අයත් වන බව"[30] කියූ අයුරු සැලැකිල්ලට ගන්නා විට මෙම වගන්තිය ගිවිසුමට ඇතුළු කරන්නට ඇත්තේ එම තත්ත්වය ම අවධාරණය කරගෙන ම විය යුතු ය. (සැබැවින් ම සිදුවූයේ ද එය යි. ගජබාහු ගිවිසුම පිහිටුවා සුළු කලකින් මියගිය අතර රජරට පරාක්‍රමබාහුට අයත් විය. මේ වන විට රෝහණ ප්‍රදේශයේත් මලය ප්‍රදේශයේත් රජය පැහැර-ගැනීම සඳහා අවුල් වියවුල් ඇති කළ ප්‍රධානීන් සිටි බැවින් මෙම වගන්තිය ගිවිසුමට ඇතුළත් කිරීම රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් බොහෝ වටිනාකමකින් යුක්ත වන්නට ඇත. ගජබාහු වියපත් ව සිටීම මෙන් ම ඔහු ඒ වන විට දළදුව හිමි කරගෙන සිටි නාමමාත්‍රික ව හෝ මුළු රටේ ම රජු ලෙසින් පෙනී-සිටි නිසා ඔහු ගේ උරුමය ලබාගැනීම පරාක්‍රමබාහු රජුට බොහෝ සේ වැදගත් වන්නට ඇත.

"අප දෙදෙනා ගෙන් එක් කෙනකුට සතුරු රජ කෙනෙක් ඇත්නම් ඔවුහු අප දෙදෙනාට ම සතුරු යැ යි" යන වගන්තිය ද එකල රටේ පැවති තත්ත්වය සැලකිල්ලට ගන්නා විට බොහෝ සෙයින් වැදගත් වෙයි. මෑත යුගයේ රටවල් සමූහ වශයෙන් එක් ව ගිවිසගත් "වෝර්සෝ" හා "නැටෝ" වැනි ජාත්‍යන්තර මට්ටමේ බොහෝ සෙයින් බලගතු වූ ගිවිසුම්වල ද මුඛ්‍ය පරමාර්ථය වූයේ මෙම වගන්තියෙන් කියැවෙන එම මූලික සිද්ධාන්තය තහවුරු කරගැනීම ය. "මෙයට විරෝධයක් (විරුද්ධ යමක්) අප කළොත් තුනුරුවන් ගේ අඬුව කඩ කළෝ (ඉක්මවූවෝ) වෙමු. අපායෙන් ද නොවිසඳුණෝ වෙමු." එකල රාජ්‍ය තන්ත්‍රය මෙහෙයවීමට ආගමික සම්ප්‍රදයන් කොතෙක් දුරට බලපෑවේ ද යන්න මෙයින් පැහැදිලි වේ. රාජ්‍ය පාලකයෝ කෙතරම් බලවත් වුවත් ඔවුන්ට ආගමික සංකල්පයන් ඉක්මවා යාමට ඉඩක් නො වී ය. ඔවුහු එම

පහළින් ඇති තරමක් විනාශ වී ගොස් ඇති සංස්කෘත ශ්ලෝකයේ අදහස.
"අනුන් ගේ යහපතම ධනය කොට ඇති අප දෙදෙන ගේ මේ ලියවිල්ල (ගිවිසුම) සඳහිරු පවත්නා තුරු ලොව (ලෝකයා) ආරක්ෂා කෙරේවා."

මෙම ගිවිසුමෙහි අන්තර්ගතයෙහි ඇතුළත් තීරණ නියමයන් ගැන සලකා-බලන විට එම ගිවිසුමට එළඹි පිරිස් අතර ඉහළ මට්ටමේ රාජ්‍ය තාන්ත්‍රික දැනුමක් තිබූ බව පෙනේ. ගිවිසුම යන්නට දැනට පිළිගෙන ඇති හොඳ ම නිර්වචනය ඉදිරිපත් කර ඇති ශ්‍රීමත් විලියම් ඇන්සන් ගේ නිගමනය වන්නේ "ගිවිසුමක් යනු නීතිගත සම්බන්ධතා ඇති කරගැනීමේ චේතනාවෙන් පුද්ගලයින් දෙදෙනකු හෝ ඊට වැඩි පිරිසක් අතර ඇතිවන සම්මුතිය යි. එම සම්මුතියකින් එක් පක්ෂයක් හෝ ඊට වැඩි ගණනක් අයිතිවාසිකම් අත් කරගන්නා අතර වෙනත් පක්ෂයක් යමක් කිරීමට හෝ යමක් දරා-සිටීමට හෝ යටත් වීමට පුළුවන."

මේ අනුව බලන විට ගජබාහු හා පරාක්‍රමබාහු අතර ඇතිකර ගත් එම ගිවිසුමේ ද මෙම විධිවිධාන ඇතුළත් වෙයි. මෙබඳු ඉහළ රාජ්‍ය තාන්ත්‍රික මට්ටමේ අදහස්වලින් යුතු ගිවිසුමක් විධිමත් පරිදි ඇති කරගැනීමට මෙයින් සියවස් නවයකට පමණ පෙර මෙරට විසූවන් තුළ ඒ පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් තිබූ බව එයින් අනාවරණය වෙයි. වර්තමානයේ "උඩරට නීතිය" නමින් හඳුන්වන "සිංහලේ නීතිය" ආරම්භයේ පටන් ස්වදේශිකයින්ට ආවේණික වූ නීති පද්ධතියකි. මෙම නීති පද්ධතිය සිරිත් විරිත් මත ම පදනම් වූ අතර ක්‍රමවත් ව ලිඛිත ව නොතිබූ නිසා පසුකාලයේ එය මැනවින් විද්‍යාමාන නොවූ බව ආචාර්ය හේලි ගේ මතය යි. කෙසේ වෙතත් එම "සිංහලේ නීතිය" තුළ ඉහළ ම රාජ්‍ය තාන්ත්‍රික මට්ටමේ සාම ගිවිසුමක් ඇති කර ගැනීමට තරම් ප්‍රාමාණික නීති රීති තිබූ බව ඒ අනුව ගම්‍ය වෙයි.

මෙම ශිලා ලිපියේ අන්තර්ගතයේ ඇති කරුණු කිහිපයක්

ඊළඟට මෙම ගිවිසුමේ අන්තර්ගතය ගැන සලකා-බලමු. 12 වන සියවසේ භාවිතා වූ අක්ෂර මාලාවෙන් මෙය සටහන් වී ඇත.

1. (සවස්ති) ශ්‍රී මහා සම්මත පරම්පරා-
2. (යෙන්) නො පිරිහී ආ සත්‍යධන වූ ගජ
3. බා (හුප) පරාක්‍රමබාහු දෙසුරුබඩු වම්-
4. හ. (අප කළ සන්ධානයට ජීවනාන්ත
5. දක්වා විග්‍රහයක් නොකරම්හ. ඔවු-
6. නොවුන් අයාමෙහි පළමුවැ කෙනෙකුන්
7. ගෙ ------------- පසු වූවත් අත්පත්
8. (වන්න) ---------- එක් කෙනෙකුන් ----
9. (වැ) මෙ ------ (රා) ජ්‍ය වී (ලුප්ත) වන නියායෙ-
10. න් ------ (අප) දෙදෙනා කෙරෙන්
11. එක් කෙනෙකු (න් හට) සතුරු වූ රජ දරු කෙ-
12. නෙක් ඇත්නම් දෙදෙනාටම සතුරහ. මෙ-
13. ට විරුඩයක් කළමො නම් තුනුරුවන් ආඥ
14. මැකුවම්හ. නරකයෙන් මුක්ත නොවූවම්හ.
15. ආචන්ද්‍රකාර මවකාප්ජගදක්ෂරාළි
16. රෙෂා පරාර්ථධනයොරනයොර නභ්‍යම්
17. ◡ ◡ - ◡ ----- ◡ ---- ◡ - ◡ ◡
18. සෙනභාර්ද්ද්‍රකා --- ◡ -- ◡ - ◡ ◡[29]

අනුවාදය :-

"යහපතක්ම වේවා! ශ්‍රීමත් මහා සම්මත පරම්පරාවෙන් නොසිඳී පැමිණි සත්‍යයම ධනය කොට ඇති (අපි) ගජබාහු පරාක්‍රමබාහු ඥාති සොයොහුරෝ (දෙමස්සිනො) වෙමු. අප කළ මේ පොරොන්දුව (අනුව) දිවි කෙළවර දක්වා අප දෙදෙන සටන් නොකරමු. අප දෙදෙනා ගෙන් පළමුව මැරුණකු ගේ (රාජ්‍යය) නොමැරී ජීවත් වන්නාට අයිතිය. ----- එක්කෙනෙක් ---- මේ රාජ්‍ය වැනසෙන අයුරින් ----- අප දෙදෙනා ගෙන් එක්කෙනෙකුට සතුර වූ රජ කෙනෙක් ඇත්නම් ඔවුහු අප දෙදෙනාටම සතුරුයි. මෙයට (ගිවිසුමට) විරෝධයක් (විරුද්ධයමක්) අප කළොත් තුණුරුවන් ගේ ආඥාව කඩකළෝ (ඉක්මවූවෝ) වෙමු. අපායෙන් ද නොමිදුණෝ වෙමු."

කෙතරම් බලවත් අයෙක් වී ද යත් පණ්ඩුකාභය රජු සමග සම අසුන්වල සිට ඔහු දෙවිමිනිස් නැටුම් නැරඹූ බවත්, ඔහු ගේ මරණින් පසු ඔහුට වැඳුම් පිදුම් කළ බවත් මහාවංශයෙහි සඳහන් වෙයි.[25] ඒ අනුව සලකා බලන විට මෙම ස්ථානය අනුරාධපුරයේ මුල් අවධියේ සිට ම දේශපාලනික වශයෙන් ද වැදගත් ස්ථානයක් ගත් බව පෙනේ.

මේ මහා විහාරස්ථානයේ ශේෂ වී ඇති ලක්ෂණත්, යථෝක්ත පුරාවෘත්තවල සඳහන් විස්තරත්, සලකා බලන විට මේ කල්ලක ග්‍රාමයේ මණ්ඩලාරාම විහාරය වර්තමාන සංගමු විහාරය ලෙස නිසැක ව ම හඳුනාගත හැකිය.

මෙම ගිවිසුම සහිත ශිලා ලිපිය මහජන ප්‍රදර්ශනයට භාජනය වන අයුරින් මෙම විහාර ස්ථානයේ වූ පිහිටි ගලක පිහිටුවා ඇත. පරණවිතානයන් අදහස් කරන පරිදි මෙහි මුල් පිටපත මැදිරිගිරියේ පිහිටුවූයේ නම් එය ද මහජන ප්‍රදර්ශනය සඳහා මැදිරිගිරිය වටදාගෙය පිහිටි ගල් පව්වෙහි පිහිටුවනු නොඅනුමාන ය. මන්ද මෙම ශිලාලිපියේ වූ කරුණු මහජනතාව දැනගත යුතු ම ඒවා බැවිණි. ගිවිසුමේ මුල් පිටපත සොයනා බොහෝ දෙනකු සිතන පරිදි ගල් කණුවක හෝ ගල් පුවරුවක එම ශිලා ලේඛනය සටහන් කර නොතබනු ඇත. එසේ ම මහාවංසය කියන පරිදි මෙම ශිලා ලේඛනය පාෂාණ පිට්ඨියක - ගල් පිටක (පිට්ඨී පාෂාණම්හි ලිඛාපිය) පිහිටුවනු ලැබී ය.[26] ඒ අනුව සංගමු විහාරයේ ගල්පිටක පිහිටුවා ඇති එම ශිලා ලේඛනය මහාවංසයේ සඳහන් වන මුල් පිටපත ම බව නිසැක ව කිව හැකි ය. එසේ ම මහාවංසයේ සඳහන් "මඩුලුගිරි විහාරය" මෙම සංගමු විහාරය බවට පෙර කියන ලද සාධකවලින් ම තහවුරු වේ. මෙම විහාරස්ථානය පිළිබඳ ව පර්යේෂණ කළ මහාචාර්ය එම්.ඩබ්. විමල් විජේරත්න මහතා මහාවංසයේ සඳහන් වන මෙම "මඩුලුගිරි විහාරය" සංගමු විහාරය ම බව සනාථ කර ඇත.[27] එසේ ම මෙම කාලපරිච්ඡේදයට අයත් විස්තර මහාවංසය ලියූ කතුවරයා පරාක්‍රමබාහු රජුට සමකාලීන වූවකු බව දැනට හඳුනාගෙන ඇති බැවින්[28] මහාවංසයේ ඇති විස්තරවල සඳහන් ස්ථාන පිළිබඳ ව කුකුසක් ඇතිකර ගැනීමට ද අවශ්‍යතාවක් නැත.

"සූකරජෝතිකා වත්ථුවේ" කල්ලක ගාමයෙහි[18] මණ්ඩලාරාම විහාරය පිළිබඳ වැදගත් තොරතුරු ඇතුළත් වෙයි. එහි එන විස්තර අනුව දුටුගැමුණු රජු ගේ "ලකුණ්ඨක අතිම්බර" නම් යෝධයා ගේ භාර්යාව වූ "සෝණා" බණ අසා සෝවාන් වූයේ මෙම විහාරස්ථානයේ දී ය. ඇය මියගොස් ඇත්තේ ද එහි දී ය. මෙම "අතිම්බර" යෝධයා එම විහාරස්ථානයේ ගල් ලෙනක් කටාරම් කොටවා භික්ෂූන් වහන්සේලාට පූජා කළ බවක් මෙම සංගමු විහාරයේ ඇති තවත් ශිලා ලේඛනයක සඳහන් වෙයි.[19] මේ "අතිම්බර" දුටුගැමුණු රජුගේ යෝධයන් අතර වූ විශ්ෂ්ඨතම සෙනෙවියකු වූ "ගෝඨයිම්බර" බව සැකහැර හඳුනාගත හැකිය. සද්ධාතිස්ස රජු විසින් (පූ:වෘ:වː 137-119) කරවන ලද විහාර අතර කල්ලක ලෙනෙහි ද විහාරයක් කරවූ බව සඳහන් ව ඇත.[20] මජ්ඣිම නිකායට්ඨ කථාවේ ද,[21] අංගුත්තරනිකායට්ඨ කථාවේ ද[22] කල්ලක ගාමයේ මණ්ඩලාරාම විහාරයේ වැඩපසු මහායතිවරයන් ගැන කියැවේ. වලගම්බා රජු දවස (පූ:ව්‍යෘ:ව 103-102 දෙවන වර පූ:ව්‍යෘ:වː 89-77) වූ බැමිණිටියා සාය කාලයේ කල්ලක ගාමයේ මණ්ඩලාරාම විහාරයේ ම භික්ෂූන් වහන්සේලා රැස් ව ධර්ම සංඝායනාවක් පැවැත්වූ බව සම්මෝහවිනෝදනී නම් විභගට්ඨ කථාවේ සඳහන් වී ඇත.[23] මේ අනුව අනුරාධපුර සමයේ සිට මෙම ස්ථානය රාජ්‍ය අනුග්‍රහය ලත් බොහෝ උගත් ශික්ෂාකාමී යතිවරයන්ට වාසභූමි වූ ස්ථානයක් බව පෙනේ.

මෙම විහාර ස්ථානය පිහිටි කල්ලක ග්‍රාමය "කාලවේල" නමින් ද හැඳින්වූ මූලාශ්‍රය දක්නට ලැබේ. පණ්ඩුකාභය ගේ කුමාර අවධියේ සිට ඔහු රැකබලාගෙන ඉන්දීය ආක්‍රමණිකයින්ට විරුද්ධ ව සටන් කිරීමට ඔහුට නොමඳ සහාය දක්වූ "කාලවේල" නැමැති ප්‍රදේශාධිපතියකු ගැන මහාවංසයේ සඳහන් වේ.[24] මහාවංසයේ ඔහු යකකු බවට පත්කර ඇතත් සැබැවින් ම ඔහු එකල ස්වදේශික ජනතාව ගේ ප්‍රධානියකු වන්නට ඇත. පණ්ඩුකාභය ළමා කාලයේ විසුවේත්, යුද සංවිධානය කළේත්, වර්තමාන කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් ප්‍රදේශවල බැවින් මෙම "කාලවේල" නමැති ප්‍රධානියා ද සිටින්නට ඇත්තේ ඊට ආසන්න ප්‍රදේශයක විය යුතු ය. මෙම "කාලවේල" යන්න "කල්ලක" නමින් ව්‍යවහාරයේ දී වෙනස් වූ " කාලවේල" නමැති ප්‍රධානියා ගේ ගම විය හැකි ය. මෙම "කාලවේල"

සොයා-බැලීම ඊළඟට වැදගත් වෙයි. මෙම මඩුලුගිරි විහාරය" පොළොන්නරුවේ වර්තමාන මැදිරිගිරි විහාරය යැ යි පිළිගත් මහාචාර්ය පරණවිතාන මහතා මෙම ගිවිසුම්ගත ශිලාලේඛනය මැදිරිගිරි විහාරයේ කිසියම් තැනක ඇතැ යි සලකා වර්තමාන සංගමු විහාරයේ ඇති ශිලාලේඛනය එම මුල් ගිවිසුමේ පිටපතකැ යි සඳහන් කළේ ය.[16]

මුල් පිටපත ගජබා රජු ගේ රාජ්‍යයට අයත් මැදිරිගිරි විහාරයේත් එහි දෙවන පිටපත එවකට පරාක්‍රමබාහුට අයත් වූ දක්ෂිණ ප්‍රදේශයට අයත් සංගමු විහාරයේත් පිහිටුවන්නට ඇතැ යි ඔහු අදහස් කළේ ය. "මේ සමගි ගිවිසුම ඇති කරන ලද්දේ සංඝයා වහන්සේ ගේ නියමයෙන් බැවින් සංගමු විහාරයේ හා මැදිරිගිරි විහාරයේ ප්‍රධාන හිමිවරුන් ඉදිරිපිට කොටවා එහි ම පිහිටුවීම ගිවිසුමේ ස්ථිරත්වයට හා හිතවත්කමට වඩා යෝග්‍ය ය යි සිතුවා විය හැකි ය" යි ඔහු වැඩි දුරටත් කියයි.

මැදිරිගිරි විහාරය ද "මණ්ඩලගිරි විහාරය" ලෙස හැඳින් වූ අවස්ථා පුරාවෘත්තවල දක්නට ඇත. එහෙත් මහාවංසයේ මෙම ශිලා ලේඛනය පිහිටවූ ස්ථානය ලෙස සඳහන් වන "මණ්ඩල ගිරි විහාරය" මැදිරිගිරි විහාරය" නොවන බවට බොහෝ සාධක වෙයි. පරාක්‍රමබාහු ගේ ජීවන කථාව සඳහා පරිච්ඡේද ගණනාවක් වෙන් කළ මහාවංස කතුවරයා මෙම ගිවිසුම ස්ථාන දෙකක පිහිටුවූයේ නම් එය ද නිසැක ව ම කියනු ඇත. ඒ අනුව සලකන විට වර්තමාන සංගමු විහාරයේ දක්නට ලැබෙන්නේ මහාවංසය කියන මුල් ම ශිලාලේඛනය බව පිළිගැනීමට සිදු වේ. එසේ නම් මෙම සංගමු විහාරය "මණ්ඩලගිරි විහාරය" ලෙස මහාවංස කතාකරු හැඳින්වූයේ ඇයි ද යන පැනයට පිළිතුරු සෙවිය යුතු ය. මලියදේව මහරහතන් වහන්සේ ප්‍රමුඛ ඒ ඒ යුගවල ප්‍රධාන භික්ෂූන් වහන්සේලා වැඩසිටි "මණ්ඩලාරාම විහාරයක්" ගැන බොහෝ ඓතිහාසික ලේඛනවල විස්තර එයි. "මනෝරථපූරණී යෙහි" මලියදේව මහරහතන් වහන්සේ "කල්ලක ගාමයේ මණ්ඩලාරාම විහාරයේ විසූ බවත් මෙම විහාරය අනුරාධපුර මහාවිහාරයට බෙහෙවින් සම්බන්ධ බවත් සඳහන් වෙයි.[17] ධම්මපදට්ඨකතාවේ ලංකාව පසුබිම් කරගත් එක ම කතා පුවත වන

මෙම සිද්ධීන් පෙළ ගැස්වීමේ දී ක්‍රමික බව සිදී-ගොස් ඇති බවක් පෙනෙන අතර, මෙම ගිවිසුම සහිත ශිලා ලේඛනය පිහිටුවන්නට ඇත්තේ භික්ෂූන්වහන්සේලා ගේ උපදෙස් මත දෙපක්ෂය යුද්ධය නැවැත්වීමෙන් අනතුරු ව බව කිව යුතු ය. ශිලාලේඛනයේ අන්තර්ගත කරුණු සලකා-බලන විට ද දෙපක්ෂය ඉදිරියේ එය සටහන් කරන ලද බව සිතාගත හැකි ය.

අප මේ සඳහන් කරන්නේ එම ශිලා ලේඛනගත ගිවිසුම පිළිබඳ ව ය. මෙම අවධියේ ම තවත් ගිවිසුම් දෙකක් ඇති කරගැනීම ගැන මහාවංසයේ තොරතුරු එයි.[14] මානාභරණ රජු හා ගජබා රජු අතර භික්ෂූන් වහන්සේලා ගේ මැදිහත්වීමෙන් ගිවිසුමක් ඇති කරගත් බවත් පසු ව මානාභරණ එම ගිවිසුම උල්ලංඝනය කොට පරාක්‍රමබාහු සමග තවත් ගිවිසුමක් අත්සන් කළ බවත් ඒ විස්තරවල කියැවෙයි. ඒ අනුව මේ අවධියේ යුද සංසිදීමේ ගිවිසුම් ඇති කරගැනීම සාමාන්‍ය කරුණක් බවට පත් ව තිබුණු බව පෙනේ.

"යුද සමයේ දී සතුරාට පසුකඩ සිටින රජු හා මිත්‍ර සන්ථවය කොට ඔහු ගේ ආධාර ලබාගත යුත්තේ ය" යන චිර කාල පූජිත ධර්මයක් වූ "මණ්ඩල සම්ප්‍රදය"[15] එකල රජවරුන් අනුගමනය කළ බව ඒ අනුව සිතාගත හැකි ය.

යථෝක්ත ගිවිසුම්වලට අදළ පාර්ශ්ව එකඟ වූ බව මහාවංසය කියන නමුත් ඒවා මණ්ඩලගිරි විහාරයේ කොටවන ලද ශිලාලේඛනය පරිදි ගල්වල කෙටුවා ද යි සඳහන් කරන්නේ නැත. එබඳු ලේඛනයක් මෙතෙක් හමු වී ද නැත. ගජබා රජු හා මානාභරණ රජු අතරත් පරාක්‍රමබාහු හා මානාභරණ රජු අතරත් ඇති වූ ගිවිසුම්වල කුමන කරුණු සඳහන් වී ද යන්නත් ඒවායේ කොන්දේසි කෙසේ වී ද යන්නත් දැන-ගැනීමට තරම් කරුණු ඒ නිසා ශේෂ වී නැත. එහෙත් මහාවංසයේ කියන ගජබා රජු හා පරාක්‍රමබාහු ඇති කරගත් "මණ්ඩලගිරිවිහාර ගිවිසුම" අද ද නොනැසී පවතී.

මහාවංසයේ සඳහන් වන මෙම ගිවිසුම සහිත ශිලාලේඛනය පිහිටවූ "මඩුලුගිරි විහාරය පිළිබඳ මතභේදයක් ඇති බැවින් ඒ ගැන

සම්ප්‍රදායානුකූල ව දළඳ හිමි නරපතියා මුළු රටේම රජ බවට පිළිගැනීමක් තිබූ නිසා ද ගජබා රජු ගේ ආධිපත්‍යය ජනතාව අතර නිරායාසයෙන් ම පවතින්නට ඇත.

දකුණු දේශය එක්සත් කළ පැරකුම්බා මලය දේශය ද තම අණසක යටතට ගත්තේ ය. ඊළඟට ඔහු බලකොටු විනාශකර තම ආධිපත්‍යය එම ප්‍රදේශවල පැවැත්වූ බව මහාවංසය කියයි. මහාවංසයේ දීර්ඝ වූ 70 පරිච්ඡේදය පුරා ම ඇත්තේ ඒ සංග්‍රාම පද්ධතිය යි. මේ අතර රුහුණේ මානාභරණ ගේ සේනා පොළොන්නරුවට කඩා-වැදී ගජබාහු පරාක්‍රමබාහු ගේ පිහිට පතයි. පරාක්‍රමබාහු ගේ හමුද මනාභරණ පරදවා රුහුණට පලවා-හරියි. එම ග්‍රහණයෙන් මිදුණු ගජබාහු රජ සුළු කලකින් පරාක්‍රමබාහුට විරුද්ධ ව යුද මෙහෙයවන්නට විය.[10] එහෙත් මේ වන විට හමුද ශක්තිමත් ව ගොඩනගා තම ආධිපත්‍යය පැවති දක්ෂිණ දේශය තුළ මනා වූ ආර්ථික සංවර්ධනයක් පවත්වාගෙන සිටි පරාක්‍රමබාහුට ගජබාහු ගේ හමුදවට මුහුණ දීම අසීරු නො වී ය.

දිගින් දිගට ම පරාක්‍රමබාහු ගේ සේනාවල ප්‍රතිප්‍රහාරවලින් අසරණ වූ ගජබා රජු ඊළඟට පිහිට් පැතුවේ පොළොන්නරුවේ සිටි නිකායික භික්ෂූන් වහන්සේලා ගෙන් ය. මේ වන විට සටන් මෙහෙයවමින් පරාක්‍රමබාහු ගිරිතලාවේ විසුවේ ය. මහාවංසය කියන පරිදි පරාක්‍රමබාහු රැඳී-සිටි ගිරිතලාවට පැමිණි ත්‍රෛනිකායක භික්ෂූන් වහන්සේලා අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරමින් ගජබාහු දරුවකු සහෝදරයකු නැති අයකු මෙන් ම වයස්ගත අයකු වන බැවින් ඔහු ගේ මරණින් පසු එම රාජ්‍යය පරාක්‍රමබාහුට නිරායාසයෙන් ම අයත් වන බැවින් මෙම විනාශකාරී සටන නවත්වන ලෙසට උපදෙස් දුන් බව මහාවංසය කියයි." පරාක්‍රමබාහු භික්ෂූන්වහන්සේලා ගේ උපදෙස් පිළිගෙන යුද්ධය නවත්වා ආපසු දක්ෂිණ දේශයට ගියේ ය.[12] ඉන්පසු ගජබා රජු ගංතලාවට පැමිණ එහි රාජධානියක් කොට එහි රැඳී සිටි බවත් එහි සිට මඩුලුගිරි නම් විහාරයට පැමිණ, "රජරට මා විසින් පැරකුම්බා නරනිඳුන්ට දෙන ලද්දේ යැ" යි කියා ශිලාලේඛනයක් කරවා ආපසු පැමිණ රාජ්‍ය කාලය වසර විසිදෙකක් වන කල්හි රෝගයකින් මියගිය බව මහාවංසයෙහි සඳහන් වේ.[13]

ඇති අති විශාල වාරි කර්මාන්තය මෙන් ම දක්ෂිණ දේශයට අයත් බොහෝ ප්‍රදේශවල වාරි කර්මාන්ත 58 ක් ද ආගමික ස්ථාන 58 ක් ද නිර්මාණය කරන්නේ මෙම අවධියේ ය. ලංකාව එක්සේසත් කර සමෘද්ධිමත් රටක් බවට පත් කිරීමේ පරාක්‍රමබාහු තුළ වූ අපේක්ෂාව මෙම දක්ෂිණ ප්‍රදේශයේ කළ සංවර්ධන ක්‍රියාවලියෙන් තහවුරු වෙයි. දේශපාලන සබඳතා තහවුරු කර-ගැනීමට අපේක්ෂා කළ පරාක්‍රමබාහු රුහුණේ සිටි තම නැගණියන් වූ භද්‍රාවතී කුමරිය තමා වෙත ගෙන්වා-ගෙන රජරට පාලකයාට ඥාති සම්බන්ධතාවක් ඇති කරගත්තේය. ඔහු ඒ අනුව ආර්ථික, දේශපාලනමය හෝ ප්‍රචාරමය සෑම කටයුත්තක්ම ඒ දීර්ඝකාලීන බලාපොරොත්තු සඳහා යොමු කර-ගත්තේ ය. ඔහු ගේ එම අවසාන ඉලක්කය මුදුන් පත් කර-ගැනීමට මේ වන විටත් නිදහස් පාලනයක් පැවති රුහුණත් ප්‍රධාන රාජ්‍ය ලෙස නාමික ව හෝ පැවති රජරටත් එක් කළ යුතු ව තිබුණි. මේ වන විට රජරට පාලන තත්ත්වය කෙබඳු වී ද?

මුළු මහත් ලංකාද්වීපයට ඒකස්වාමී වූ විජයබා මහරජු ගේ ඇවෑමෙන් බලයට පත් වූ ඔහු ගේ සොහොවුරු I වන විජයබාහුට (ව්‍යාඃවඃ 1110-1117) හෝ ඔහු ගෙන් පසු බලයට පත් විජයබාවන් ගේ පුත් I වන වික්‍රමබාහුට (ව්‍යාඃවඃ 1111-1131) හෝ රටේ එක්සත් භාවය මුල් අයුරින් ම පවත්වාගත නොහැකි විය.[8]

දේශසීමාවල අනවරතයෙන් ඇති වූ සටන් නිසා වැසියෝ නොකඩවා පෙළුණහ. රට තුළ බලය සඳහා වූ ආරවුල් පවතින කාලයේ දී ම II වන වික්‍රමබාහු මියගොස් ඔහුගේ පුත්‍ර II වන ගජබාහු රජ වෙයි. (ව්‍යාඃවඃ1132-1153) ඔහු බෞද්ධ විරෝධී වූ බවත් බෞද්ධ සිද්ධස්ථානවලට පිදූ ගම්වලින් ලැබෙන ආදායම ඔවුන් තමන් අතට ගත් බවත් ආරාමවල යුද්ධසේනාව පවා රැඳ වූ බවත් මහාවංසය කියයි.[9] ඔහු රජ වූ දින සිට ම මුහුණ දීමට සිදු වූයේ සංග්‍රාමවලට හා ප්‍රදේශබද්ද කැරලිවලට ය. II වන ගජබාහු එකල අගනුවර ලෙස සැලකූ පොළොන්නරුවේ සිට තම පාලනය ගෙන-ගිය බැවින් නාමික ව හෝ ඔහු මුළු රටේ ම රජු ලෙස පිළිගැනීමක් විය. ඔහු රුහුණේ සමහර ප්‍රදේශ තම පාලනයට නතු කරගත්තේ ය. දළදව මේ වන විට ගජබාහු රජුට හිමි ව පොළොන්නරුවේ තිබූ බැවින්

"යළිත් ඒ නරනිඳු පුත්‍රයෙක් හෝ සහෝදරයෙක් හෝ නැත. වැලි එකෙක් ඇත. මහලු බැවින් තෙමේ මරුමුවෙහි සිටින්නේය. ලෝක ශාසනාභිවෘද්ධිය හේතුකොට ගෙන රාජ්‍ය සාධනය වේ නම් භවත්හුගේ ඒ ප්‍රතිඥාව ද නොබෝ කලකින්ම සමෘධවේ. එහෙයින් භික්ෂු සංඝයා ගේ වදන් පුදන්නා වූ භවත්හු විසින් සටන් හැර සිය රට යා යුතුවේ"[4]

මෙසේ භික්ෂූන් වහන්සේලා මැදිහත්ව කළ යුද්ධය සමථයකට පත්කිරීම තුළින් එවන් ඔවුහු රාජ්‍ය පාලනයේ කෙතරම් ආධිපත්‍යයක් දරා සිටියෝ ද යන්න ද පැහැදිලි වෙයි. භික්ෂූන් වහන්සේලා ගේ මැදිහත්වීමෙන් මෙම ගිවිසුම්ගත් නරපතීන් දෙදෙනා ගේ පසුබිම ගැන සලකා බැලීමෙන් එම ගිවිසුවේ වටිනාකම තේරුම්ගත හැකි ය.

ඉන්දීය භාෂා සාහිත්‍යය පිළිබඳ අති විශිෂ්ට උගතකු වූත් ලංකා ඉතිහාසය පිළිබඳ ප්‍රාමාණික විද්වතකු වූත් මහාචාර්ය බිමල් චරණ ලෝ සඳහන් කරන පරිදි පරාක්‍රමබාහු ලක්දිව රාජාවලියේ ශ්‍රේෂ්ටතමයා වන අතර, මේ උදර නායකයා ලක්දිව යළිත් සාමය ඇති කොට දකුණු ඉන්දියාව ඇතුළු කාම්භෝජය දක්වා විදේශීය සිය අණසකට නතු කර-ගත්තේය.[5] අපූර්ව ශක්තියකින් ද, විචාර බුද්ධියෙන් ද යුක්ත වූ හෙතෙම අවුරුදු තිස් දෙකක් රට පාලනය කළේය. තමා විසින් කරවන ලද රමණීය විහාරාරාම, උයන් වැව් ආදියෙන් හේ ලංකාව අලංකාර කළේය. ඔහු මනාභරණ රජු ගේ පුත්‍රයාය. මහාවංශයේ සඳහන් වන පරිදි මානාභරණ රජ කළ රුහුණු රට පිහිටි පුංඛගාමය ඔහු ගේ ජාත භූමිය විය.[6] තරුණ වියට පත්වන පරාක්‍රම කුමරු දක්ෂිණ දේශාධිපති ව සිටි අවධියේ වර්තමාන පඬුවස්නුවර නමින් හඳුන්වන ප්‍රදේශයේ ඔහු පරාක්‍රමපුරය නම් රාජධානිය පිහිටුවා ගෙන සංවර්ධන කටයුතුවල නියැළිණි. මහාවංසය කිය පරිදි එකල මෙම දක්ෂිණ දේශයට උතුරින් කලා ඔයෙන් ද නැගෙනහිරින් මාතලේ දිස්ත්‍රික්කයේ නැගෙනහිර භාගයෙන් හා උඩුදුම්බර සිට ශ්‍රී පාදය දක්වා පෙදෙසින් ද දකුණින් වෙන්කර ගඟින් ද මායිම් වූ භූමි භාගයක් අයත් විය.[7] සමුද්‍ර ය යි නම් කළ වර්තමානයේ පඬා වැව යනුවෙන් හැඳින්වෙන නටබුන් ව ගොස්

අපි අනාථයින් මෙන් අනුන් ගේ හපන්කම් ගැන පමණක් වර්ණනා කරමින් සිටිමු.

මෙම ලිපිය ඇරඹීමේ දී ඉහත කරුණු ප්‍රස්තුත කරගනු ලැබුවේ දැනට ඓතිහාසික ව සනාථ කළ හැකි ලෝකයේ පැරණිතම සාමගිවිසුම ලංකාවේ ඇති බවත් ඒ පිළිබඳ ව බොහෝ දෙනෙකු ගේ දැනුමක් නොමැතිකමත් සැලකිල්ලට ගෙන ය.

පැරණි ලේඛනවල මණ්ඩලගිරි විහාරය, මඩුලුගිරි විහාරය, මණ්ඩල විහාරය, උපරිමණ්ඩල විහාරය හා උඩුමඩුලු විහාරය ලෙසින් ද[1] වර්තමානයේ සංගමුවිහාරය නමින් ද හැඳින්වෙන විහාරස්ථානයේ ගලක මෙම සාම ගිවිසුම ශිලා ලේඛනයක් ලෙස කොටවා ඇත.[2] පළමුවන පරාක්‍රමබාහු රජු (ව්‍යඃවඃ 1153-1186) දක්ෂිණ දේශයේ පාලකයා වශයෙන් සිටි අවධියේ ඔහුත් එවකට පොළොන්නරුවේ රාජ්‍ය කළ ගජබාහු රජුත් (ව්‍යඃවඃ 1131-1153) අතර ඇති විය හැකි ව තිබූ යුද්ධයක් වැළැක්වීම සඳහා ඇති කරගත් ගිවිසුම මෙම ශිලාලේඛනයේ සඳහන් ව ඇත. මෙම සෙල්ලිපිය දිගින් අඩි 4 කින් ද පළල අඩි 3 අඟල් 6 කින් ද යුක්ත වන අතර එහි ඇති අක්ෂර දෙළොස්වන සියවසට අයත් යැයි සැලැකෙන මධ්‍යකාලීන සිංහල අක්ෂරවලට අයත් වන අතර අකුරක් අඟල් දෙකක් පමණ උසින් යුක්තය.

ලක්දිව දීර්ඝ රාජාවලියේ ශ්‍රේෂ්ඨතමයා වන, ඒ නිසාම මහා පරාක්‍රමබාහු නමින් විශේෂ පදයක් මුල් කොටගෙන හඳුන්වනු ලැබූ පළමුවන පරාක්‍රමබාහු මහාවංසයේ (විල්හෙම්ගෛගර් හා අන්ධානුකරණයෙන් ඔහු අනුගමනය කරන වර්තමාන ඇතැම් ඉතිහාසඥයින් ද චූලවංසය යැයි සඳහන් කරන, සඳහන් වන පරිදි දක්ෂිණ දේශයේ බලය තහවුරු කරගෙන මුළු ලක්දිව එක්සේසත් කරනු පිණිස එවකට පොළොන්නරුවේ සිට රාජ්‍ය විචාරමින් සිටිය තම ඥාති සොයුරා වූ ගජබාහු සමග සටනට එළඹුණි.[3] මේ සටනින් දෙපක්ෂයටම මහත් විනාශයක් සිදු වන බව දුටු භික්ෂූන් වහන්සේලා එක් ව ඔවුන් දෙදෙනා සමග සාකච්ඡා කර දෙදෙනා අතර සාමයක් ඇති කිරීම පිණිස මෙම ගිවිසුම සකස් කොට බලගැන්වූහ.

# පොළොන්නරුව යුගයට අයත් ලොව පැරණිතම සාම ගිවිසුම

ඒ.එම්. කරුණාරත්න

මෑත ඉතිහාසයේ යුද වැදි රටවල් අතර ද, ජාතීන් අතර ද, කලාප අතර ද ඇති කරගත් සාම ගිවිසුම් ගැන බොහෝ තොරතුරු අපි අසා ඇත්තෙමු. වසර ගණනක් ඇදී ගිය ඒ ඒ යුද වැදි පාර්ශ්වවලට බොහෝ හානි ගෙනදුන් එම සංග්‍රාම අවසන් කරන්නට මෙම ගිවිසුම් හේතුකාරක වූ බව පෙනේ. එහෙත් ඇතැම් සාම ගිවිසුම් කඩදාසිවලට පමණක් සීමා වී යකඩ සේප්පුවල තැන්පත් වී ඇති අතර, පැවතුණු යුද්ධ එසේ ම ශීතල යුද්ධ ලෙස සිදු කෙරෙන අවස්ථා ද නැත්තේ නො වේ. එහෙත් සමස්තයක් වශයෙන් ගත් කළ මෙම සාම ගිවිසුම් යුද සංහිඳියාවක් ඇති කිරීමට දායක වී ඇති බව පෙනේ. මේ ගිවිසුම් සියල්ලක් ම අපට හමු වන්නේ නූතන යුගයේ දී ය. එහෙත් දැනට වසර අටසිය පණහකට (850) පෙරාතුව ලියූ සාම ගිවිසුමක් ලෝකයේ කුමන හෝ රටක ශේෂ වී ඇතැ යි නොසිතමි. යම් යම් පර්යේෂණ සිදුකිරීම් හා ඒ අනුව නොයෙක් දේ නිර්මාණය කිරීම් පිළිබඳ ව ඉතිහාසයේ ඇති වාර්තාවලට බොහෝ විට උරුමකම් කියන්නෝ බටහිරයෝ ය. එම තරඟයෙන් පෙරදිග රටවල් එතරම් ඉදිරියෙන් නොසිටින අතර ලංකාව ගත් කල එය එම නාමාවලියේ කොතනක තිබේ ද යි සොයා-ගැනීමට ද නොහැකි ය යි බටහිර අධ්‍යාපනය ලැබූවකුට කීමට පුළුවන. වාරි තාක්ෂණය, නගර නිර්මාණ ශිල්පය, කලා නිර්මාණ තාක්ෂණය, මෙන් ම කෘෂිකාර්මික ඥානයෙන් ලංකාවේ පැරැන්නන් කළ සොයාගැනීම් හා කළ නිර්මාණ පිළිබඳ ව තොරතුරු ක්‍රමවත් ව පෙළගැසුව හොත් බටහිරයන් සොයාගත් හා නිර්මාණය කළ දේවලට නොදෙවැනි නිර්මාණ අපේ පැරැන්නන් කර ඇති බව සනාථ වෙයි. එහෙත් එබඳු උත්සාහයක් මෙතෙක් කර නැති අතර

# පාදක සටහන්

1. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ හිටපු ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිනිය සමග කළ සම්මුඛ සාකච්ඡාවක් ඇසුරෙනි.

# ආශ්‍රිත ග්‍රන්ථ


1. කෝට්ටේගොඩ, ජයසේන (2006). කෝලම් ගැමි නාට්‍යයක් නොවේ : සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට වසරක් පිරීම නිමිත්තෙනි. බොරලැස්ගමුව. කර්තෘ.

දැනුම ද ලබා දිය යුතු වේ. කලාව පවත්නා සෞන්දර්යාත්මක සංසිද්ධීන්ට හා නිර්මාණයන්ට සංවේදිතාවක් දැක්වීමට පුද්ගලයන් යොමු කිරීම අධ්‍යාපනයේ එක් අරමුණක් විය යුතු බවට දර්ශනික මතයක් ද වේ. ළමයා ගේ විචාර ශක්තිය වර්ධනය කිරීම සඳහා ගණිතය, විද්‍යාව සහ තාක්ෂණය ආදී විෂයන් අවශ්‍ය වන්නා සේ ම, ඔහු ගේ චින්දනීය ශක්තිය වර්ධනය කිරීමට නම් සෞන්දර්ය විෂයන් ඉගැන්වීම ද අත්‍යවශ්‍ය වේ. සංස්කෘතික වශයෙන් දියුණු සෑම රටක ම පාහේ සෑම පුරවැසියකුට ම චිත්‍ර, නැටුම්, සංගීත ආදී සෞන්දර්ය නිර්මාණයන් භාවිත කිරීමේ හැකියාවක් තිබිය යුතු ය. එම නිර්මාණ ශක්තිය ඇති සිසුන්ට ලලිත කලා කෞශල්‍යයන් වර්ධනය කර-ගැනීමට වර්තමානයේ අධ්‍යාපන අමාත්‍යාංශය පහසුකම් සපයා ඇත. එම නිසා විශ්වවිද්‍යාලයවල අධ්‍යාපනය ලබන, සෞන්දර්ය විෂයන් හදාරන ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට අවශ්‍ය පහසුකම් ලබා දිය හැකි හොඳ ම ස්ථානය ලෙස විශ්වවිද්‍යාලය පුස්තකාලය සැලකිය හැකි ය. ඔවුන්ට අවශ්‍ය තොරතුරු මූලාශ්‍රය මොනවා ද යි හඳුනාගෙන, ඒවා අයත් කරගෙන, සංවිධානය කර, ආරක්ෂා කර, පරිහරණය සඳහා පුස්තකාලයේ තැන්පත් කළ යුතු ය. එමෙන් ම සිසුන් පුස්තකාල භාවිතයේ දී ගැටලුවලට මුහුණ පාන්නේ නම් ඒවා ද හඳුනාගෙන සාර්ථක පුස්තකාල සේවාවක් ලබාදීමට පුස්තකාල කාර්ය මණ්ඩලය කැප විය යුතු ය.

විද්‍යාත්මක හා තාක්ෂණික දියුණුව වේගයෙන් ඇති වෙමින් පවතින වර්තමාන ලෝකයේ අධ්‍යාපනයෙහි සමබරතාවක් ඇති කිරීම ශිෂ්‍යයා ගේ ආකල්ප වර්ධනයට මෙන් ම පෞරුෂ වර්ධනයට ද හේතු වේ. මානව දයාවෙන් පිරිපුන්, විනීතකමින් යුතු, බුද්ධිමත් බවෙන් මෙන් ම උගත්කමින් ද යුතු පිරිසක් තැනිය හැක්කේ සෞන්දර්ය අධ්‍යාපනය සාර්ථක මෙන් ම උපරිම අයුරින් ද ඒ සඳහා යොදගැනීමෙන් ම පමණි. එම නිසා සෞන්දර්ය විෂයන් ඉගැනීමට කැමති හා දක්ෂතා දක්වන පුද්ගලයන් හට ඒ සඳහා අවස්ථාව මෙම විශ්වවිද්‍යාලයෙන් මෙන් ම පුස්තකාලයෙන් ද ලබාගැනීමට හැකියාව තිබේ. එම නිසා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය පුස්තකාලය කලාවට කෝතැන්නක් වන බව පැවසීම අතිශෝක්තියක් නො වේ.

වූයේ, මෙම විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලය සඳහා වෙන ම ගොඩනැගිල්ලක අවශ්‍යතාවය ඇති වී ඇති බව යි. එනම්, මෙම විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලය පිහිටා තිබෙන්නේ මහල් හතරකින් යුතු ගොඩනැගිල්ලක තෙවන මහලේ ය. බොහෝ අවස්ථාවල දී අනෙක් පීඨ දෙකෙහි මෙන් ම, දෘශ්‍ය කලා පීඨයේ සිසුන්ට ද නිතර ප්‍රධාන පුස්තකාලය භාවිත කිරීමට අවශ්‍ය වුවත්, ගමනාගමන අපහසුව හේතුවෙන් අවශ්‍යතාව මගහරින බව පෙනේ. නර්තන හා නාට්‍ය කලා පීඨ සහ කොහුවල පරිශ්‍රය පුස්තකාලයේ බිම් මහලේ ම පුස්තකාලය පිහිටා ඇති බැවින් අපහසුවකින් තොර ව පුස්තකාලය වෙත පාඨකයන්ට පැමිණිය හැකි ය. එහෙත්, අනෙක් පුස්තකාලය දෙකේ නොමැති බොහෝ පැරණි පොත් ප්‍රධාන පුස්තකාලයේ ඇති බැවින් සිසුන්ට විභාග පැවැත්වෙන කාලසීමාවේ දී අනිවාර්යයෙන් ම ප්‍රධාන පුස්තකාලය වෙත පැමිණීමට සිදු වේ. එම නිසා මහල් තුනක් නැග පුස්තකාලය වෙත සිසුන් පැමිණෙන්නේ අත්‍යවශ්‍ය ම කරුණක් හේතුවෙනි.

ශ්‍රේෂ්ඨ ඉන්දියානු පුස්තකාල විද්‍යාඥයකු වන එස්.ආර්. රංගනාදන් මහතාට අනුව, "පුස්තකාලය යනු වැඩෙන ආයතනයකි". එම නිසා මෙම විශ්වවිද්‍යාලයේ ද, පවතින පුස්තකාලය සඳහා ඉඩකඩ මදිවීමේ ගැටලුව එකතුවේ. වර්ධනයත් සමග ම ඇති වේ. ප්‍රධාන පුස්තකාලය දැනට මත් එම අවස්ථාවට ළඟා වෙමින් සිටී. එබැවින් පුස්තකාලය සඳහා වෙන ම ගොඩනැගිල්ලක් ඉදි කිරීමට දැන් සිට ම සැලසුම් සකස් විය යුතු ය. ප්‍රධාන පුස්තකාලයට අමතර ව පීඨ තුන සඳහා ද වෙන ම පීඨ පුස්තකාල ආරම්භ වන්නේ නම්, සිසුන් මුහුණපාන ගැටලු බොහෝමයක් නිරාකරණය කරගත හැකි ය.

"කලාව කලාව සඳහා නො ව ජනතාව සඳහා ය" යන ජනප්‍රිය මතය එද මෙන් ම අද ද ලොව පුරා ප්‍රචලිත වී ඇත. සමාජයේ වෙනත් පුද්ගලයන් නිපදවන දෙයින් ප්‍රයෝජන ලබන්නා සේ ම කලාකරුවා නිපදවන දෙයින් ද සමාජයට සේවයක් සිදු වේ. එම නිසා සෞන්දර්ය අභියෝග්‍යතා ඇති පුද්ගලයන්ට උසස් කලාකරුවන් වීමට මගපෑදිය යුතු අතර, ඒ සඳහා ඔවුන්ට අවශ්‍ය

| | | |
|---|---|---|
| 700 | - | ලලිත කලා ඉතිහාසය |
| 710 | - | භූමි දර්ශන ශිල්පය |
| 720 | - | ගෘහ නිර්මාණ ශිල්පය |
| 730 | - | මූර්ති ශිල්පය |
| 740 | - | චිත්‍ර කර්මය හා මෝස්තර කලාව |
| 750 | - | පින්තාරු කිරීම |
| 760 | - | මුද්‍රණ හා ග්‍රැපික් චිත්‍ර |
| 770 | - | ඡායාරූප ශිල්පය |
| 780 | - | සංගීතය |
| 790 | - | විනෝදාත්මක ක්‍රීඩා |
| 793.3 | - | නැටුම් |

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ නේවාසිකාගාරයක් ලෙස පවත්වාගෙන ගිය අංක 16, ඇස්. ද ඇස්. ජයසිංහ මාවතේ, කොහුවල, කලුබෝවිල පිහිටි ගොඩනැගිලි පරිශ්‍රයේ බිම් මහලේ ශාඛා පුස්තකාලය පිහිටා ඇත. එහි දැනට පොත් 67000 ක් පමණ පාඨක පරිහරණය සඳහා තැන්පත් කර ඇත. කොහුවල පුස්තකාලයේ කාර්ය මණ්ඩලයට සේවකයන් තුන් දෙනෙකු අයත් වන අතර, පොත් පිරිසැකසුම් කටයුතු සියල්ල ප්‍රධාන පුස්තකාලය මගින් සිදු කරනු ලබයි. එම නිසා කොහුවල පරිශ්‍රය පුස්තකාලයෙන් පාඨකයන් සඳහා පොත් නිකුත් කිරීම, ආපසු භාරගැනීම, ප්‍රමාද ගාස්තු අය කිරීමට කටයුතු කිරීම පමණක් සිදු කරනු ලබයි. එහි ද විමර්ශන අංශය හා බැහැරදෙන අංශය ලෙස අංශ දෙකක් ඇත. එකවර පාඨකයින් 35 දෙනෙකුට පමණ ආසන පහසුකම් සපයා ඇත. මෙම විශ්වවිද්‍යාලයේ නර්තන හා නාට්‍ය කලා පීඨයේ මෙන් ම සංගීත පීඨයේ ද ප්‍රථම සහ දෙවන වසර අධ්‍යයන කටයුතු කොහුවල පරිශ්‍රයේ දී සිදු කරනු ලබන බැවින් එම පීඨවල සිසුන් විසින් එහි පුස්තකාලය පරිහරණය කරනු ලබයි. ප්‍රධාන පුස්තකාලයෙන් සහ නර්තන හා නාට්‍ය කලා පීඨ පුස්තකාලයෙන් ද පොත් ලබාගැනීමට ද ඔවුන්ට අවස්ථාව තිබේ. පාඨකයින් ලියාපදිංචි කිරීමේ සියලු ම කටයුතු ප්‍රධාන පුස්තකාලයෙන් ඉටු කරනු ලබයි.

මෑතක දී කරන ලද පර්යේෂණයක දී අනාවරණය වූ කරුණක්

වාර්ෂික දායකත්වය ලබා ඇත. ග්‍රන්ථ නාමාවලීන් ගෙන්වා ගැනීම, පීඨාධිපති නිර්දේශයන් ලබාගැනීම, පුස්තකාලය කමිටුවට ඉදිරිපත් කිරීම, පොත් සඳහා මිල ගණන් කැඳවීම, පොත් ගෙන්වාගැනීම, මුදල් ගෙවීම සඳහා අදාළ අංශ වෙත වවුචර් ඉදිරිපත් කිරීම මෙන් ම ප්‍රතිග්‍රහණය, සූචිකරණය, වර්ගීකරණය ආදී සියලු ම කටයුතු සිදු කරනු ලබන්නේ හෝර්ටන් පෙදෙසේ පිහිටි ප්‍රධාන පුස්තකාලයෙන් ය. ලබාගන්නා පොත්වලින් පිටපත් 02 ක් හෝ 03 ක් (ලබාගන්නා පිටපත් සංඛ්‍යාව අනුව) කොහුවල පරිශ්‍රයේ ඇති ශාඛා පුස්තකාලයට යවනු ලැබේ. වාර සඟරා සියල්ල ප්‍රධාන පුස්තකාලයේ ඇත. නර්තන හා නාට්‍ය කලා පීඨයට ලබාගනු ලබන සියලු ම පොත් එම පුස්තකාලයට ම රැගෙනයනු ලබයි.

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ ව, සෞන්දර්ය අධ්‍යයන ආයතනය වශයෙන් පැවති මෙය විශ්වවිද්‍යාලයක් බවට පත් වූයේ මෑතක දී බැවින්, පුස්තකාලයාධිපති සහ පුස්තකාලයේ පරිපාලන කටයුතු සඳහා සහකාර ලේඛකාධිකාරී (පුස්තකාල සේවා) යන තනතුරු තව මත් ස්ථාපනය වී නොමැත. එහෙත්, වර්තමාන උපකුලපතිතුමා ගේ නිර්දේශයන් මත පුස්තකාලයාධිපති තනතුර පිරවීමට කටයුතු මේ දිනවල සිදු වෙමින් පවතී.

මෙම පුස්තකාලයේ, ශාස්ත්‍රීය හා වෘත්තීය සුදුසුකම් සහිත සහකාර පුස්තකාලයාධිපතිවරයකු සමග පුස්තකාලය විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා, උපාධි මෙන් ම පශ්චාත් උපාධි ලැබූ සුහදශීලී පුස්තකාලය සහකාර සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩලයක් සේවය කරයි. නර්තන හා නාට්‍ය කලා පීඨ පුස්තකාලයේ ද දැනට කාර්ය මණ්ඩල සාමාජිකයන් දෙදෙනෙක් සේවයේ යෙදී සිටිති. මෑතක දී ආරම්භ කළ බැවින් එහි පොත් 2000 ක පමණ සංඛ්‍යාවක් පාඨක පරිහරණය සඳහා රාක්කගත කොට ඇත.

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට අදාළ විශේෂ විෂයන් යටතේ ග්‍රන්ථ බොහෝමයක් පුස්තකාලයේ ඇත. එම විෂයන්වලට අදාළ විශේෂ විෂය වර්ග අංක පහත දැක්වේ.

නිත්‍ය විමර්ශන පොත් අවශ්‍ය නම් ඡායා පිටපත් ගැනීමට පුස්තකාලය තුළ ම අවස්ථාව ඇත. අවසන් වසර සිසුන් විසින් සම්පාදනය කරනු ලබන නිබන්ධන, පුස්තකාලය තුළ විමර්ශනය සඳහා පමණක් ම ලබාදෙනු ලබයි. සාමාන්‍ය විමර්ශන ග්‍රන්ථ එක් දිනක් තුළ හෝ එක් රැයක් ළඟ තබාගැනීමට ඉඩ දෙනු ලබයි. ඒ සඳහා පාඨක බලපත්‍රයක් පාඨකයන්ට ලබා දී ඇත. උදේ වරුවේ ලබාගන්නා විමර්ශන අංශයේ පොතක් එදින ම සවස භාරදිය යුතු අතර, සවස 3.00 න් පසු ලබා ගන්නා පොතක් පසුදින උදේ 10.00 ට පෙර පුස්තකාලයට භාරදිය යුතු ය. සති අන්තයේ දින දෙකක් පොත ළඟ තබාගත හැකිය. විමර්ශන අංශයේ එක් වරකට පාඨකයන් 60 දෙනෙකුට පමණ ආසන පහසුකම් ඇත. විමර්ශන අංශයේ ස්ථානගත කොට ඇති සූචි කැබිනෙට්ටුව මගින් පාඨකයන්ට අවශ්‍ය ග්‍රන්ථය තිබෙන රාක්කය සොයාගත හැකි ය. වර්තමානයේ සූචි ක්‍යැබිනෙට්ටුවට අමතර ව, විමර්ශන අංශයේ ස්ථාපිත කර ඇති පරිගණක සූචිය මගින් ද පාඨකයන්ට අවශ්‍ය පොත් සොයා-ගැනීමේ පහසුකම් සලසා දී ඇත.

බැහැරදෙන අංශයේ එක් වරකට පොත් 3 ක් ලබාගැනීමේ පහසුකම ඇත. ඩිවි දශම වර්ගීකරණ ක්‍රමයට අනුව 000 සිට 999 දක්වා අංක යටතේ පොත් රාක්කගත කර අදාළ විෂය අංකය රාක්කය මත සටහන් කර ඇත. ඉංග්‍රීසි පොත් එකතුව වෙන ම ස්ථානයක සහ සිංහල පොත් වෙන ම ස්ථානයක ස්ථානගත කර ඇත. පාඨකයන් විසින් බැහැරදෙන අංශයෙන් ලබා ගන්නා පොත් සති දෙකක කාලයක් ළඟ තබාගත හැකි ය. එයට වැඩි කාලයක් තබා ගත යුතු නම්, නැවත සති දෙකකට පමණක් කාලය දීර්ඝ කරගත හැකි වේ. එදිනෙදා ලැබෙන පුවත්පත් පාඨක පරිහරණය පිණිස පුස්තකාලය පිවිසුම අසල පුවත්පත් රඳවනවල තැන්පත් කර ඇත. ඒ අතර ඉංග්‍රීසි මෙන් ම සිංහල පුවත්පත් ද 08 ක් වේ.

ප්‍රධාන පුස්තකාලය සතියේ දිනවල පෙ.ව. 8.30 සිට ප.ව. 5.00 දක්වාත්, සෙනසුරාදා දිනවල විමර්ශන අංශය පමණක් පෙ.ව. 8.30 සිට ප.ව. 4.00 දක්වාත් විවෘත ව පවතී. පුස්තකාලය සතු එකතුව පොත් 45,000 ක් පමණ වේ. වාර සඟරා 45 ක් සඳහා

අයත් වේ.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මුදියන්සේ දිසානායක, මහාචාර්ය ලයනල් බෙන්තරගේ, ආචාර්ය ශ්‍රියාණි රාජපක්ෂ යන නර්තන විෂයට සම්බන්ධ විද්වතුන් විසින් රචිත එම විෂයට අදාළ ග්‍රන්ථ බොහෝමයක් මෙම පුස්තකාල තුළෙහි ඇත. එමෙන්ම සංගීත විශාරද සනත් නන්දසිරි, විශාරද දයා රණතුංග, මහාචාර්ය අමරා රණතුංග, ආචාර්ය දයාරත්න රණතුංග, ආචාර්ය ප්‍රේමදාස මුදුන්කොටුව ආදීන් විසින් සංගීත විෂය අළලා රචිත ග්‍රන්ථ ද පාඨක පරිහරණය පිණිස තබා ඇත. දෘශ්‍ය කලාවට සම්බන්ධ ව ග්‍රන්ථ ප්‍රකාශයට පත් කොට ඇති, මහාචාර්ය ඇල්බට් ධර්මසිරි මෙන් ම ආචාර්ය සරත් චන්ද්‍රජීව ආදීන් ගේ ද ග්‍රන්ථ මේ අතර වෙයි.

පුස්තකාලයට වාර සඟරා වර්ග 45 ක් පමණ ලබාගන්නා අතර, ප්‍රධාන විෂයන් තුනට අමතර ව පොදු වාර සඟරා ද ඇත. Time, National Geographic Magazine වැනි සඟරා ඒ අතර වෙයි. නූතනයේ සිදු වන තාක්ෂණික වර්ධනයේ වේගයත් සමඟ ම වර්ධනය වන පරිගණක විද්‍යාව සම්බන්ධ ව දැනුම ද පාඨකයන්ට ලබාදීම සඳහා පරිගණක, AV MAX, Chip වැනි පරිගණක විද්‍යාව හා සම්බන්ධ වාර සඟරා ඇණවුම් කර ලබාගනී. දෘශ්‍ය කලා පීඨයට,

- Asian photography
- Ceramic Review
- Marg

ආදී වශයෙන් වාර සඟරා විස්සකට වැඩි සංඛ්‍යාවක් සඳහා වාර්ෂික දායකත්වය ලබාගෙන ඇත. නර්තන සහ සංගීත විෂයන් සඳහා දේශීය ව හා විදේශීය ව මිල දී ගත හැකි වාර සඟරා සංඛ්‍යාවෙන් අඩු ය. එහෙත්, Sangeet natak, Music Education research, Journal of Musicological Research, British Journal of Music Education ආදී වාර ප්‍රකාශන දේශීය ඒජන්තවරුන් මගින් විදේශීය රටවලින් ගෙන්වාගනු ලැබේ.

Rajput painting, The world of Learning ආදී වටිනා ග්‍රන්ථ අන්තර්ගත ව ඇත. ඉතා වටිනා බිතු සිතුවම් ග්‍රන්ථ 28ක් සහ ඒ හා සම්බන්ධ සංයුක්ත තැටි එකතුව විශේෂ එකතුන් අතර වේ. කතලුව, කරගම්පිටිය, කැලණිය, ගංගාරාමය ආදී ලංකාවේ ප්‍රසිද්ධ පූජාස්ථාන 28ක ඇති බිතුසිතුවම් මෙම ග්‍රන්ථවල ඇත. මෙම එකතුවල ඇති තොරතුරු ලබාගැනීම සඳහා ලංකාවේ විශ්වවිද්‍යාලයවල ඉගැනුම ලබන සිසුන් මෙන් ම විදේශීය සිසුහු ද පැමිණෙත්. උදහරණයක් ලෙස, මෑතක දී අග්නිදිග විශ්වවිද්‍යාලයෙන් සිසුන් 100කට අධික සංඛ්‍යාවක් මෙම පුස්තකාලය නැරඹීම සඳහා පැමිණීම දැක්විය හැකි ය. තව ද, මොරටුව, පේරාදෙණිය, කොළඹ, කැලණිය ආදී විශ්වවිද්‍යාලයවල සිසුන් විසින් ද මෙම පුස්තකාල පරිහරණය කරනු ලැබේ.

ලෝක ප්‍රකට සිත්තරුන් ගේ සිතුවම් ඇතුළත් ග්‍රන්ථ බොහෝ සංඛ්‍යාවක් මෙහි දැකගත හැකි ය. ඒ අතර, Michelangelo, Leonardo da vinci, Dali, Botticello, Moore, Rosselli, Rembrandt ආදී ලෝ ප්‍රකට සිත්තරුන් සියයකට අධික ප්‍රමාණයක ගේ සිතුවම් ඇතුළත් වේ.

ශ්‍රී ලංකාවේ ප්‍රකට සිත්තරුන් වන සාර්ලිස්, සෝලියස් මැන්දිස්, ජෝර්ජ් කීට් සහ මහාචාර්ය ඇල්බට් ධර්මසිරි ආදීන් විසින් රචිත සහ ඔවුන් ගේ සිතුවම්වලින් යුතු ග්‍රන්ථ ද ලෝ ප්‍රකට ගෘහ නිර්මාණ ශිල්පියෙකු වන ජේෆ්රි බාවා මහතා ගේ නිර්මාණ ඇතුළත් වටිනා ග්‍රන්ථයන් ද, චන්ද්‍රා වික්‍රමගමගේ මහතා ගේ පැරණි ගොඩනැගිලි දෙරටු, ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන යුගයේ ගෘහ නිර්මාණ ශිල්ප, එල්.ටී.ජී. මංජු ශ්‍රී මහතා රචිත ලංකා බිතුසිතුවම් සටහන්, කලාශූරී ඇස්.පී. චාර්ල්ස් මහතා ගේ පාරම්පරික සිංහල සැරසිලි මෝස්තර වැනි පැරණි ග්‍රන්ථ ද, හින්දි භාෂාවෙන් රචිත පැරණි Kramik Pustak Malika එකතුව ද සෙනරත් පරණවිතාන මහතා ගේ Sigiri Graffiti ග්‍රන්ථය ද අප පුස්තකාලය සතු වේ. පොදුවේ ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳ ව මෙන් ම කලා ඉතිහාසය පිළිබඳ ව ද, ඉන්දියාව, ඊජිප්තුව, තායිලන්තය, ග්‍රීසිය ආදී රටවල කලා ඉතිහාසය සම්බන්ධ ව ලිය වී ඇති වටිනා පාඨ ග්‍රන්ථ ද මෙම පුස්තකාලයට

- International Encyclopedia of Dance
- Encyclopedia of the documentary film

ප්‍රධාන වේ.

පොදු විශ්වකෝෂ ද ඇති අතර, Encyclopedia of Britannica, The Glories Science Encyclopedia, Companion Encyclopedia of Anthropology, Encyclopedia of Buddhism, The new complete medical and health Encyclopedia, Encyclopedia of world cities ආදිය වේ.

ග්‍රන්ථ නාමාවලි අතර එච්.ඒ.අයි. ගුණතිලක මහතා විසින් රචිත A Bibliography of Ceylon (Sri Lanka) හි වෙළුම් ද ඇත.

මෙයින් විශ්වකෝෂ, ශබ්දකෝෂ, ග්‍රන්ථ නාමාවලි, දුර්ලභ ග්‍රන්ථ එකතුව, නිබන්ධන එකතුව මෙන් ම විදේශීය ග්‍රන්ථ එකතුවේ ඇති සමහර ග්‍රන්ථ ද (නිත්‍ය විමර්ශන) පුස්තකාලය ඇතුළත පරිහරණය කිරීම සඳහා පමණක් ලබා දෙනු ලැබේ. පුස්තකාලයාධිපති ගේ අවසරයකින් තොර ව එම එකතුවල ඇති ග්‍රන්ථ කිසිවක් ඡායා පිටපත් ගැනීමට ලබා නො දේ. අනෙකුත් ග්‍රන්ථ සහ වාර සඟරා විමර්ශන අංශයට යාබද ව පිහිටුවා ඇති පෞද්ගලික ඡායා පිටපත් සේවා ස්ථානයේ අවශ්‍ය ආකාරයට ඡායා පිටපත් ලබාගැනීමේ පහසුකම් සලසා දී ඇත.

ඉතා වටිනා මෙන් ම දැනට වෙනත් පුස්තකාලයවල ද සොයා-ගැනීමට නොහැකි දුර්ලභ ග්‍රන්ථ සේ සැලකෙන ග්‍රන්ථ එකතුවක් මෙම පුස්තකාලයේ ඇත. ඒවා අතර, සාහිත්‍ය ග්‍රන්ථ වන පැරණි පූජාවලිය, ධර්මපාල ප්‍රතිරාවය, සද්ධර්මරත්නාවලිය, සද්ධර්මාලංකාරය, කව්සිළුමිණ, බුත්සරණ, අමාවතුර, පැරකුම්බා සිරිත, විරිත් වැකිය, මහාවංසය (පැරණි) වැනි ග්‍රන්ථ සේ ම, පන්සිය පණස් ජාතක පොත (පැරණි), The Art of India, Borobudur, Rock Art in the old world, Buddhist sculpture of Sri Lanka, Lascaus (පැරණි ගුහා චිත්‍ර), Japanese painting, Japanese temples, Indian fork dance,

හෝර්ටන් පෙදෙසේ නව ගොඩනැගිල්ලේ තෙවන මහලේ එක් පසෙක විමර්ශන අංශය සහ අනෙක් පස බැහැරදෙන අංශය ස්ථානගත කර ඇත. පුස්තකාලයාධිපති කාමරය, පුස්තකාලය කාර්යාලය සහ පොත් පිරිසැකසුම් කරන අංශය වෙන් වෙන් වශයෙන් පවතී. විමර්ශන අංශය විශ්වකෝෂ, ශබ්දකෝෂ, ග්‍රන්ථ නාමාවලි, වාර්ෂික ග්‍රන්ථ, ලංකා පොත් එකතුව, දුර්ලභ ග්‍රන්ථ එකතුව, විදේශීය ග්‍රන්ථ එකතුව, වාර සඟරා එකතුව සහ නිබන්ධන එකතුවකින් ද සමන්විත වේ.

ඉතා වටිනා දුර්ලභ ගණයේ විශ්වකෝෂ ද මෙම පුස්තකාලයේ ඇත. තිබෙන විශ්වකෝෂ අතර, දෘශ්‍ය කලා පීඨයට අදළ ව පහත සඳහන් විශ්වකෝෂ දැකිය හැකි ය.

- Encyclopedia of Arts
- Encyclopedia of IT
- The Illustrated Encyclopedia of Mankind
- Encyclopedia of Advertising
- Encyclopedia of Sculpture
- Encyclopedia of Interior design
- Encyclopedia of Archaeology
- Encyclopedia of Visual art
- The Columbia Encyclopedia
- Encyclopedia of 20th Century Architecture
- Encyclopedia of world African history

සංගීත පීඨයට අදළ වන විශ්වකෝෂ අතර,

- Encyclopedia of world Music
- An Encyclopedia of Piano
- An Encyclopedia of Organ
- Encyclopedia of recorded sound

ආදිය ඇත. එමෙන් ම නර්තනය හා සම්බන්ධ විශ්වකෝෂයන් අතරින්,

- Encyclopedia of world Drama

මහගමසේකර ශාලාවේ පංති කාමර දෙකකට රැගෙන යන ලදී. එම නිසා එකතුව සඳහා ඉඩ කඩ තරමක් වැඩි වූ අතර, කාර්ය මණ්ඩලය සඳහා වෙන ම ම කුඩා කාර්යාලය කාමරයක් ද ලැබුණි.

1994 හොරණ ශාඛා පුස්තකාලය එම ආයතනයත් සමඟ ම කොළඹට රැගෙන එන ලදී. ඉන් අනතුරු ව කාර්ය මණ්ඩලයේ වැඩි වීම්, මුදල් ප්‍රතිපාදන වැඩි වීම් සිදු වුව ද, ඉඩ පහසුකම් ප්‍රමාණවත් නො වී ය. ඒ හේතුව නිසා හෝර්ටන් පෙදෙසේ නව ගොඩනැගිල්ලේ තෙවන මහලට පුස්තකාලය 2000 වසර අවසානයේ දී රැගෙන යන ලදී. එකල සේවය කළ පුස්තකාලය පාඨකයින් සඳහා විවෘත කිරීමට හැකි විය. එහි නිදහස් කියවීම් ශාලා පහසුකම්, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිනියට වෙන ම කාමරයක්, විමර්ශන අංශයක්, බැහැරදෙන අංශයක්, කාර්ය මණ්ඩලයට පහසුකම් සහිත කාමරයක් ආදී ලෙස පහසුකම් ලැබුණි. ඒ වන විට ප්‍රතිපාදන ලෙස රුපියල් ලක්ෂ 10 ක මුදලක් ලැබුණි. 2002 වසරේ දී හිටපු ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිනිය විශ්‍රාම ගත්තාය. එයින් පසු හිස් වූ එම තනතුර 2007 වසරේ දී සහකාර පුස්තකාලයාධිපතිවරයකු ගේ පැමිණීම දක්වා හිස් ව පැවතුණි.

මෙම පුස්තකාලයේ වර්තමාන තත්ත්වය පිළිබඳ සැලකීමේ දී, ප්‍රධාන පුස්තකාලය හෝර්ටන් පෙදෙසේ පවතින අතර, ශාඛා පුස්තකාලය කොහුවල පරිශ්‍රයේ ස්ථාපිත කර ඇත. නර්තන හා නාට්‍ය කලා පීඨයේ පීඨ පුස්තකාලයක් ද, වර්තමාන උපකුලපතිතුමා වන ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ මහතා ගේ මග පෙන්වීම සහ අනුග්‍රහය මත මෑතක දී ආරම්භ කරන ලදී. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ඉගැනුම ලබන සියලු ම අභ්‍යන්තර ශිෂ්‍ය ශිෂ්‍යාවන්, ආචාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියල්ලෝ මෙම පුස්තකාලය තුළෙහි පාඨකයෝ වේ. ඊට අමතර ව උපකුලපතිතුමා සහ පීඨාධිපතිවරුන් විසින් අවසර දෙනු ලබන වෙනත් විශ්වවිද්‍යාලයවල ඉගැනුම ලබන ශිෂ්‍ය-ශිෂ්‍යාවන්, පර්යේෂණ කාර්යයන්හි නියැළෙන්නන් හට සහ වෙනත් බාහිර පුද්ගලයන්ට ද පුස්තකාලය භාවිත කළ හැකි ය. ඒ සඳහා ලිඛිත අවසරයක් ලබාගත යුතු ය.

කාමරයක ආරම්භ කර පුස්තකාල සහකාර නිලධාරියකු භාරයට පත් කරන ලදී. වසරකට පමණ හොරණ පිහිටි විල්මට් ඒ. පෙරේරා මහතා ගේ "ලයාන්" නිවසට පුස්තකාලය රැගෙන යන ලදී. පොත්වල සියලු ම පිරිසැකසුම් කටයුතු කොළඹ පුස්තකාලයෙන් සිදු කොට හොරණ ශාඛාව වෙත යවා ඇත. කැලණිය විශ්වවිද්‍යාලය පූර්වාදර්ශයට ගනිමින් 1979 සිට සාමාජික බලපත්‍ර භාවිතය ආරම්භ විය. අන් විශ්වවිද්‍යාලය පුස්තකාලය සම්ප්‍රදය අනුව යමින් මෙම පුස්තකාලය ද ඒ වන විට බොහෝ දුරට වර්ධනය වෙමින් පැවත ඇත. 1980 වන විට පොත් සහ වාර සඟරා මිල දී ගැනීමට රු. 50,000 ක් වෙන් විය. එමෙන් ම වාර සඟරා මිල දී ගැනීම ක්‍රමයෙන් වර්ධනය විය. එවක හිටපු කනිෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිනිය වූ සී. වල්පිට මහත්මිය අවුරුද්දක අධ්‍යයන නිවාඩු ලබා කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි පාඨමාලාව හැදෑරූ බැවින් අධ්‍යක්ෂතුමා ගේ අධීක්ෂණය යටතේ නිලධාරීන් දෙදෙනකු පුස්තකාලයේ කටයුතු කර ඇත. 1982 වර්ෂයේ දී හොරණ ශාඛා පුස්තකාලයේ අධීක්ෂණ කටයුතු ද වල්පිට මහත්මිය විසින් සිදු කිරීම නිසා නිතර නිතර එහි යාමට ද සිදු වී ඇත. පුස්තකාලයේ විද්‍යානුකූල ව පොත් වර්ග කිරීම හා සුචිගත කිරීම ආරම්භ වී සුචිය පිළිවෙළ කිරීම ද තරමක් දුරට සිදු විය.

1983 වර්ෂයේ දී වූ විශේෂ සිදු වීමක් ලෙස හොරණ පුස්තකාලය, ප්‍රධාන පුස්තකාලය වශයෙන් නම් කිරීම දැක්විය හැකි ය. හොරණ ආයතනයේ වසර තුනක සිසුන් අධ්‍යයන කටයුතු සිදු කළ අතර, කොළඹ පළමු වසර සිසුන් පමණක් සිටීම එයට ප්‍රධාන හේතුව විය. කාර්ය මණ්ඩලයේ මාරුවීම් හා වැඩිවීම්, ශිෂ්‍යා සංඛ්‍යාවේ වැඩිවීම්, මුදල් ප්‍රතිපාදනවල වැඩිවීම් ආදිය මේ කාලය තුළ සිදු විය. එකල අධ්‍යක්ෂ වූ ආචාර්ය තිස්ස කාරියවසම් මහතා පුස්තකාලයේ වර්ධනයට ඉමහත් සේවයක් කර ඇත. 1991 වසරේ දී වල්පිට මහත්මිය සප්ත වාර්ෂික නිවාඩු ලබාගත් බැවින් පුරාවිද්‍යා පශ්චාද් උපාධි ආයතනයේ පුස්තකාලයාධිපති පියසේන මහතා විසින් පුස්තකාල අධීක්ෂණ කටයුතු කරන ලදී. පොත්පත් සහ වාර සඟරා සඳහා ප්‍රතිපාදන ලෙස මේ කාලයේ රුපියල් ලක්ෂ 2 ක මුදලක් ලැබිණි. හේවුඩ් ගොඩනැගිල්ලේ එක් කාමරයකට සීමා වූ පුස්තකාලය

ලෙසින් පත් වී ඇත. එතැන් සිට 1974 දක්වා ම ඔහු සමග එක් පුස්තකාල කම්කරුවෙක් පමණක් පුස්තකාලයේ කාර්ය මණ්ඩලයට අයත් වී ඇත.

1978 වසරේ දී කනිෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිනියක් සහ පුස්තකාල සහකාර නිලධාරියකු ගේ සේවය පුස්තකාලයට ලැබී ඇත. අධ්‍යක්ෂතුමා ගේ අධීක්ෂණය යටතේ පාලනය වූ පුස්තකාලයේ එකතුව පොත් 5000 ක් පමණ විය. පරිත්‍යාග වශයෙන් ලැබුණු ඒවා හැරුණු විට සඟරා මිල දී ගැනීමක් සිදු නො වී ය. පොත් පත් වර්ග කිරීමක් හෝ සූචිගත කිරීමක් ද නොවූ අතර, පොත් පත් පුස්තකාලයකට සුදුසු පරිදි සකස් කිරීමක් නො සිදු විණි. විමර්ශන හා බැහැර දෙන පොත් වෙන වෙන ම අල්මාරිවල දමා යතුරු ලා තිබූ අතර, පාඨකයකුට පොතක් අවශ්‍ය වූ විට හැම විට ම පුස්තකාල නිලධාරියකු විමසිය යුතු විය. විමර්ශන අංශයේ පොතක් අල්මාරියෙන් පිටතට ගැනීමේ දී පාඨකයාට ඒ පිළිබඳ තොරතුරු පොතක ලියා අත්සන් කරගැනීමට සිදු වූ අතර, නැවත භාරදීමේ දී ද එය පුස්තකාලයේ නිලධාරියකුට ම භාරදිය යුතු විය.

පුස්තකාලය සාමාජිකයන් සඳහා පාඨක බලපත්‍ර භාවිතයක් නොතිබූ බැවින්, බැහැරදෙන අංශයේ පොත් ගැනීමේ දී ද පොතක ලියා රැගෙන යා යුතු විය. විෂය අනුව පොත් අල්මාරිවල දමා තිබුණි. උදාහරණ ලෙස, පින්තාරු කිරීම සම්බන්ධ පොත් එක් ස්ථානයක මෙන් ම ප්‍රතිමා කලාව හා සම්බන්ධ පොත් එක් ස්ථානයක ආදී වශයෙන් ය. තරමක් විශාල, එක් කාමරයකට පමණක් සීමා වූ පුස්තකාලයේ ග්‍රන්ථ එකතුව ද තිබූ අතර, කාර්ය මණ්ඩලයේ රාජකාරි කටයුතු ද එහි ම සිදු කරගෙන යන ලදී. 1979 වන විට රු. 25,000 ක් ප්‍රතිපාදන ලෙස වාර්ෂික ව හිමි වී ඇති අතර, පොත් රාක්ක සහ සඟරා රාක්ක කිහිපයක් ලැබී ඇත. පොත් පත් පුස්තකාලයට ගැළපෙන පරිදි පිළිවෙළ කිරීම සිදුවීම මෙන් ම පාඨකයන්ට නිදහසේ පොත් පත් තෝරගැනීමේ අවස්ථාව ද ලැබී ඇත (Open access system).

1979 වර්ෂයේ දී ම හොරණ ශාඛා පුස්තකාලය කුඩා

# කලාවට තෝතැන්නක් වන සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයීය පුස්තකාලය


ඉමල්කා ප්‍රියදර්ශනී තිලකරත්න

වර්තමානයේ ශ්‍රී ලංකාවේ 14 වන විශ්වවිද්‍යාලය ලෙසින් නම් වන සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ අතීතය 1893 දක්වා ඈතට දිවයන්නක් වේ. ලලිතකලා අධ්‍යාපනයේ සන්ධිස්ථානයක් වශයෙන් පත් වෙමින් මරදානේ දුම්රිය පොළ අසළ කාර්මික විද්‍යාලයේ විෂය මාලාවට චිත්‍ර ශිල්පය ඇතුළු වීම මෙහි මූලාරම්භයට හේතු වී ඇත. මේ කාලයේ දී ඉතා වැදගත් යුග මෙහෙවරකට දායක වූවන් ලෙස සී.එෆ්. වින්සර්, එල්. මැක්රේ සහ විශේෂයෙන් ම ජේ.ඩී.ඒ. පෙරේරා යන මහත්වරුන් දැක්විය හැකි ය. 1949 සැප්තැම්බර් මස 13 වන දින චිත්‍ර කලා ශිල්ප අංශය කොළඹ හෝර්ටන් පෙදෙසේ පිහිටි ඉංග්‍රීසි අධිරාජ්‍යවාදීන් ගේ යුද නිවස්නය ඉවත් කර එයට ගෙන එන ලදී. එය හේවුඩ් මන්දිරයේ "රජයේ කලායතනය" ලෙසින් නම් වී ඇත.

මරදාන කාර්මික විද්‍යාලය යටතේ ම පවත්වාගෙන ගිය කුඩා පුස්තකාලයක් එකල තිබී ඇති අතර, පසුකාලීන ව එය ද රජයේ කලායතනය බවට පත්වීමේ දී එයට අයත් ව ඇත. මෙකල පුස්තකාලය භාර ව කටයුතු කරනු ලැබ ඇත්තේ ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයන් විසින් ම ය. චිත්‍ර කලා, සංගීත හා නැටුම් යන අංශ සඳහා වෙන ම කුඩා පොත් එකතුවක් පවත්වාගෙන ගොස් ඇති අතර, 1965 වසරේ දී ප්‍රථම වරට පුස්තකාලය විද්‍යා ක්ෂේත්‍රය පිළිබඳ පළපුරුද්දක් ඇති එච්.එම්. ධර්මසේන මහතා පුස්තකාලයාධිපති




මහාමායා දේවිය දුටු සිහිනය චිත්‍ර ශිල්පියා ගේ සියුම් රේඛා තුළට අන්තර්ගත වීම තුළින් චිත්‍රයේ ප්‍රබලතාවය ගම්‍යමාන වේ.



මහා සුදස්සන ජාතකයේ අන්තර්ගතයයන් රේඛාමය කිරීම මෙන්ම, රේඛාමය අධ්‍යයනයේ ප්‍රතිභාව ශිල්පීන් ගේ යුගය අවදි කරයි.




බුදුන් රන් විමානයේ රන් හිනිමගෙන් සංකිස්ස පුරයට වැඩීම දක්වන සිතුවම, පොළොන්නරු චිත්‍ර ශික්ෂණයේ ප්‍රබලතම ප්‍රකාශනය යි.



චුල්ලපදුම ජාතකයේ එන සංකල්පීය තොරතුරු ප්‍රේක්ෂකයා තුළ ගම්‍යමාන කරන්නේ රේඛාවේ ඇති ප්‍රබල ශක්තිය යි. චිත්‍ර කලා භාෂාව හුදී ජනයා ගේ බුද්ධිමය පරාශය පුළුල් කිරීමට සමත් වෙයි.



සස ජාතකයේ කථා පුවත අප බෞද්ධ සාහිත්‍යයේ පූර්ණ වූ සංවේදී චිත්‍රය යි. ශිල්පියා ගේ ප්‍රතිභාව මොනවට හෙළි කරයි.



අසංකවතී ජාතකයේ කථා හා වෙනත් පසුබිම් කථා තුළින්, චිත්‍ර ශිල්පයේ ශිල්පක්‍රම මනා ව හසුරුවා ඇත්තේ ප්‍රකාශන ශක්තියෙන් පිරිපුන් පොළොන්නරු චිත්‍ර ශිල්පියා ගේ භාවපූර්ණ කලා නිකේතනය යි.



සුමට, සුමඟ රේඛා තුළින් තේමිය ජාතකයේ තොරතුරු ප්‍රේක්ෂකයා තුළ සංවේදී චින්දනයක් ශාක්සාත් කරයි.



**දේවාරාධනා සිතුවම**

පොළොන්නරු චිත්‍ර ශිල්ප ධර්මවල පවතින අධ්‍යාත්මික ශික්ෂණය මෙම රේඛා චිත්‍රවලින් මනා ව ගම්‍ය වන්නේය. කහ සහ රතු වර්ණයේ ප්‍රබල සාම්‍යතාවය, රේඛාවේ බලය, රේඛාවෙන් ත්‍රිමාණත්වය ඉදිරිපත් කිරීමෙන් ශිල්පියා ගේ ප්‍රතිභාවය පිළිබිඹු කරයි.

යුතුකම වන්නේ ය. චිත්‍රකලා රසඥතා ඥානය මිනිසා ගේ පරිකල්පනා ඥානය සංවර්ධනයට හේතු වන්නේ ය.

සමාජ සැකසුම.

පොළොන්නරු යුගයේ චිත්‍ර සම්පිණ්ඩනය තුළින් එම යුගයේ ජනතාව ගේ ආකල්ප හා සංකල්ප නූතන ජනතාව ගේ චරිත සැකසුමට කෙසේ ඉවහල් විය යුතු ද යි නිරීක්ෂණය හා ගවේෂණයන් තුළ අන්තර්ගත විය යුත්තේ ය. එම චිත්‍ර හුදී ජනයා ගේ පහන් සංවේගය පමණක් නො ව° දැනුම ආකල්පවල වටිනාකම අවබෝධ කර ගත යුතුය. පොළොන්නරු යුගයේ මේසා වැව් කර්මාන්ත ගෘහ නිර්මාණ සැලසුම් වාරිමාර්ග අදටත් අපට අභියෝග වන්නේ ය. මෙම භෞතිකවාදී නිර්මාණ කළ පුද්ගලයෝ පිටරට භාෂාවලින් ඉගෙන ගත්තෝ නොවෙති. තමාගේ ස්වයංභූඥානයෙන් ගතිවිද්‍යා කලාශිල්ප ඥානය සංවර්ධනය කර ගත්තෝ වෙති. වෙස්සන්තර ජාතකය බිතුසිතුවම්වලට ඇඳීමෙන් ගම්‍යමාන වූයේ පාලක මහරජුගේ නිහතමානී මානව ගති ලක්ෂණ ප්‍රේක්ෂක තුළින් අනාගතය දැනුවත් කිරීම යි. සාධාරණත්වය, සමානාත්මතාව වැනි ගුණගරුක රජවරුන් අපට සිටිය යුතු බැව් ප්‍රකාශ කරන්නේ ය. රජු ගේ වස්තූන් යනු ජනතාව ගේ වස්තුහු ය. රජ මිනිසුන් ගේ ඕනෑ එපාකම් පිරිමහන්නෙකි. සස ජාතකය තුළින් විශ්වයේ සැරි සරන කලාකරුවන් ගේ සම්භාව්‍ය ගුණ අපට දැනුම් දෙයි. පරාක්‍රමබාහු රජ කිනම් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙක් ද? එහෙත් ඔහු ගේ පෞරුෂය හා ජීවගුණය පරාක්‍රම සමුද්‍රය තුළින් ම අපට ගම්‍යමාන වෙයි. එහෙත් රජතුමා තිවංක පිළිමගේ තුළ ඇඳි බිතුසිතුවම් මගින් ඥානීය පුස්තකාලයක් අපට දයාද කර ඇත. බිතුසිතුවම්වල ප්‍රතිබිම්බගත අන්තර්ගතය ජන විඥානය අවදි කිරීමටත්, ජනතාව සන්සුන් ආධ්‍යාත්මික හා නිර්මාණාත්ම පරිකල්පනයක් ගොඩනැගීම රජවරුන් ගේ අපේක්ෂණය විය. තිවංක පිළිමගේ කලාගාරය ම එහි ඇඳි සිතුවම් තුළින් වැඩිදුරටත් ඒ යුගයේ ජන විඥානය අවදිකරවීමත් රසඥතා ඥානය වර්ධනයත් අපට ගම්‍යමාන කරවයි.

කරයි. උසස් මිනිස් ගුණයන් ගැන අවබෝධයත් ඒ අනුව ගැළපුණු සමාජ සංස්කෘතියත් පිළිබිඹු වීම පොළොන්නරු යුගය අපට පසක් කර දෙයි. උසස් චින්තනයකින් හෙබි ජනතාවක් මෙන් ම, ජනතා සිතුම් පැතුම් චිත්‍රවල අන්තර්ගත වීමත්, සුවිශේෂීය. තීරුවෙන් තීරුවට වෙන් කළ චිත්‍ර ප්‍රකාශනයන්ගේ ගැළපීම, හැඩතල, සැරසිලි, ආභරණ නිරීක්ෂණයේ දී ඒ යුගයේ පොහොසත් භෞතික ලක්ෂණ ද, අධ්‍යාත්මික ලක්ෂණයන් ගේ සමබරතාව මැනවින් දෘශ්‍යමාන වෙයි. ගස් කොළන්, ලියවැල්, සත්ත්වරූප, ගොඩනැගිලි සිය චිත්‍ර තුළ සමානුපාතික සම්පිණ්ඩනය නිසා ශිල්පීන් ගේ දැනුම, බුද්ධිය මෙන් ම සතත අභ්‍යාසයන් ගේ ලක්ෂණ ද මනාව ස්ඵුට වේ. ඒ ඒ චරිතයට ආවේණික ලක්ෂණ ඒ ඒ පුද්ගලයා හැඳින්වීමට යොදන ආභරණ, ඔටුනු, සැරසිලිවල නිර්මාණ බුද්ධිභාවය මනා ව පැහැදිලි වේ.

සමූහ රූප පෙළක වුව ද, ඒ ඒ චරිතය ළඟා කරදුන් පෞද්ගලික චරිත නිරූපණය රේඛා මාධ්‍යයෙන් මනා ව සටහන් කර ඇත. භක්තිය, ආදරය, මුසු වූ උසස් මානව චින්තනයක්, ශිෂ්ටාචාරගත සමාජ තොරතුරුත්, ඒ ඒ ඇඳුම් පැළඳුම්වල උසස් ප්‍රමිති ලක්ෂණත් පොළොන්නරු චිත්‍රවලින් අපට දෙනේ. ගරාවැටී විනාශයට පත් මෙම කලාගාරයේ මුල්කාලයේ කෙතරම් උසස් තත්ත්වයකට පත් වී තිබුණේ දැ යි කලාකරුවන් වන අපට පෙනේ. නූතන පුරාවිද්‍යාඥයෝ එය පිළිසකර කිරීමටත්, මහා පරිමාණ ආවරණ ඉදිකිරීමත් නිසා කලාගාරයේ විනාශයත් ඉක්මන් කර ඇත්තේ ය.

අවුරුදු අටසියයක් පමණ පැරණි මෙම කලාගාරය වනගත වී දිගු කාලයක් තිබුණ ද කෞතුක වස්තු වටිනාකම තවමත් සුරකී ඇත. චිත්‍ර කලාවෙන් පෝෂිත පුරා විද්‍යාඥයන් අපට නැති වීම, උත්පාදනය නොකරගැනීම, මෙම උසස් ගණයේ කලාකෘතීන් විනාශ වීමට හේතුවේ. චිත්‍ර ශිල්පය ආශ්‍රිත විඥාන පරිපාටිය හා වර්ණ රසායන ඥානය හා ඥානයෙන් සපිරි පුරාවිද්‍යාඥයෝ පතළ වෙත් නම්, ඔවුන් ගේ කැපවීම මෙම කලාගාර ආරක්ෂා වීමට හේතු වේ. කෙසේ වෙතත්, අප ගේ ජාතික උරුමයන් ආරක්ෂා කරගැනීමටත් එම උරුමවලට අයත් ප්‍රකාශන ශක්තීන් නූතන පරපුරේ අවධානයට ලක් කිරීමත් තුළින් උසස් රසික ජනතාවක් බිහි කිරීම අප ගේ පරම

## කථා ප්‍රවෘත්ති සම්පිණ්ඩනය

ඉහත කී කථා ප්‍රවෘත්ති ඉතා අමාරුවෙන් අධ්‍යයන කිරීම තුළින් ජාතක කථාවල අර්ථය නිරූපණය කිරීමට පුරාවිද්‍යාඥයෙක් හෝ වෙහෙස වී නැත්තේ ද? පළමුවැනි තීරයේ වෙස්සන්තර ජාතකයේ කොටසක් ය යි හැඟේ. අනෙක් තීරුවේ අසංකවතී ජාතකයේ කොටසකි. එසේ ම කාමසම්භෝගයේ යෙදෙන ස්ත්‍රී පුරුෂ රුවක් ද දිස්වෙයි. දෙවෙනි තීරයේ සස ජාතකය නිරූපණය වේ. තුණ්ඩිල ජාතකයේ කොටස් ද නිරූපණය වන අතර, මැද තීරුවේ විදුර ජාතක කොටස් දර්ශනය වෙයි. ගුත්තිල ජාතකයේ ජවනිකාවක් සම්පිණ්ඩනය වන අතර, එහි වීණාවේ කොටස් ද පෙනේ. චුල්ලපදුම ජාතකයේ මණ්ඩපයක් තුළ සිටින මහා පදුම ජාතකයේ රජතුමා දිස් වෙයි. ඊළඟ තීරුවේ මෛත්‍රීබල ජාතකයේ රජතුමා දිස් වෙයි. ඊට පසු ව දේවාරාධනා සිතුවම් පෙළකි. දෙවි දේවතාවුන්ට විජම්බන බණ දේශනයක්, රන් ඉණිමගෙන් සංකිස්ස පුරයට වැඩි බුදුන්ගේ රුවත් සටහන් වී ඇත. සතරවරම් දෙවිවරුන් ගේ රූ බව සටහන් කෙරෙන චිත්‍ර විශිෂ්ට ය. මූග පක්ඛ ජාතකයේ සටහන් කීපයක් ද තේමිය කුමරුගේ සටහන් කීපයක් අතර රථ චක්‍ර කීපයකි. තවත් තීරුවක සුදස්සන ජාතක කථාවේ කොටස් ද කුස ජාතක කථාවේ තීරු කොටස් ද අන්තර්ගත ය.

එසේ ම කලාගෝල ප්‍රශ්නයේ යම් යම් රේඛා සටහන් ද බොහෝ කථාවල සිතුවම් රේඛා කරණය මැකී යමින් පවතින්නේය. ලියකම්, කැටයම්, සැරසිලි බොහෝවක් බිත්ති මතුපිට තැනින් තැන ජීවමාන අතීතය හෙළිදරව් කරත්.

## ශිල්පී ධර්මතාවල ශක්‍යතා අවබෝධය

දෙවිදේවතාවුන්, රජවරුන්, බෝසත් රූ හා සාමාන්‍ය ජනයා ගේ රූප නිරූපණයේ දී ඒ ඒ යුගය පිළිබඳ අවබෝධය අපට ලබාදෙන්නේ විස්මයජනක අන්දමිනි. මිනිස් රූපයේ සජීවී ලක්ෂණ අවබෝධ කරගැනීමට තරම්, උසස් මානසික චින්තනයකින් පරිපූර්ණ වීමත්, ප්‍රකාශන ශක්තියේ ප්‍රායෝගික ප්‍රබල දැනුමත් තිවංක පිළිමගේ චිත්‍ර ඇඳි ශිල්පියාට උරුමයෙන් ලැබුණකි. චිත්තරූප මැවීමත්, සංකල්ප සාධනය ඇති තීක්ෂණයත් යුගයේ ජනතාව ගේ දැනුම ගම්‍යමාන

අතිසියුම් ව අඹරා එයට දොරණ තෙල්, මී තෙල් මුසු කොට රසායනය කර වර්ණ සංයෝජනය ශිල්පියාට අභිමත පරිදි හසුරුවා ඇත. ලේන හා බළල් ලෝමවලින් නිර්මාණය කරගත් තෙලිතුඩ රේඛාකරණයට උචිත ලෙසත්, තම පරිකල්පනාව තහවුරු කිරීමටත් සමත් වී ඇත. තමන් අඳින කථාවේ භාවමය අධ්‍යාත්මික ගුණ සමුදය තම සිත තුළ සමාරෝපී වූ අතර සියුම් තෙළිතුඩ ශිල්පියා ගේ ප්‍රතිභාව අතික්‍රමණය කරයි. ශිල්පියා ගේ සමාධිමත් සමාරෝපය අපට දෘශ්‍ය ගතවන්නේ ඇඳ ඇති සියුම් රේඛාවල ආතතිය යි. දෘශ්‍ය කාව්‍යයක් වන සිතුවම ඉතා සීමිත වර්ණ සංයෝජනය මගින් ප්‍රකාශ කිරීම පොළොන්නරු ශිල්පියා ගේ ප්‍රතිභාවේ බලය හා ශක්තිය යි. මිනිස් ප්‍රමාණ ප්‍රමිතියත්, සමානුපාතික ගුණයත්, හැඩයත්, රේඛාවත්, වර්ණ සංයෝජනය යන පංචවිධ ක්‍රමෝපායන් සමෝධානය (MONTAGE) වීම කෙතරම් විස්මිත ද?

ශ්‍රී ලංකාවේ සිත්තරුන් භාවිතා කරන වියළි බදාමය මත චිත්‍ර ඇඳීම ටෙම්පරා (TEMPARA) ශෛලියේ කැටප්‍රාප්තිය බව තිවංක පිළිමයේ සිතුවම්වලින් ප්‍රතිබිම්බ වන්නේ ය. එසේ ම බෞද්ධ ජාතක කථා සාහිත්‍යයේ එන ප්‍රබලතම කථාමාධූර්ය ලලිත කලාවේ උච්ච අවස්ථා ගම්‍යමාන කරයි.

## චිත්‍ර මාතෘකා සජීගුණය දනවනන කථා ප්‍රවෘත්ති

තිවංක පිළිමගේ අභ්‍යන්තරයේ බිත්තිවල නිදහසේ තීරු මත ඒ ඒ මාතෘකාවට උචිත රේඛා කරණය සමබර, සම්පීඩනය කර දක්වීම ප්‍රේක්ෂකයාගේ ඇසට රසඳුනකි. තෝරාගත් ජාතක කථාවල අන්තර්ගතය සුකොමල, සුවච විනීත රේඛාවන්ගෙන් සම්පිණ්ඩනය කිරීම මෙම සිතුවම් ශෛලියේ ශිල්පීය ඥානය යි. වෙස්සන්තර ජාතකය, අසංකාවතී ජාතකය, සස ජාතකය, තුන්ඩිල ජාතකය, විදුර ජාතකය, ගුත්තිල ජාතකය, චුල්ලපදුම ජාතකය, මෛත්‍රී බල ජාතකය, සාම ජාතකය, මහා සුදස්සන ජාතකය, කුස ජාතකය, උම්මග්ග ජාතකය මෙන්ම මහාමායා දේවිය ගේ සිහිනය, බුද්ධෝත්පත්තිය, බුදුරදුන් සංකිස්ස පුරයට හිණිමගෙන් වැඩීම වැනි මාතෘකා ගණනක් ම මෙම බිතුසිතුවම්වල අන්තර්ගතයන්ට යොදාගෙන ඇත්තේ ය.

යෝගාවචරයා නිකැතින් ම සෝවාන් චින්තනය කරා යොමු කිරීමට චිත්‍ර ශිල්පියා සමත් වෙයි. එය පොළොන්නරු චිත්‍ර ශිල්පයේ අසාමාන්‍ය ප්‍රතිබිම්බය යි.

**තිවංක පිළිමගෙය සොයා ගැනීම.**

පුරා අවුරුදු 800 ක් ම වල් බිහි වී වනාන්තරයට එකතු වී තිබුණු මෙම ගොඩනැගිල්ල 1885 දී "ඇත්.ඇම්. බරෝස්" මහතා විසින් සොයාගන්නා ලදී. 1886 දී "මරේ" මහතා විසින් පිළිසකර කර චිත්‍ර පිටපත් කරන ලදී. අනතුරු ව මුල් ම ලංකා පුරාවිද්‍යා කොමසාරිස් වන "සී.පී. බෙල්" මහතා විසින් එහි ගෘහනිර්මාණ ශිල්පය හා චිත්‍ර ගැන විමර්ශනය කරන ලදී. ඊට පසු පුරාවිද්‍යා කොමසාරිස් වූ " පරණවිතාන" මහතා විසින් මෙහි ගවේෂණ කටයුතු වැඩිදුරටත් කරන ලදී.

**චිත්‍ර ශිල්ප ක්‍රම**

මෙම ගෘහයේ අභ්‍යන්තර බිත්තිවල චිත්‍ර ඇඳ ඇත්තේ සුදුහුණු මිශ්‍රිත බදමයක් (TEMPERA) මත ය. වියළෙන්නට හැර රතු රේඛාවලින් සම්පූර්ණ කර කහ, රතු, කොළ යන වර්ණ තුන පමණක් භාවිතා කොට ඇඳීම පොළොන්නරු චිත්‍ර ශෛලියේ ලක්ෂණ ය. තව ද, රේඛා කරණයෙන් ම චිත්‍රවල ත්‍රිමාන ලක්ෂණ පෙන්වීමට තරම් විඥානමය පරිපථයක් එම ශිල්පීන්ට හිමි ව තිබීම විස්මයජනක ය. එසේ ම සිහින් රේඛා කැබලි මතින් චිත්‍රයේ වටකුරු බව පෙන්වීම ද චිත්‍ර කලාවේ ප්‍රතිභා ලක්ෂණ පෙන්නුම් කරයි. අපේ මෙම චිත්‍ර ශිල්ප ක්‍රමය අපට ම ආවේණික ක්‍රමයක් බව විචාරකයෝ සඳහන් කරත්.

පොළොන්නරු චිත්‍ර ශිල්පී ක්‍රමයේ ක්‍රම විකාශය තුළින් චිත්‍ර භාෂාවක ව්‍යාකරණය සුවිශේෂී බවකින් නිර්මිත වී ඇත. චිත්‍ර ශිල්පය තාත්ත්වික නොවුව ද, භාවාත්මක සංකල්පනා සාධනය අතිවිශිෂ්ට ය. සීමිත වර්ණ සංඛ්‍යාවකින් අධ්‍යාත්මීය ප්‍රකාශනයේ ප්‍රබලත්වය චිත්‍ර ශිල්පියා ගේ ප්‍රතිභාව පිළිබිඹු කරයි.

සාදිලිංගම්, හිරියල්, රත්හිරියල්, ගොකටු වැනි ඛනිජ හා ශාක

හින්දු ආගමික ගොඩනැගිල්ලක ස්වරූපය ගත් මෙම සුවිශාල ගොඩනැගිල්ල පිටතින් දේව, මිනිස්, සත්ත්වරූවලින් පිරුණු විමාන, අර්ධපූර්ණ උන්නත මූර්තිවලින් සමලංකෘත වී ඇත්තේ ය. එසේ ම අවශ්‍ය තැන්වලට වර්ණ ගන්වා ඇති බවට ද ලකුණු ඇත. ඉතා සුවිශාල මන්දිරයක් වන මෙම ගොඩනැගිල්ලේ තොරතුරු චූලවංසයේ ද සඳහන් වෙයි.

මෙම ප්‍රතිමාගෘහයේ අභ්‍යන්තර කලාගාරය අඩි 67 වන අතර, පළල අඩි 23 කි. අඩි 25 ක් පමණ උස ගොඩනැගිල්ලේ පසු පැත්තේ තිවංක පිළිමය නිර්මාණය කර ඇත්තේය. අති දැවැන්ත ශාලාව තුළ බිත්ති මත "ටෙම්පරා" ශිල්ප ක්‍රමයට විවිධ ජාතක කථා සිද්ධීන් සිතුවම් කොට ඇත්තේය.

## පොළොන්නරු බිතුසිතුවම්

තිවංක පිළිමගෙයට අමතර ව චිත්‍රවලින් ම වැසීයන සේ නිර්මාණය වුණු ගොඩනැගිලි අතර, පැරකුම්බා රජු ගේ මාලිගාව හා සත් මහල් ප්‍රාසාදය ද වේ. මෙම සත්මහල් ප්‍රාසාදය අභ්‍යන්තරය පුරාම චිත්‍රවලින් ම සමන්විත ව ඇති බවට සාධක ඇත. රජතුමා ගේ ශීතල මාලිගය ද මහා පුස්තකාලය ද චිත්‍රවලින් සරසා තිබුණු බවට කරුණු හෙළි වේ. එසේ ම දිඹුලාගල ද ලංකාතිලක ප්‍රතිමාගෘහයේ ද ගල්විහාර ගුහාවේ ද චිත්‍ර තිබුණු බවට සාධක ඇත්තේ ය. පොළොන්නරු යුගයේ සුවිශේෂී ගොඩනැගිලිවල වට බිත්තිවල අර්ධපූර්ණ උන්නත කැටයම්වලින් සමන්විත වූ අතර, අභ්‍යන්තර බිත්ති පුරා සිතුවම් ඇඳීම පොළොන්නරු යුගයට ම ආවේණික වූ ගෘහ නිර්මාණ ශිල්ප ක්‍රමයකි.

තිවංක පිළිමගෙයට ඇතුළු වූ පුද්ගලයා ගේ මනස හා චිත්තවේගී ස්වභාවයන් බිතුසිතුවම්වලට ආකර්ෂණය වන්නේ නිතැතිනි. බාහිර ලෝකයෙන් හෙම්බත් වී එන සැදැහවතා ශාලාවට ඇතුළු වූ සැණින් දිව්‍යමය ලෝකයකට අවතීර්ණ වේ. එම ලෝකය ඇස ගැසුණු විගසින් භක්තියෙන් වෙළී යත් ස්වාභාවික ලෝකයෙන් ඈත් වෙයි. බිතුසිතුවම්වල වර්ණ සංයෝජනය හා සුවඳ, සුගම, සුමට, සුසීල වින්දනයන් ලබාදීමට සමත්වෙයි. මෙම භාවනානුයෝගී

# පොළොන්නරුව බිතු සිතුවම්වල ප්‍රතිබිම්බිත කථාන්තරය

සිරිකුමාරසිංහ

ගුහා චිත්‍ර කලාවෙන් මෝදු වුණු සීගිරි සිතුවම් කලාගාරය පැරණි ලෝකයේ අද්විතීය චිත්‍ර කලා කේන්ද්‍රස්ථානයකි. එයින් පසු පොළොන්නරු යුගයේ බිහි වූ ශ්‍රේෂ්ඨතම කලාගාරය වන්නේ තිවංක පිළිම ගෙය යි. මේ ලිපියේ අරමුණ වන්නේ තිවංක පිළිම ගෙය ආශ්‍රයෙන් පොළොන්නරු යුගයේ චිත්‍ර කලාව ගැන විමර්ශනය කිරීම යි.

## තිවංක පිළිමගෙය

"තිවංක" යනු ත්‍රිභංග යන අරුත යි. කිසියම් මූර්තියක දනහිස, උකුළ හා උරහිස යන තුන් තැනින් නැමී ඉතා නිදහස් ව පහසුවෙන් හිටගෙන සිටීම "තිවංක" යනුවෙන් හැඳින්වේ. බොහෝ ග්‍රීක මූර්තිවල මෙම ත්‍රිභංග ලක්ෂණ තිබේ. එයින් අදහස් කැරෙන්නේ මූර්තියේ ලාලිත්‍ය ලක්ෂණ ඉරියව්වකින් ඉදිරිපත් කිරීම ය. කෙසේ වතුදු මෙම ඉරියව් ප්‍රධාන කරගත් බුදුපිළිමයේ එකී පිළිම ගෙය නමින් "තිවංක" පිළිමගේ යනුවෙන් හැඳින්වෙන්නට විය.

මෙම පිළිමගෙය වරදවා තේරුම් ගත් අය කලක් එයට දෙමළ මහා සෑය යන නාම ද ව්‍යවහාර කළහ. පළමුවැනි පරාක්‍රමබාහු රජතුමා (ක්‍රි.ව. 1153-1186) විසින් මෙම පිළිම ගෙය ආරම්භ කරන ලදී. ක්‍රි.ව. 1236-1270 කාලයේ දී දෙවෙනි පරාක්‍රමබාහු රජතුමා විසින් එය ප්‍රතිසංස්කරණය කරන ලදී. මෙම ප්‍රතිසංස්කරණයේ දී පළමු චිත්‍ර මත නව චිත්‍ර ද ගොඩනගා ඇති බව පෙනේ.

21. චන්ද්‍රා වික්‍රමගමගේ - ශ්‍රී ලංකාවේ බුද්ධප්‍රතිමා කලාව - පිටු 37, 2006 වර්ෂය, ගොඩගේ ප්‍රකාශන.
22. - එම - පිටු 25.
23. සිරි නිස්සංක පෙරේරා - "පොළොන්නරුවේ බුදුපිළිම නිර්මාණය" පිටු 04, "ලලිත" කැම්ලස් අධ්‍යාපන ප්‍රකාශන - 2005 අප්‍රියෙල් 25.
24. සිරි නිස්සංක පෙරේරා - පොළොන්නරුවේ බුදු පිළිම - දිවයින - පිටු 08, 1992 මැයි 15.
25. එස්. පරනවිතාන - පොළොන්නරු යුගය - 94 පිට.
26. ASCAR - 1903, 25-26 pp
27. කඹුරුගමුවේ වජිර නාහිමි - දළදා ඉතිහාසය හා සංස්කෘතිය - 1983
28. එස්. පරනවිතාන - පොළොන්නරු යුගය - පිටු 102.
29. එස්. පරනවිතාන - පොළොන්නරු යුගය - පිටු. 98.
30. ස. ආනන්ද වික්‍රමසිංහ - "හෙළ කලා ඉතිහාසය" - පිටු 122-122
31. එස්. පරනවිතාන - පොළොන්නරු යුගය. පිටු 98
32. මාලිංග අමරසිංහ - "පොත්ගුල් විහාර ප්‍රතිමාව" පිටු 28. පොළොන්නරු නවබුත් - ගොඩගේ ප්‍රකාශන - 2001.
33. ඩී.ටී. දේවේන්ද්‍ර - "පොළොන්නරු පැරකුම් රජ රූපය" - පිටු 69. සඳකඩපහණ හා වෙනත් ලිපි ග්‍රන්ථය - 1970 - ගුණසේන ප්‍රකාශන.
34. ඩී.ටී. දේවේන්ද්‍ර ගේ ඉහත ලිපිය - පිටු 70-74
35. සෙනරත් පරනවිතාන - පොළොන්නරු යුගය - පිටු 100.
36. Artibus Asia xv කා. 200-217 පිටු.
37. සිරි නිස්සංක පෙරේරා - "සිංහාසනය" - ඉතිහාසය හා පුරාවිද්‍යාව - පිටු. 72-73, "සිවදෙස" 2007 ඔක්තෝබර් කැම්ලස් ප්‍රකාශන මාසිකය.
38. EZ-Vol. 11 - 107 p.
39. මාලිංග අමරසිංහ - පොළොන්නරුවේ නවබුත් - පිටු 68. 2001 වර්ෂය, ගොඩගේ ප්‍රකාශක.
40. එස්. පරනවිතාන - පොළොන්නරු යුගය, පිටු. 87-88
41. එස්. පරනවිතාන - පොළොන්නරු යුගය, නෙළුම් පොකුණ හා කුමාර පොකුණ ඡායාරූප හැඳින්වීම් ද අයත් වේ.

# ආශ්‍රිත ග්‍රන්ථ


1. දේව මයිකල් සිල්වා - පනාකඩුව තඹ සන්නස - 2003 ස්වස්ති ප්‍රකාශකයෝ
2. සිරි නිස්සංක පෙරේරා - පනාකඩුව තඹ සන්නස පොත පිළිබඳව පිටු vii-xiv.
3. සෙනරත් පරණවිතාන - පොළොන්නරු යුගයේ කලාශිල්ප හා ගෘහනිර්මාණ ශිල්පය - පිටු 83 පොළොන්නරු යුගය - තිසර පොත් අංක 1.
4. සෙනරත් පරනවිතාන - පොළොන්නරු යුගය - තිසර පොත් - පිටු 90
5. සෙනරත් පරනවිතාන - පොළොන්නරු යුගය - පිටු 93-94
6. සෙනරත් පරනවිතාන - එම - පිටු 63.
7. මහාවංසය 73 පරි. 155 ගාථා.
8. සෙනරත් පරනවිතාන - පොළොන්නරු යුගය - පිටු 88.
9. සෙනරත් පරනවිතාන - එම - පිටු 88-89
10. චූලවංසය - ixxiii-124-135 ගාථා
11. චාල්ස් ගොඩකුඹුරේ - තිවංක පිළිමගෙයි බිතුසිතුවම් පිටු 4, 5, 1969 පුරාවිද්‍යා දෙපා.
12. සෙනරත් පරනවිතාන - පො.යු. පිටු 105.
13. චාල්ස් ගොඩකුඹුරේ - තිවංක බිතුසිතුවම් ග්‍රන්ථය. 5 a දේවාරාධනාව, 5 b දේවාරාධනය චිත්‍ර.
14. - එම - තිවංක බිතුසිතුවම් ග්‍රන්ථයේ, අසංකවතී ජාතකය - සිතුවම.
15. සිරි නිස්සංක පෙරේරා - බෞද්ධ සිතුවම් කලාව හා සිත්තරු පිටු 69, සංස්කෘතික ලිපි සංග්‍රහය - සං. දෙපා. 1995 සැප්.
16. සෙනරත් පරනවිතාන - පොළොන්නරු යුගය - පිටු 106.
17. සේනාක බණ්ඩාරනායක - චිත්‍ර සම්ප්‍රදායක පරිනාමය - පිටු 274, අපේ සංස්කෘතික උරුමය. ද්විතිය භාගය - 1998.
18. සෙනරත් පරනවිතාන - පොළොන්නරු යුගය - පිටු 101.
19. ඩී.ටී. දේවේන්ද්‍ර - පොළොන්නරුවේ ගල්විහාරයේ පිළිමය - පිටු 52-66, සඳකඩපහණ ග්‍රන්ථය - 1970 වසර - ගුණසේන ප්‍රකාශන.
20. සිරි නිස්සංක පෙරේරා - "ගල් විහාරයේ හිටි පිළිමය හා සැතපෙන පිළිමය දිවයින - 1992 මැයි 15.



ගල්විහාරයේ බුද්ධ ප්‍රතිමා



තිවංක ප්‍රතිමා ගෘහයේ දෙවියන් දක්වෙන සිතුවම්



ගල්විහාරයේ හිටිපිළිමය



පොළොන්නරුව වටදාගේ බුදු පිළිමය



ලංකාතිලක පිළිමගෙය



ගල්විහාරයේ වැඩහුන් සමාධි ප්‍රතිමාව



මහාපරාක්‍රමබාහු රජුගේ යයි සැළකෙන ප්‍රතිමාව -
පොත්ගුල්වෙහෙර



පොළොන්නරුවේ වටදාගෙය දෙරටුවේ - සඳකඩපහණ

කිරීම නිශ්ශංකමල්ල විසින් කරවනු ලැබ ඇති බැව් සනාථ වේ. පොළොන්නරු යුගය සමෘද්ධිමත් කරලීමට දායක වුණු නිශ්ශංකමල්ල රජතුමෝ ද වාරිකර්මාන්ත කරවා ආර්ථිකය ශක්තිමත් කරමින් පොළොන්නරුවේ ඉදි කරන ලද විශාලතම චෛත්‍ය "රංකොත් විහාරය" ඉදිකරවූ ය. චෛත්‍ය මළුවේ ඇති ශිලාලේඛනයකට අනුව මෙය මුල දී "රුවන්වැලිසෑය" නමින් හඳුන්වනු ලැබ ඇත.

නිශ්ශංකමල්ල රජතුමා විසින් කරවන ලද ශ්‍රී ලංකාවේ විශාලතම ශිලාලේඛනය වන "ගල්පොත ලිපිය" පේළි හැත්තෑ දෙකකින් ද හාරදස් තුන්සියයකට වඩා අක්ෂර ගණනකින් ද යුතු සංස්කෘත මිශ්‍ර කාව්‍යමය භාෂා ශෛලියෙන් යුතු ලේඛනයකි.[39]

නිශ්ශංකමල්ල රජු විසින් ඉදිකරන ලද පොළොන්නරුවේ සත්මහල් ප්‍රාසාදය අෂ්ටාශ්‍රකාර හැඩයෙන් යුක්ත විය.[40] අනුරාධපුරයුගයේ නකා වෙහෙර, ඉදිකටු සෑය මේ වර්ගයේ අයත් ගෘහනිර්මාණ ශිල්ප කෘති ලෙස සැලැකේ. කාම්බෝජයේ මේ හා සමාන ගොඩනැගිලි ඇති බවට මතයක් ඇත.

පරිසරය ශෝභාවත් කරලීමට පොළොන්නරු යුගයේ කලාශිල්පාචාරීන් මෙන් ම වාස්තු විද්‍යාඥයින් ඉමහත් ප්‍රයත්නයක් දරා ඇති අතර එහි ප්‍රතිඵල පොකුණු නිර්මාණ මගින් ප්‍රකට වී ඇත. එයට කදිම නිදර්ශනය වනුයේ තිවංක ප්‍රතිමාගෘහය සමීපයේ ස්ථාපිත කර ඇති ගලින් නිර්මාණය කර ඇති "නෙලුම් මලක් පිපී තිබෙන ආකාරයෙන් පෙති විහිදී තිබෙන ආකාරය දක්වන පොකුණ ය. මෙම නෙලුම් පොකුණ I පරාක්‍රමබාහු රජුගේ කාලයේ නිමාවූවක් ලෙස පිළිගැනේ. ජේතවන පෙදෙසෙහි පිහිටුවා ඇති "නෙලුම් පොකුණ" ගලින් නෙළූ කාව්‍යයක් වැනි ය යි ද, එය පෙනි අටකින් යුත් පිපුණු නෙලුම් විලක හැඩගත් කලාත්මක නිර්මාණයක් බව ද සෙනරත් පරණවිතාන පවසා ඇත.

I පරාක්‍රමබාහු රජු ගේ මාලිගය අසළ උයනෙහි තනවා ඇති කුමාර පොකුණ (ශිලාපොක්ඛරණී) හැම විට ම I පරාක්‍රමබාහු රජු ගේ සිත දිනාගත් නිර්මාණයක් ලෙස සඳහන් වේ. මෙය නෙලුම් පොකුණට ද වඩා ව්‍යාහාර කලාත්මක අංශවලින් සම්පූර්ණ වී ඇති ප්‍රමාණයෙන් ද විශාල වූ නිර්මාණයකි. පරණවිතාන මෙම පොකුණු දෙක කලාත්මක අංගවලින් පරිපූර්ණ වූ ඒවා ලෙස අගය කර ඇත.[41]

ශිල්පාචාරී පරපුර පොළොන්නරු යුගයෙහි මෙවන් අද්විතීය දක්ෂතා ප්‍රකට කරවන මූර්ති ඉදිරිපත් කරලීම ජාතිකාභිමානය සඳහා ඉවහල් වන බව සඳහන් කළ යුතු කරුණකි.

ලංකාවේ රාජකීයයන් බලපරාක්‍රමයෙන් සිංහාසනාරූඪ ව, පරිහරණය කළ සිංහාසනයන් පිළිබඳ වංසකථා හා සෙල්ලිපිවල ද සඳහන් වේ. නිශ්ශංකමල්ල රජු පොළොන්නරුවේ තම රාජ මන්දිර භූමි සංකීර්ණයෙහි නැගෙනහිර භාගයෙහි පිහිට වූ මේ සිත් ඇදගන්නා වූ "වැටුම් මඩුව" හෙවත් "මඟුල් මඩුව" උස් වූ වේදිකාවක කණුපේළි සමඟින් ඉදිකර ඇත. නිශ්ශංක මල්ල රජතුමා අසුන්ගත් සිංහාසනය වූයේ, ඉතා විශාල අභිමානවත් ශෛලමය සිංහ රූපයකි.[37] අදත් අපහට මේ සිංහරූපය එකී ස්ථානයෙහි තිබෙනු දක්නට ලැබේ. මෙය නිශ්ශංකමල්ල නරේන්ද්‍රයාණන් ගේ සිංහාසනය ලෙස පරිභෝග කර ඇති බව සෙනරත් පරණවිතාන පවසා ඇත. සිංහරූපය පහතින් මෙලෙස සඳහන් වේ. "ශ්‍රී වීරධීර රාජ වෛශ්‍යභුජංග නිශ්ශංක ලංකේශ්වර කාලිංග චක්‍රවර්ති නිරිඳුන් වැඩහුන් වීරසිංහාසනය යි" යන අර්ථ ගැන්වෙන පාඨය එහි ලියැවී ඇත. රජතුමා මෙහි සිංහාසනාරූඪ ව වැඩ හිඳින විට, එකී රාජසභාවේ ම අසුන් ගන්නා ඇමතිවරු ප්‍රභූන් ද අසුන්ගෙන සිටි අතර ඔවුන් ගේ අසුන්හි තනතුරු නාමයන් ද ශෛලමය වශයෙන් සඳහන් කොට දක්වා ඇත. නිශ්ශංකමල්ල රජු තම සෙල්ලිපියේ මෙසේ ද සඳහන් කර ඇත. "දළදගෙය, වටදගෙය, නිශ්ශංක ලතා මණ්ඩපය දෙරටු පවුරු බැඳිවන්ට සිත් සතුටුවූත් සවගග මෝක්ෂ වන නියායෙන් කරවා"[38] ඔහු කරවූ වාස්තු විද්‍යා කලා එමගින් ප්‍රකට වේ. නිශ්ශංකමල්ල රජතුමා දළඳ මළුව අලංකාර ව ටැම් සහිත ව කළ මණ්ඩපය "නිශ්ශංක ලතා මණ්ඩපයේත් සත්මහල් ප්‍රාසාදය අසල ඇති ගොඩනැගිල්ලේත් ගල්කණු සිංහල ගෘහනිර්මාණ ශිල්පීන් ගේ විශිෂ්ට කෘතීන් බව ය. මේවායෙහි සියුම් කැටයම් ඇතුළත් වේ.

දළඳ මළුවේ අටදගෙ මෙන් ම ගල්පොත ශිලා ලේඛනයට ද මැදි ව වටදගෙයි ඉදිරිපසින් නිශ්ශංකමල්ල ගොඩනැංවූ ගොඩනැගිල්ල "හැටදගේ" නමින් හැඳින්වේ. පරාක්‍රමබාහු රජු ඉදි කළ වටදගේ සඳහා ප්‍රතිසංස්කරණ හා නව කලාත්මක අංග ඇතුළත්

මකර රූපය නැතහොත් ගජසිංහ රූපය යොදා තිබෙන බව කිරිවෙහෙර, ලංකාතිලක, වටදාගෙය, බද්ධසීමා ප්‍රාසාදය යන ස්ථානයන්හි විසිතුරු කොරවක්තල් මගින් පෙනෙන්නට ඇත.[31]

පොළොන්නරුවේ පොත්ගුල්වෙහෙර නමින් හැඳින්වෙන ස්ථානයට උතුරින්, වැව් බැම්මේ එක් කෙළවරක පිහිටි ගලෙහි අඩි 11 අඟල් 2 ක් උසැති මනා ව වැඩුණු ශරීරයකින් යුතු මහේශාක්‍ය පුද්ගලයකු ගේ රූපයක් විශිෂ්ට ලෙස මූර්තිමත් කර ඇත. පුරාණයෙහි පොළොන්නරුවට 'පුලතිසි පුරය' කියා නමක් තිබුණ බවට ජනප්‍රවාදයක් තිබේ. එයට හේතුව පුලතිසි නම් සෘෂි වරයකු නිසා මේ නම ඇති වන්නට ඇතැ යි විශ්වාසයක් තිබීම යි.[32]
"මේ රූපය සම්බන්ධයෙන් විශේෂඥයෝ විවිධ මත පළකරන අතර එය 'කපිල සෘෂි' ලෙස ද, 'අගස්ති' ලෙස ද, 'මහාපරාක්‍රම' හෝ (වෙනත් රජකු) වශයෙන් ද" සෘෂිවරයෙකු වශයෙන් ද හඳුන්වා දී ඇත. කැටයම් කර තිබෙන රූපය විශිෂ්ට නිර්මාණයකි."[33]

සෙනරත් පරණවිතාන තව දුරටත් පවසන්නේ, මේ පැරකුම් රූපය රජ රූපයක් බවත් අතේ දක්වන දෙය විය ගහක් බවත් ය. විය ගහෙන් දක්වෙන්නේ සේ රජධූරයේ සංකේතය බවය. ඩී.ටී. දේවේන්ද්‍ර[34] තව දුරටත් පවසන්නේ මේ විශිෂ්ට ප්‍රතිමාව සෘෂිවරයකු ගේ නැතිනම් තවුසකු ගේ පිළිරුවක් බව ය.

"මේ රූපය මහේශාක්‍ය අධීන විලාසයෙන් ද ඉන් පළ වන තේජෝබල පරාක්‍රමපූර්ණ අභීත භාවයෙන් හා මේ ගුණාංගයන් පිළිඹිබු කිරීමට යොදගෙන ඇති සකසුරුවමින් ද ප්‍රවීණත්වයෙන් පරතෙරට ගිය මනා ශිල්පාචාරියක ගේ කෘතියක් බව පැහැදිලි වෙයි." යනුවෙන් සෙනරත් පරනවිතාන මේ ප්‍රතිමාව පිළිබඳ ව අදහස් පළ කර ඇත.[35] හෙතෙම තව දුරටත් මෙය හඳුන්වා ඇත්තේ මහාපරාක්‍රමබාහු මහරජු ගේ යැ යි විශ්වාස කරනු ලබන සුවිසාල ගල් රුව යි "යනුවෙනි. මේ ප්‍රතිමාවෙන් පිළිඹිබු කෙරෙනුයේ අවිරෝධිතාව සහ නිෂ්කණ්ටක රාජ්‍යානුශාසනය ද පිළිබඳ කාර්ය භාරය මූර්තිමත් කෙරෙන රාජ ධූරය බැව්," එතුමන් තව දුරටත් අදහස් දක්වා ඇත.[36] අනුරාධපුර යුගයේ සිට පැවත ආ මූර්ති චිත්‍ර

ශෛලියෙන් යුතු දළද මැදුර[27] පොළොන්නරු වටදගෙයට ඇතුළත් අංගයන් හා කලාත්මක වූ ගැළපීමක් පෙනෙන්ට ඇත. කුඩා ස්තූපයක් මැදිකොට ගොඩනැංවුණු වටකුරු දගේ වාස්තුවිද්‍යාත්මක ව පොළොන්නරු වටදගේ සංකීර්ණයට අඩංගු වන්නේ ය. ස්තූපය මැදි කොට දගෙය ඉදිකර ඇති අතර, ස්තූපයෙන් දූනට දක්නට ඇත්තේ කොටසක් පමණි. මේ ස්තූපය වටා සතර දෙසට මුහුණලා බුදුපිළිම සතරක් ස්ථාපනය වී ඇත. මේ බුදුපිළිමවල හිස් මුඩු කොට සිවුරු රැලි නොමැති ව දක්වා ඇති අතර, උතුරු දඹදිව "වමන්කුආ" ස්ථානයෙන් සොයාගත් බුදුපිළිමවලට ඒවායෙන් සමානත්වයක් ඇති බැව් පළ වේ.[28] ඒ අනුව වටදගෙයි ස්තූපය වටා ඇති බුදුපිළිම නිර්මාණය කෙරෙහි භාරතීය ආභාසයක් ඇති වූවා වත් ද යි ප්‍රශ්නාර්ථයක් ඇතිවේ.

පොළොන්නරුවේ ඇති හොඳ ම සඳකඩපහණ නම් වටදගේ දොරටුවෙහි ස්ථාපනය කර ඇති කලාකෘති බැව් පරණවිතාන සඳහන් කර ඇත. අනුරාධපුර යුගයේ සඳකඩපහන්වල ඇත්, අස්, සිංහ, ගව ආදී සතුන් යොදගෙන තිබුණත්, පොළොන්නරු යුගයේ සඳකඩපහණ්වල ඉහත කී සතුන් අතරින් ගවරූපය ඉවත් කොට ඒ වෙනුවට වෙනත් මල් ලියකම් ඇතුළත් කරනු ලැබී ය. පොළොන්නරු යුගයේ ඉතා ම පියකරු සඳකඩපහණක් දක්නට ඇත්තේ වටදගෙට ඇතුළු වන උතුරු දොරටුවෙහි ය.[29] පරණවිතාන පොළොන්නරුවේ මුරගල් පිළිබඳ ව ද මෙවන් අර්ථාන්විත නිගමනයක් ලබාදී තිබේ. "පොළොන්නරුවේ පිහිටි මුරගල් අතුරින් වටදගේ නැගෙනහිර දොරටුවේ පියගැටපෙළ දෙපස ඇති මුරගල් දෙක ඉදිරියේ කලා කුශලත්වය අතින් සෙසු හැම මුරගලක් ම පසුබා සිටී.[30] මුරගලෙහි නාරජුන් නිර්මාණය කර ඇති සුලලිත ස්වභාවය - පැළඳ සිටින ආභරණ හා ඇඳුම් ආයිත්තම්, නාරජු ගේ මුවින් පළවන කුළුණුබර ගතියත් නිසා මේ මුරගල අනුරාධපුර රත්නප්‍රාසාදයෙහි ස්ථාපිත ව ඇති ලංකාවේ අතිශ්‍රේෂ්ඨ මුරගල ලක්ෂණ තරම් ම අගය කළ හැකි කෘතියක් ලෙස මහැදුරුතුමන් ඒ පිළිබඳ ව හඳුන්වාදීමේ දී ප්‍රකාශ කර ඇත.

පොළොන්නරු යුගයේ කොරවක්ගල් අලංකාර කරලීම සඳහා

වත් සිතිය නොහැකි බව චාල්ස්[23] ගොඩකුඹුරේ ගේ මතය වේ. රවුම් කොට්ටයේ කෙළවර පිපුණු නෙලුම් මලක හැඩය ගෙන ඇත. සැතපෙන පිළිමය ද බොහෝ උගතුන් ගේ මතවාදයට ලක් වූවකි. හිටි පිළිමය ආනන්ද හිමිගේ යැ යන අදහසින්, විදේශීය සරසවි මහාචාර්යවරුන් පවා කම මතය ස්ථිර කරමින් පවසන්නේ සැතපෙන බුදුපිළිමයෙන් බුද්ධ පරිනිර්වාණය පෙන්නුම් කරන බවය. මේ සැතපෙන ප්‍රතිමාවේ සිරිපතුල් එකකට වඩා අනෙක, මදක් ඉදිරියට තබා සිටින ආකාරය එම ස්ථානයේ දී ම ප්‍රත්‍යක්ෂ ලෙස පැහැදිලි කරමින් වික්‍රමගමගේ අප වෙත පවසා සිටියේ, මෙය සැබෑ ලෙස ම සැතපෙන පිළිමයක් බව යි. සිරිපතුල් එකට තබා ගැනීමෙන් එකිනෙක ගැටී වේදනාවක් ඇති වන නිසා, එක් පාදයක් මදක් ඉදිරියෙන් තබා ඇති බව යි. මේ අදහස අප කා හටත් තර්කානුකූල ව ප්‍රත්‍යක්ෂ ව අවබෝධ කොට ගනිමින් එකඟ විය හැක. ඒ අනුව බුදුපිළිමයක සිරිපතුල් එකක් උඩ එකක් තබාගනිමින් පාදයන්හි ඇඟිලි හරි කෙළින් තබාගෙන ඇති අවස්ථාව දක්වෙන ප්‍රතිමාවේ නම්, එකී ප්‍රතිමා පිරිනිවන් මංචකය ලෙස හැඳින්වීම සුදුසු ය. පෙරකී පරිදි ගල්විහාර ප්‍රතිමාව පිරිනිවන් මඤ්ච වර්ගයට අයත් නොවන බව ඒ අනුව ප්‍රකට වන කරුණක් වේ.[24]

පොළොන්නරු යුගයේ වටදාගෙය වැදගත් කලා අංගයක් වේ. පරණවිතාන[25] පවසා සිටින්නේ පොළොන්නරු වටදාගෙය සුවිසිතුරු කැටයමින් පරිපූර්ණ වී ඇති බවය. මේ ගොඩනැගිල්ල චේතියගිරි නම් ගොඩනැගිලි වර්ගයෙහි උසස් ම විකාශනය පිළිඹිබු කරන බවත් මෙහෙතෙම පවසයි. පොළොන්නරුව දළදා මළුවේ ඇති අද්විතීය ස්ථානයක් ඉසුලූ මෙම වටදාගෙය I පරාක්‍රමබාහු රජු ගේ කෘතියක් බව එච්.සී.පී. බෙල් ගේ අදහස වේ.[26] නිශ්ශංකමල්ල රජු ගේ "දළදා මළුව සෙල්ලිපිය" අනුව ලක්විජය සිඟු සෙනෙවි තාවුරුනාවන් විසින් මෙය කරවනු ලැබ ඇත. පූජාවලිය, රාජවලිය අනුව නම් මෙය නිශ්ශංකමල්ල රජු ගේ කෘතියකි. එහෙත් සිදු වී ඇත්තේ - නිශ්ශංකමල්ල රජු විසින් වටදාගෙය සඳහා නවාංග ඇතුළත් කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම විය හැක.

මහාවංසයෙහි සඳහන් පරාක්‍රමබාහු රජු කරවූ වටකුරු

කලුගල් කුළක නෙළා ඇති ගල්විහාරය ය යි සුපතළ මේ කලා සංකීර්ණය පුරාණයේ දී උත්තරාරාමය යන නමින් ද හැඳින්විණි. පොළොන්නරු ගුරුකුලයට අයත් ඉතා ම ව්‍යක්ත නිරූපණයන් සමහරක් දක්නට ඇත්තේ කතින ලද විහාරයක් වන ගල්විහාරයෙහි බැව් සේනක බණ්ඩාරනායක[17] පවසා ඇත. ගල්විහාර සංකීර්ණයේ ඇති බුද්ධ ප්‍රතිමා සතර උගතුන් අතර විවිධ මත සංවාදයනට පවා පාත්‍ර වුණු බෞද්ධාගමික කේන්ද්‍ර ස්ථානයක් ද වන්නේ ය.[18] සෙනරත් පරණවිතාන පවසන්නේ "අනුරපුර සමාධි ප්‍රතිමාව හා සසඳා බලන විට අධ්‍යාත්මික ගුණය පළ කිරීම අතින් මේ බුදුපිළිම ඊට අඩු තලයක පවත්නේ ය. එහෙත් ඉඳුරන් දිනාගැනීමෙන් අත්පත් කරගන්නා ලද ලෝකෝත්තර ප්‍රතිඵලය වන සවිසතුන් වෙත පතළ මහමෙතක් ශිල්පියා විසින් ඉතා දක්ෂ ලෙස පිළිඹිබු කොට තිබේ" යනුවෙනි.

නෙලුම් මලක් මත, දෑත් සිරස් අතට පපුව මත තබාගෙන වැඩ සිටින ප්‍රතිමාව ආනන්ද හිමි ගේ විය යුතු ය යි ඩී.ටී. දේවේන්ද්‍ර සිය ග්‍රන්ථයෙහි සඳහන් කොට දක්වා ඇත.[19] නෙලුම් මලක් මත වැඩ සිටින බැවින්, එය බුදුන් වහන්සේ ගේ බුදු පිළිමයක් ම බැව් චන්ද්‍රා වික්‍රමගමගේ පවසා ඇත.[20]

පොළොන්නරුව ගල්විහාරයේ ඇති සිංහල කලා කරුවන් ගේ විශිෂ්ට නිර්මාණයක් වූ පෙර කී හිටි බුදු පිළිමය "ආභංග" ගණයට අයත් වන බැව් වික්‍රමගමගේ[21] ගේ අදහස වේ. "සිංහල බෞද්ධයෝ බුදුපිළිමවලට පුදපූජා සිදු කර ඇත්තේත්, තවමත් කරන්නේත් ජීවමාන බුදුන්වහන්සේට කරන පුදපූජා වශයෙන් සිතාගෙන ය." ගල්විහාරයේ විජ්ජාධර ගුහාව. මෙය නරඹන්නා ගේ වම්පස කොණේ ගුහාව යි. බුදුපිළිම පහකින් යුත් ධ්‍යානි බුද්ධ මණ්ඩලය දැක්වෙන ස්ථානයක් ලෙස ද මේ ස්ථානය හැඳින්වේ. ගල්විහාරයේ සැතපෙන බුද්ධ ප්‍රතිමාව[22] ලෙස හඳුන්වන මේ සඳහා වෙන ම පිළිම ගෙයක් තිබුණු බව අනාවරණය වේ. මේ ප්‍රතිමාවේ සිරිපතුල්වල පද්ම සංකේත ඇති අතර, සිවුරුරැලි ශරීරයට ඇලෙන සේ තාත්ත්වික ව නෙළා ඇත. පිළිමය හොවා ඇති කොට්ටයට බුදුන්වහන්සේ ගේ හිස එබී ඇත්තේ හරියට ම පුළුන් පිරවූ කොට්ටයක් ලෙස පෙනෙන ආකාරයෙන් වන අතර එය කලුගලක් ලෙස කෙසේ

කෞශල්‍යය අතිමහත් ය. මේ සිතුවම් කරණය ටෙම්පරා ක්‍රමයට වියලි බදාමයේ රතු, කහ, කොළ පාට උපයෝගීත්වයෙන් සිදු කර ඇත. රූප නිර්මාණය කිරීමේ දී චිත්‍රශිල්පීන් ගේ රේඛා මාධුර්ය පිළිබඳ දැනුම බෙහෙවින් ම උපයෝගී වී ඇත. තිවංක ප්‍රතිමා ගෘහයේ ගන්ධ කුටියේ චිත්‍රවලින් බුද්ධ චරිතය පිළිබඳ අවස්ථාවන් ද, අන්තරාලය කොටස ජාතක කථා සිතුවම්වලින් අලංකාරවත් කරලීමට ද සිත්තරුන් සමත්කම් පා ඇත. පරණවිතාන පවසන්නේ ''තිවංක'' බිතුසිතුවම් කළ සිත්තර ආචාරීන් පිළිබඳ මෙවන් අදහසකි.

"පොළොන්නරු සිත්තරු ද රචනය තුලනය කරලීමෙහි සමර්ථයන් වූහ. ඔව්හු රේඛා සුන්දරත්වයෙන් පිරිපුන් කෘති කළහ. මහේශාක්‍ය ලීලෝපේත භාවයෙන් සැදිගත් රූප ඇන්දහ."[12]

තිවංක ප්‍රතිමාගෘහයේ සිතුවම් අතර දේවාරාධනා සිතුවම් විමර්ශනාත්මක ව නැරඹීමේ දී[13] ඒවා අජන්තා බිතුසිතුවම් මෙන් උසස් සෞන්දර්යාත්මක බවක් ප්‍රකට කරයි.

මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ පොළොන්නරුවේ තිවංක ප්‍රතිමා ගෘහයේ - අසංකවතී ජාතකය[14] දැක්වෙන චිත්‍රයෙන් මෙවන් අර්ථකථනයක් දී තිබේ.[15] "පොළොන්නරුවේ තිවංක පිළිමගෙයි ඇති අසංකවතී ජාතකය දැක්වෙන චිත්‍රයෙන් ශෘංගාර රසය දැන්වෙන්නේ ය. එය ප්‍රේම කථාවකි එනිසා ශෘංගාරය බුද්ධාගමට නොගැළපෙන්නක් ලෙස කිව නොහැක. නන්ද කුමරා හා ජනපද කල්‍යාණිය ගේ කථාව එම රසයෙන් ම පිරිපුන් කථාවස්තූන් ය. කුස ජාතකය ප්‍රේම කථාවකි. මෙවන් ජාතක කථා බුදු සිරිත කියවීමේ දී අප ලබන රසාස්වාදය සුවිශේෂ චිත්‍ර ශිල්පාචාරීන් ගේ බිතුසිතුවම් තුළින් අපට රසාස්වාදයක් මෙන්ම ආධ්‍යාත්මික සුවයක් ද ලබාගත හැක්කේ ම ය." සෙනරත් පරණවිතාන සිත්තරා පිළිබඳ මෙවන් හැඳින්වීමක් දක්වා ඇත.[16] "සිත්තරා ගේ ද අරමුණ වනුයේ නරඹන්නා ගේ සිතේ රස යනුවෙන් හැඳින්වෙන උද්වේගකාවස්ථාවක් ඇති කරලීම යි.

මහාපරාක්‍රමබාහු රාජ්‍ය සමයෙහි පොළොන්නරුවෙහි

සහිත ව නිර්මාණය වී තිබේ. බොකුවහල ගෙඩිගේ ගොඩනැගිලිවලට අයත් වේ. මේ බොකුවහල සහිත වූ වාස්තුවිද්‍යා ක්‍රමය දකුණු ඉන්දීය ද්‍රවිඩ ගොඩනැගිලි ක්‍රමයකින් අභාසය ලැබූවක් නොවන්නේ ය. එක අතෙකින් එය ලංකාවේ පුරාතන ශිල්පීන් අනුගමනය කළ ගෘහනිර්මාණ ශිල්ප ක්‍රමයක් වන්නේ ය. ගෙඩිගේ නමින් හඳුන්වන ගඩොළු ගොඩනැගිල්ලත්, අනුරපුර ජේතවන දා ගැබට බටහිර පිළිම ගෙයත් ඊට සාක්ෂි දරන බව පරනවිතාන මතය වේ. තව දුරටත් එතුමා මෙසේ ද අදහස් පළකර ඇත. "පොළොන්නරුවේ පිහිටි මෙම බොකුටගල සහිත ගඩොළු ගොඩනැගිලි අනුරාධපුරයේ පිහිටි ඒවායේ පූර්වාකෘති ද පාලියෙහි 'ගිඤ්ජකාවසථ' නමින් හැඳින්වෙන ගොඩනැගිලි වර්ගයෙන් පැවත ආ ඒවා ය."[8]

ථූපාරාමය නම් වූ සම්පූර්ණ ගඩොලින් තැනූ ගෙඩිගේ සම්ප්‍රදායට අයත් ප්‍රතිමාගෘහය I පරාක්‍රමබාහු රාජ්‍ය සමයට අයත් වන අතර, දැනට ද තරමක් දුරට ආරක්ෂා වී ඇති ගොඩනැගිල්ලකි. ඝනකමින් යුත් බිත්තිවලින් ගොඩනැගී ඇති මෙහි බොකුවහල ද බොහෝ දුරට හොඳින් පවතී. පරාක්‍රමබාහු රජු ගේ අමාත්‍ය මහින්ද දළදාව තැන්පත්[9] කරලීමට කළ විහාරය මෙය ය යි අදහස් කරලීමට ද පිළිවන. මෙම ප්‍රතිමා නිමා වී ඇති අතර, තවත් හිටි-හිඳි බුදුපිළිම ද එහි දක්නට ලැබේ. හුණුගලින් කරන ලද ඒ පිළිම පුරාතන කාලයකට අයත් ඒවා ලෙස වත්මන් උගත්හු අනුමාන කරති.

I වන පරාක්‍රමබාහු රජු කරවූ තිවංක ප්‍රතිමාගෘහය නොහොත් අතීත ජේතවනාරාමය ශාරිපුත්‍ර නම් ස්ථවිර නමකට පූජා කළ බව චූලවංසයේ[10] සඳහන් වේ. ගෙඩිගේ සම්ප්‍රදාය අනුව බොකුවහල සහිත ව ගොඩනැගූ මෙහි බුදුපිළිමය තිවංක ඉරියව්වෙන් වැඩ සිටීම නම් වූ විශේෂ ඉරියව්ව නිසා අනෙකුත් පිළිම අතර කැපී පෙනෙන බවක් පෙනේ. තිවංක ප්‍රතිමා ගෘහය, ගර්භ ගෘහය, අන්තරාලය සහ මණ්ඩපය යන කොටස් තුනකින් සහ මහල් කිහිපයකින් ද සමන්විත වී ඇත.[11]

ලාංකික බිතුසිතුවම් කලාවේ වැදගත් ව ස්ථානයක් ගන්නා තිවංක පිළිමගෙයි සිතුවම් ඉදිරිපත් කළ ශිල්පීන් ගේ සෞන්දර්යාත්මක

ගොඩනගා ඇති විශිෂ්ට කලාත්මක ගෘහනිර්මාණයන්හි නෂ්ටාවශේෂ නැරඹීමේ දී සිතෙහි සැබවින් ම ඇති වන්නේ අභිමන් හැඟීම් බව අමුතුවෙන් සඳහන් කළ යුතු නැත. මෙකී නටඹුන් වැඩි කොටසකින් ම ප්‍රකට වන්නේ එතුමන් තුළ පැවති අද්විතීය කලා කෞශල්‍යය සෘජු නායකත්වය තුළින් කටයුතු සංවිධානය කිරීමේ සැබෑ ප්‍රතිඵල ප්‍රකට කරවන බව ය. ඒ මහා නරවිරුවාණන් ගේ යශෝරාවය පැතිරයාමට හේතුවුණු කරුණු රාශියක් එදවස ක්‍රියාත්මක විය.

I මහා පරාක්‍රමබාහු රජු පොළොන්නරුවේ ඉදි කරවූ විශාලතම පිළිම ගෙයක් වශයෙන් 'ලංකාතිලකය' සඳහන් කළ හැක. ආලාහන පිරිවෙන් සංකීර්ණයෙහි ගොඩනංවා ඇති පස්මහල් ගොඩනැගිල්ලක් වූ මෙහි දේවබ්‍රහ්ම රූප ද, කූටාගාර ගුහා, ගර්භශාලා, මන්දිරය තුළ ලංකාතිලක නම් හිටිපිළිමයක් තිබුණු බවත් මහාවංසයෙහි සඳහන් වේ. දැනට මෙය අඩි 60 ක් පමණ උස් වූ ගොඩනැගිල්ලක් වන අතර කලකට පෙර මෙය අඩි 100 ක් පමණ උස් ව තිබුණු බව ලේඛනවලින් පෙනේ.[7]

ලංකාතිලකය ඇතුළත හා පිටත නිර්මාණ වුණු සිතුවම් පොළොන්නරු යුගයේ සිතුවම් අතර විශිෂ්ට තත්ත්වයක පැවැති බැව් ශේෂ ව ඇති චිත්‍ර කොටස්වල වර්ණපදාස මගින් ප්‍රකාශිත වේ. මේ ගොඩනැගිල්ල තුළ නිම කරවා තිබුණු පද්මාසනයක් මත වූ අභිමානවත් උස් වූ බුදුපිළිමය පිටතට පෙනෙන ආකාරයෙන් දැවැන්ත උළුවස්ස නිමකරවා තිබිණ. ලංකාතිලකයේ පිටත බිත්ති දෙව්වරුන්, මිථුන රූප, හංස වාමන රූප හා සිංහරූපවලින් සෞන්දර්ය බව මෙන් ම විචිත්‍ර බව කියා පාන්නේ ය. මෙහි ප්‍රධාන ගෘහයට පිවිසෙන ස්ථානයෙහි මුරගල්, කොරවක්ගල් හා සඳකඩපහන් පෙනෙන්නට ඇත. කොරවක්ගල් පිළිබඳ ව පැවසීමේ දී ඒවා ඉතා උසස් නිමාවෙන් යුක්ත වන අතර ඇතුළු පැත්තෙහි නාගරාජිනී රූප මනා ලෙස දක්වා ඇත. පිළිමගෙය ඉදිරිපස හේවිසි මණ්ඩපයක් තිබෙන්නට ඇතැ යි සිතෙන අතර, ඉතිරි වී ඇති ගල් කුළුණු මුදුහුණ පිපුණ නෙලුම් මල් ලෙස ද, පාමුල මල් රටාවලින් ද කැටයම් කොට ඇත.

ලංකාතිලකය හා ථූපාරාමය යන ප්‍රතිමා ගෘහ බොකුවහල

කරවා පිරිසුදු සඟ සසුනක් ස්ථාපිත කරවී ය. උගුන්ට ප්‍රවීණයනට අනුග්‍රහ ලබාදෙමින් සිංහල භාෂා සාහිත්‍ය කටයුතු ද, කලාශිල්ප කටයුතු ද නංවාලීමට ප්‍රයත්න දැරුවේ ය. මෙහෙතම පළමු කොට 'අටදාගෙය' නමින් හැඳින්වෙන 'දළදා මැඳුර' ගෘහනිර්මාණ කලාශිල්පීන් ලවා නිර්මාණය කරවී ය. මෙකල වේලයික්කාරයින් ගේ බලය පැතිරී තිබුණු අතර, තවත් අතෙකින් රජු ඔවුන් ගේ විශ්වාසය පූර්ණ වශයෙන් ලබාගෙන සිටියේ ය. රජු තමා ඇවෑමෙන් දළදා මැඳුරේ රැකවරණ සැලැසීමට ද ඔවුනට බලය පැවරිණි.[6]

විජයබාහු රජු ගේ අභාවයත් සමග ඔහු විසින් බොහෝ පරිශ්‍රමයක් දරා ඇති කරන ලද රටේ සමෘද්ධිමත් බව රාජ්‍ය උරුම කරගැනීමේ ප්‍රයත්න දැරුවන් නිසා වසර හතළිහක් පමණ කාලයක් සිංහල ශිල්ප කලාවන් ගේ දියුණුවට බාධා ඇති විය. මේ දේශපාලන බලධාරීන් රාජාඥා පවා දෙමළ භාෂාවෙන් නිකුත් කරවීම හානිදායක කරුණක් විය.

I වන පරාක්‍රමබාහු නරවිරුවාණන් ගේ රාජ්‍යපාලන සමයේ දී (1153-1186) මෙහෙතම මුළු දිවයිනට ම ඒක ස්වාමි විය. එතුමන් සම්පස්ථ මහාද්වීපයේ කටයුතුවලට සම්බන්ධ වීමට තරම් බලගතු බවක් පෙන්වූ පාලකයෙක් විය. ඔහු විසින් පාලන න්‍යාය සකස් කරනු ලැබුවේ දේශීය සම්පත්වලින් උපරිම ඵලනෙලාගත හැකි වන ආකාරයෙනි. අහසින් වැටෙන එක ජල බිංදුවක් වත් මිනිසා ගේ ප්‍රයෝජනයට නොලබා මුහුදට ගලායාම බලයත් අපරාධයක් කොට සැලැකූ ඔහු ගේ මේ ජලසංරක්ෂණ මහා ප්‍රතිපත්තිය නිසා සාගරය බඳු වූ 'මහපැරකුම් සමුද්‍රය' වැනි යෝධ වැව් ඇළ දෙළ නිර්මාණය වී විශාල වශයෙන් සහල් නිෂ්පාදනය වී ආසියාවේ ධාන්‍යාගාරය බවට ද ලංකාව පත් විය. ආර්ථික නවෝදයක් ඇති කළා මෙන් ම මෙරට ආගමික, සංස්කෘතික, කලාත්මක අභිමානවත් යුගයකට ද ප්‍රවේශ කරවී ය.

මහාවංසයෙහි පරිච්ඡේද දෙකක් ම මහාපරාක්‍රමබාහු රජු ගේ ගෘහනිර්මාණ, වාස්තුවිද්‍යා කලා කටයුතු විස්තර කරලීමට වෙන් වී ඇත. අද පවා පොළොන්නරුවෙහි සංචාරය කරන්නාකුට මෙතුමන්

රාශියකින් සමන්විත විය. රාජමන්දිර භූමියේ නැගනහිරින් ඉදිකරවා ඇති මණ්ඩපයෙහි පාදම ඇත්-සිංහ හා නාගරූපලින් ඔපවත් කර ඇත.

චිත්‍ර කලාව පිළිබඳ ව කතා කිරීමේ දී අනුරපුර යුගයේ සිතුවම්වලින් තිබෙන තාත්ත්වික භාවය වෙනුවට කලාත්මක භාවයෙන් විසිතුරු සාධක මෙහි සිතුවම්හි ඇති බව උගතුන් ගේ අදහස වේ. අනුරාධපුර සමාධි පිළිමය, තොලුවිල පිළිමය බුදුන්වහන්සේ ගේ ආධ්‍යාත්මික ගුණය දක්වා ඇතත්, ගල්විහාරයේ ප්‍රතිමාවලින් පොළොන්නරු ශිල්පීන් ගේ සෞන්දර්යාත්මක කෞශල්‍යය ප්‍රකට වන බව පෙනේ. තිවංක පිළිමය තුළින් ශිල්පීන් ගේ නව දර්ශනාත්මක සිතිවිලි ප්‍රකාශ කොට ඇතැ යි සිතිය හැක. පොළොන්නරු යුගයේ ගොඩනැගිලි සැරසීම් කාර්යයේ දී අගනා රූකම්, කැටයම් හා මූර්ති නිර්මාණ උපයෝගී කොටගත් බවක් පෙනේ. ඒවා අනුරාධපුර යුගයේ කලාකෘතීන්ට බොහෝ දුරට සමාන වන අතර වෙනස්කම් දක්වන්නේ ස්වල්ප වශයෙනි. පොළොන්නරු යුගයේ ඇතැම් විශේෂිත ගොඩනැගිලි පියගැටපෙළ දෙපස නිර්මාණය කොට ඇති කොරවක්ගල්, මුරගල්, සඳකඩපහන් ඊට නිදසුන් කොට හැඳින්විය හැක. අනුරාධපුර යුගයේ කලාශිල්වල උත්කෘෂ්ට බවක් පෙනෙන නමුදු පොළොන්නරු යුගය පිළිබඳ කථා කිරීමේ දී අප සැලැකිල්ලක් දක්වන ඒ ඒ කලාකෘතීන් වෙතින් විචිත්‍රත්වයක් හා ප්‍රෞඪත්වයක් දැකිය හැකි ය.

I වන විජයබාහු 1056-1111 ලක්දිව සිංහල රාජ්‍යය සොළී බලවේගවලින් මුදලවාගෙන අනුරපුර දී අභිෂේකය පැවැත්වූවත් පොළොන්නරුව නගරය රාජධානිය කොටගනිමින් පාලන කටයුතු ගෙනගියේ ය. තමන් ගේ ඔටුනු පැළඳීමේ මංගල්‍යය සඳහා මෙහෙතෙම අනුරපුර රජමාලිගයක් ඉදි කරවී ය. විජයබාහු රජ වන විට ව්‍යසනයට මුහුණපා තිබුණු බුද්ධාගම හා ජනතා අයිතීන් යථාතත්ත්වයට පත්කිරීමේ අවශ්‍යතාව ගැන අවබෝධයෙන් සිටියේ ආක්‍රමණ හා අනුරාධපුර රාජ්‍යය සොළී ග්‍රහණයට යටත්වීම හේතු කොටගෙන ය. එබැවින් විජයබාහු ඒ වන විට සුභදත්වයෙන් කටයුතු කළ අරමණ දේශයෙන් (බුරුමයෙන්) උපසම්පදා භික්ෂූන් වහන්සේලා වැඩම

නැගී සිටින බුබ්බුලාකාර ගර්භයෙන් යුතු ආදී අනුරාධපුර ස්තූප කලාක්‍රමය අනුගමනය කරනු ලැබ ඇත.

මෙලෙස තුන්මහල් පේසාව මත ඉදිකොට අඩක් සම්පූර්ණ වුණු ගර්භය සහිත 'කොටවෙහෙර ආකෘතියට' අනුකූල ස්තූප ද මෙකල දක්නට ලැබේ. යටකී ස්තූපවලට සතර දොරටු සහිත ව වාහල්කඩ සතරක් ද ඇතුළත් වේ. අතීත වාහල්කඩ හුණුගලින් තැනුව ද මේවා ගඩොළින් නිමකරන ලද ප්‍රතිමාගෘහ ඇතුළත් කර ඇති අයුරු ද දක්නට ලැබේ. මෙකී පිළිමගෙවල් ඝනකම අධික වන ආකාරයෙන් හුණු බදාම සහිත ව ගෙඩිගේ සම්ප්‍රදාය අනුගමනය කරමින් උසින් හා විශාලත්වයෙන් වැඩි වන ආකාරයක් අනුගමනය කර ඇත. මේ ගොඩනැගිලි තුළ බිත්තිවල අගනා චිත්‍රසිතුවම් කර ඇති අතර පිටත බිත්ති විමානරූප, දේවරූප, වාමනරූපවලින් ඔපවත් කළ බවක් ද පෙනේ.

ස්තූප හා පිළිමගෙවල් ආශ්‍රිත ව පොළොන්නරු අවධියේ ඉදි කරන ලද සාරාම වෙසෙසින් සඳහන් කළ යුතු වන්නේය.[5] ආලාහන පිරිවෙන් සංකීර්ණයට ම ඇතුළත් බද්ධසීමාප්‍රාසාදය වැනි උපෝසථාගරයන් මෙන් ම දානශාලා, පුස්තකාලය හා තවත් ගොඩනැගිලි එහි ස්ථාපිත කර ඇති බැවිනි. ලංකාතිලකය කේන්ද්‍රගත කරගනිමින් මේ ගොඩනැගිලි සමූහය ඉදි කරලීමට සැලැසුම් කර ඇති බවක් පෙනේ. පොළොන්නරු අවධියේ මේ ගොඩනැගිලි ඉදි කරලීම සීමාසහිත පෙදෙසක සැලැසුම් සහගත ව කරවා ඇත. පරිසරය වඩාත් සුන්දර කරවීමට පොකුණු හා ජලතටාක සාදවා උයන්හි මල් හා තුරුලිය රෝපණය කරවා සොබාසිරිය වඩාත් සුමුදු කරවා ඇත.

වටදාගේ, අටදාගේ, හැටදාගේ වැනි නිර්මාණ ඉතා විශිෂ්ට කලා කෘතීන් ලෙස සැලැකේ. අනුරාධපුරයුගයේ කලාකෘතීන් හා සමාන කිරීමේ දී මෙවන් කලා නිර්මාණ තුළින් ශිල්පීන් ගේ විචිත්‍රවත් ඥානය කැපී-පෙනේ.

පොළොන්නරුවේ රාජමාලිගය මහල් ගණනාකින් හා කාමර

සාහිත්‍යයට පෙර තිබුණු තත්ත්වය මතින් ම සමෘද්ධිය ඇති කරගැනීම ඔහු ගේ අපේක්ෂාව විය.

පොළොන්නරු නෂ්ටාවශේෂ වෙත අප සිත යොමු කළ විට දක්නට ලැබෙන්නේ එහි පුරාවස්තු ගොඩනැගිලි, ස්තූප, චිත්‍ර, මූර්ති හා තවත් සාධක සමූහයක් ද වශයෙනි. මේ නිර්මාණයන් කිරීම, ඉදිකිරීම යන කාර්යයේ දී අනුරාධපුර යුගයේ දී අනුගමනය වුණු ක්‍රමවේද පොළොන්නරු යුගයේ දීත් අනුගමනය කර ඇති බවක් පෙනේ. අතීතයේ පටන් ප්‍රචලිත ව ක්‍රියාත්මක කාර්යයන්හි දී නිර්මාණ ඉදිරිපත් කළ කලාශිල්පාචාරීන් ගේ අනුග්‍රහය මෙකල දීත් නොමසුරු ව ලබාගෙන ඇති බව පෙනේ. එහෙත් පොළොන්නරු කලා නිර්මාණයන්හි අනුරාධපුර යුගයේ සමාන කාර්යයන් සිදු කළ ආකාරයේ වෙනසක් දක්නට ලැබේ. එනම්, අනුරපුර යුගයේ දී වැඩිවශයෙන් භාවිතා වූයේ ගල් ය. එහෙත් මෙකල ගල් වෙනුවට ගඩොල් කැට, ගල් කැට එකිනෙක සවිමත් කරලීමට හුණු බදාමක් උපයෝගී කොටගෙන ඇත. පොළොන්නරුවේ වාස්තුවිද්‍යාත්මක ගොඩනැගිලිකරණයේ දී බිත්ති ඝනකමට ඉහළට බැඳගෙන යාමටත්, ඹොකුවහල ක්‍රමය ආවරණ සඳහා යොදාගත් බවට ද සාධක හමු වී තිබේ.

ස්තූප නිර්මාණ විෂය පිළිබඳ ව සඳහන් කළ හොත් මෙම යුගයේ දීත් කලින් පැවති යුගයේ දී මෙන් ම චෛත්‍යවල ලොකු වෙනසක් දක්නට ලැබේ. එනම් අනුරාධපුර යුගයේ මෙන් අභස්කුස අරාගිය ස්තූප හෝ නිර්මාණ අංශයෙන් අගය කළ හැකි ස්තූප ඉදි වූ බවක් පෙනෙන්නට නැතැ යි ඇතැම් අය ගේ අදහසක් වේ. එහෙත් I පරාක්‍රමබාහු විසින් ඉදිකරවන ලද රූපවතී චෛත්‍යය යැ යි අදහස් කෙරෙන කිරිවෙහෙර තැනීමේ දී අනුගමනය කොටඇත්තේ පේසාවළලු තුනක් මත ඉදි වුණු බුබ්බුලාකාර වූ අනුරපුර සුවිසල් ස්තූප ක්‍රමය බැව් පෙනෙන්නට ඇත. එමෙන් ම පැරණි නාමය "රුවන්වැලි වෙහෙර" යනුවෙනුත් පසු ව "රන්කොත් වෙහෙර" ලෙස ද ප්‍රකට, ස්තූප රාජයා ගේ ආකෘතිය, දසවන සියවසේ දී වෙනස්කම්වලට භාජනය වුණු අනුරපුර යුගයේ ස්තූපවලට සමානකම් ඇති බවක් පෙනේ.[4] කිරිවෙහෙර තැනීමේ දී පේසාවළලු තුනක් මත

රට ම ආවරණය වන සේ ඇති කළේ ය.[1] විජයබාහු රජු තම රාජ්‍ය අභිෂේක මංගල්‍යය අනුරාධපුරයෙහි සිදු කළ බව මහාවංසයේ සඳහන් වේ. හෙතෙම විනාශ මුඛයට පත් ව තිබුණු අනුරපුරය හැකි පමණින් පිළිසකර කරවා සිය රාජ්‍ය පාලන මධ්‍යස්ථානය ලෙස පොළොන්නරුව තෝරාගෙන එහි සිට ඉදිරි කටයුතු කළේ ය.[2]

විජයබාහු ගෙන් පසු පොළොන්නරුව තම පාලන මධ්‍යස්ථානය කොටගනිමින් I පරාක්‍රමබාහු නම් වූ වීරෝදාර නරපති ක්‍රි.ව. 1153-1186 දක්වා වසර 33 ක අභිමානවත් පාලන කාලයක් ඇති කළේ ය. හෙතෙම දේශයේ උන්නතිය සඳහා ආර්ථික, කලාත්මක හා ආගමික දියුණුමක් ස්ථාපිත කරවී ය.

ආනතුරු ව පොළොන්නරුවේ රජ පැමිණි කාලිංග වංශික කීර්ති ශ්‍රී නිශ්ශංක මල්ල ක්‍රි.ව. 1187-1197 නරේන්ද්‍රයෝ, මහපැරකුම්බා රජතුමන් ගේ කාර්යයන් අනුගමනය කරමින්, ඒවා තව දුරටත් කරගෙන යාමෙහි කැපවී කටයුතු කළහ. අනුරපුර යුගය අවසන දී නැත්තට ම නැති වුණු කලාත්මක අබිමන් සංවර්ධන යුගයක් බිහි කරගැනීමට විජයබා, මහපැරකුම්, නිශ්ශංකමල්ල ආදී වීරෝදාර රජුන් ගේ නායකත්වය උපයෝගී විය.

### පොළොන්නරුව කලාශිල්පයන්හි විශේෂ ලක්ෂණ

අනුරපුර රාජ්‍ය පාලනය බිඳවැටීමෙන් අනතුරු ව වසර පනහක පමණ වූ සොලී පාලන කාලයෙහි සිංහල සම්ප්‍රදායට අනුකූල ගෘහනිර්මාණ ශිල්ප කලාවන් ඉදිවීමක් සිදු නොවුණත්, ඇතැම් ද්‍රවිඩ කලා අංග සිංහල කලාවට ඇතුළු වී ඇති බවක් පෙනේ.[3] පොළොන්නරුවේ ශෛව කෝවිල ආශ්‍රිත ව එම රාජධානියෙන් සොයාගන්නා ලද විශිෂ්ට නටරාජා හා යෝගීන් ද, ශිව හා පාර්වතිය ද ඇතුළු ලෝකඩ රූ දකුණු ඉන්දියාවේ සෑදූ නිර්මාණ මෙහි ගෙන එන්නට ඇත.

ලංකාවේ ස්වාධීනත්වය ඇති කළා වූ I විජයබාහු රජු (1055-1110) අනුරපුර පැරණි අගනුවර දී අභිෂේක ලබා, පොළොන්නරුව වියග්‍රාහී රාජධානිය කරගත් අතර බුද්ධාගම හා කලාශිල්පයනට,

# පොළොන්නරු යුගයේ කලාශිල්ප

සිරි නිස්සංක පෙරේරා

**මූලාරම්භක ඓතිහාසික තොරතුරු**

විජය රජු දවස ක්‍රි.පූ. 6 සියවස දී විජය නම් වූ අමාත්‍යයකු විජිතපුරය නම් වූ පුරවරයක් ගොඩනගා ගෙන සිටි බැව් මහාවංසයේ සඳහන් වේ. දුටුගැමුණු රජු දවස විජිතපුරය නම් වූ එළාර රජු ගේ බලකොටුව පොළොන්නරුවේ පිහිටියේ ය. ගැමුණු රජු ගේ සංග්‍රාමික හමුදා එය අත්පත් කරගැනීමට මාස හතරක් කඳවුරු බැඳ සටන් වදිමින් සිටි අතර, අද ඒ කඳවුරු බැඳි ප්‍රදේශය කඳවුරුපිටිය නමින් හැඳින්වේ. අනුරාධපුර රාජධානිය දේශපාලන එක්සත් බවක් හා ආර්ථික, සංස්කෘතික දියුණුවක් ලබමින් තිබුණේ දුටුගැමුණු, වලගම්බා, වසභ, ගජබා, මහසෙන්, ධාතුසේන ආදී වූ වීරෝදර රජවරුන් ගේ අභීත බව නිසා ම ය. එහෙත් IV මිහිඳු ගේ කාලයෙන් පසු ලංකාව දක්ෂිණ ඉන්දීය ආක්‍රමණ හා ආධිපත්‍යයට ගොදුරුවීම හේතු කොට අනුරාධපුර රාජධානිය ක්‍රමයෙන් පරිහානිය කරා ළඟාවුණු බව ප්‍රකට කරුණකි. I රාජරාජ හා රාජේන්ද්‍ර චෝල යටතේ ලංකාව පළමුවරට චෝල ආධිපත්‍යයේ යටත් විජිතයක් ලෙසට ද පාලනය විය.

ලංකාවට නැවතක් දේශභිමෙතෂී පාලකයකු බිහි වන තෙක් වසර පනහකට ආසන්න කාලයක්, එකී පාලනය යටතේ සිටින්නට සිදු විය. පොළොන්නරුව ලංකාවේ ඔවුන් ගේ පාලන මධ්‍යස්ථානය ලෙස ක්‍රියාත්මක විය.

රෝහණයේ I විජයබාහු පොළොන්නරුව රාජධානිය කොටගනිමින් සොලීන් මර්දනය කොට රාජ්‍යය බලය අත්පත් කොටගෙන ක්‍රි.ව. 1055-1110 දක්වා සිංහල පරිපාලන ක්‍රමයක්, මුළු

# සටහන්

1. ධර්මප්‍රදීපිකාව - පිටු අංක 293
2. ධර්මප්‍රදීපිකාව - පිටු අංක 295
3. බුත්සරණ - වැලිවිටියේ සෝරත නායක මාහිමි, 1959

# ආශ්‍රිත ග්‍රන්ථ


1. අමාවතුර - ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ සංස්කරණය, 2004.
2. ධර්මප්‍රදීපිකාව - සංස්කරණය, පණ්ඩිත බද්දේගම විමලවංස ස්ථවිර, ද්විතීය මුද්‍රණය, 1967
3. බුත්සරණ - සංස්කරණය, වැලිවිටියේ සෝරත නාහිමි, ප්‍රථම මුද්‍රණය, 1962
4. පොළොන්නරු යුගය - මුද්‍රණය, 1966
5. සිංහල සාහිත්‍යයේ නැගීම - මාර්ටින් වික්‍රමසිංහ, මුද්‍රණය, 1959
6. සිංහල සාහිත්‍ය වංශය - ආචාර්ය පුංචිබණ්ඩාර සන්නස්ගල, මුද්‍රණය 1964
7. සිංහල සාහිත්‍යය - මහාචාර්ය ආනන්ද කුලසූරිය, මුද්‍රණය 1959

කාව්‍ය දෙකක් වශයෙන් සසදාවත හා මුවදෙව්දාවත හඳුන්වාදිය හැකි ය. මේවා ගී කාව්‍ය ගණයට වැටේ. එසේ ම මේ කාව්‍ය ද්වයෙහි ම පෙර පසුබව ඉඳුරා කිව නොහැකි ය. භාරතීය අලංකාර වාදයෙහි දක්වා ඇති මහාකාව්‍ය ලක්ෂණ අනුව මේ කෘති දෙක ම රචනා වී ඇති බව පැහැදිලි ය. එහෙත් මහා කාව්‍යයක මුඛ්‍ය ලක්ෂණ වශයෙන් ගැනෙන සර්ගවලට ඡවන් ක්‍රීරීමක් මේ කාව්‍ය දෙකෙහි දක්නට නොලැබෙන නිසා මේ ඛණ්ඩ කාව්‍ය වශයෙන් සැලකේ කෙසේ වෙතත් මේ කාව්‍ය ද්වයෙහි ම අන්තර්ගත වර්ණනා කථා වස්තු හා කිසිසේත් ම බද්ධ වී නොමැත. රස-භාව නිරූපණයෙන් ද හීන ය. කෙසේ වෙතත් සීගිරි ගීවලට අමතර ව අපට ඉතිරි වී ඇත්තේ මුවදෙව්දාවත හා සසදාවත යි. පොළොන්නරු යුගයේ ගද්‍ය-පද්‍ය කාව්‍යද්වයෙන් ම යුක්ත වීමට යථෝක්ත පද්‍යකාව්‍ය ද්වය ද විශේෂ තැනක් ගනී. මෙසේ සිංහලයෙන් රචිත සම්භාව්‍ය කාව්‍ය කිහිපයකට පොළොන්නරුව යුගය සීමා වුවත් ශබ්ද ශාස්ත්‍රවේදීහු මේ යුගයෙහි විරචිත ගද්‍යමය ව්‍යාඛ්‍යාන ග්‍රන්ථ අගය කොට සලකති. ධර්මප්‍රදීපිකාවත්, අමාවතුර හා බුත්සරණත් මුළු සිංහල සාහිත්‍ය වංශයේ ම අග්‍රගණ්‍ය නිර්මාණ වශයෙන් සැලකේ.

කවියකු වශයෙන් විචාරකයා ගේ ඇගයීමට ලක් වීය. ඔහු ඇතැම් විටෙක බුදුන්වහන්සේ කෙරෙහි පැවති අපරිමිත ශ්‍රද්ධාව හා භක්තිය කවිත්වය සමග මුසු කරගනිමින් පාඨක-ශ්‍රාවක උභය පක්ෂය ම තෘප්තියට පත් කළේ ය. මේ බව "ඒ මිහිරි රුව ඇසෙතුත් මැ, ඒ මිහිරි කටහඬ කනැ හෙත් මැ, දකුණතින් ගත් කඩුව වැටී හෙනබව් නොදනැ වමතින් ගත් පලඟ වැටී හෙනබව් නොදන දෙක දෙඅතින් හෙලා ශ්‍රී පාදයෙහි වැඳ වැතිර ගොස් දනිම් ස්වාමීනි, හැඳින්නෙම් ස්වාමීනි, මහාමායා දේවීන් වහන්සේ ගේ පුතණුවන් වහන්සේ නුඹද? ශුද්ධෝදන රජ්ජුරුවන් වහන්සේගේ පුතණුවන් වහන්සේ නුඹ ද? ගැත්තවූ කරන පව් ස්වාමීන් ඇසට පැනිණි ද? මෙතෙක් තැන් වැඩියේ ගැත්තවූ කෙරෙහි කරුණාවෙන් ද? දිවි පමණින් සරණ වන්මි ඇස නිවී ගියේ සිත සැනහී ගියේ කළ පව් ගෙවී ගියේ ගැත්තවුට කරුණා කොට වදළ මැනවැයි කීය."[3] (අංගුලිමාල දමනය). මෙසේ සෑම දමන කථාවක් ම භක්ති රසය ජනිත වන ආකාරයට නිර්මාණය කිරීම කතුවරයා ගේ අරමුණ විය.

බුත්සරණෙහි අවසාන පරිච්ඡේදය වෙස්සන්තර ජාතකය යි. ඒ අනුව මේ ජාතක කතාව කියා පෑමෙන් ඔහු ගේ අපේක්ෂාව තවත් ආකාරයකින් ශ්‍රද්ධා භක්තිය ජනිත කරවීම බව පැහැදිලි ය. එමෙන් ම මේ කථාව ගෙන හැර දැක්වීම විද්‍යාචක්‍රවර්තීන් ගේ ප්‍රතිභාවත්, ව්‍යුත්පත්තියත් නොඅඩු ව හෙළි කරන රචනයකි. සිද්ධි, අවස්ථා නිරූපණ මගින් චරිත නිරූපණය විසින් ද ඔහු දක්වා ඇත්තේ පැරණි බොහෝ කතාකරුවනට වඩා නිපුණ බවකි. එහි එන සියලු ම චරිත විනිවිද දැක ඇතැ යි කිව හැකි ය.

සමස්තයක් වශයෙන් ගත් විට පොළොන්නරු යුගය වර්ණවත් වූයේ ගුරුළුගෝමීන් ගේ අමාවතුරත්, විද්‍යාචක්‍රවර්තීන් ගේ බුත්සරණ යන සම්භාව්‍ය ගද්‍ය කාව්‍ය ද්වයෙන් බව පැවසිය හැකි ය. එය ගද්‍ය කාව්‍ය සම්ප්‍රදයක් නිර්මාණය කිරීමට මාර්ගෝපදේශගත්වය ගෙනදුන්නේ ය.

පොළොන්නරු යුගයේ සම්භාව්‍ය පද්‍ය කාව්‍ය පිළිබඳ ව ද කෙටියෙන් යමක් පැවසීම උචිත යැ යි සිතේ. මේ යුගයට අයත්

"ආවහ" යනු ගෙන දෙන අරුත යි. ඒ අනුව නිවන ගෙන දෙන නැතහොත් "අමෘත" නම් වූ නිර්වාණය ගෙන දෙන අරුත එයින් ලැබේ.

බුත්සරණට එකී අපර නාමය ප්‍රසිද්ධියට පත් වූයේ "බුදුන් සරණ යෙමි යි බුත්සරණ යායුතු" යනුවෙන් නිසා බව සැකයක් නැත. එවැනි ග්‍රන්ථංශ 478-482 ක් පමණ බුත්සරණ දක්නට ඇත.

සංස්කෘත ගද්‍ය රීතියත්, ධර්මදේශක ශෛලියත් සංකලනයෙන් බුත්සරණ කථා රීතිය සකසා ගෙන ඇතැ යි විචාරකයෝ පවතසි. අලංකාර වාදය අනුව ගිය සංස්කෘත ගද්‍ය රීතිය එද සිංහල සාහිත්‍ය කෙරෙහි මහත් ප්‍රභාවක් පැතිර වීය. විශේෂයෙන් බුත්සරණ රචනා වී ආවේ භක්ති වාදය පැතිර ගත් සමාජයක ය. හින්දු භක්තිවාදය මෙන් ම මහායාන භක්තිවාදය ද පොළොන්නරු යුගයෙන් පැතිරී ගිය සැටි ගද්‍ය-පද්‍ය සාහිත්‍යයෙන් පමණක් නො ව කලාශිල්පවලින් ද මොනවට පැහැදිලි වෙයි. සමකාලීන ජනවිඥානය සකස් වී තිබුණේ එකී භක්තිවාදයට අනුව ය. මේ යුගයෙහි බෞද්ධ උගත්හු ද භක්ති සංකල්පයට නැඹුරු වූහ. එහෙත් හින්දු භක්තිවාදයට අනුවය. මේ යුගයෙහි බෞද්ධ උගත්හු ද භක්ති සංකල්පයට නැඹුරු වූහ. එහෙත් හින්දු භක්තිවාදයට බෞද්ධයන් යට වනු දක්නට ඔවුහු අකමැති වූහ. මේ නිසා සමාජය තුළ පැවැති භක්තිවාදය බුදුන්වහන්සේ කෙරෙහි යොමු කිරීමට ගුරුළුගෝමි, විද්‍යාචක්‍රවර්ති යන ශ්‍රේෂ්ඨ පඬිවරු උත්සුක වූහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් බුත්සරණ, දහම්සරණ, පූජාවලිය යන ගද්‍ය කාව්‍ය රචනා වීමට මඟ පෑදුණි. මේ නිසා විශේෂයෙන් විද්‍යාචක්‍රවර්තිහු බුත්සරණ අඟනා භක්ති කාව්‍යයක් බවට පරිවර්තනය කළහ.

ශ්‍රද්ධාව, භක්තිය ජනිත වන අයුරින් බස උපයෝගී කරගැනීම බුත්සරණ කතුවරයා ගේ අභිප්‍රාය වීය. එහෙත් විද්‍යාදක්‍රවර්ති හුදු ධර්මදේශකයෙක් පමණක් නො වේ. ඔහු තම කවිත්වයෙන් ගද්‍යා කාව්‍යයකට උචිත කථා රීතියක් ගොඩ නඟාගත්තා පමණක් නො ව හැකි සෑම අවස්ථාවක ම වර්ණනා ඉදිරිපත් කිරීමෙන් වර්ණනා ප්‍රිය

අමාවතුරෙහි බස ගැන විවිධ විද්වත්හු බොහෝ කරුණු පවසති. එහි කිසි තැනක ඉපැරැණි හෙළබසත්, ඇතැම් තැන සකු බසත් කිසි තැනෙක වෙනත් ලේඛකයන් ඇසුරු නොකළ වස්තු ද ස්වකීය නිර්මාණය සඳහා උපයුක්ත කොට ඇත. සමස්තයක් වශයෙන් ගෙන විමසන විට අමාවතුරෙහි බස අනුරපුර සමයෙහි අවසාන භාගයෙහි භාෂා ලක්ෂණ පිළිබිඹු කරන බව පැවසිය හැකි ය. ඔහු ගේ ඇතැම් වාක්‍ය රීති ද බෙහෙවින් ඔහුට ම ආවේණික විය. බුද්ධි ගෝචර රටාවක් අනුව රචිත අමාවතුර පොළොන්නරු යුගයෙන් අරැඹි සම්භාව්‍ය සිංහල කාව්‍යයේ ප්‍රථම කෘතිය වශයෙන් සැලකේ.

පොළොන්නරු යුගයේ රචිත බුත්සරණ සම්භාව්‍ය සිංහල සාහිත්‍යයේ දෙවන කෘතිය යි. එහි කර්තෘවරයා වූ විද්‍යාචක්‍රවර්ති බුදුගුණ කීම වෙනුවට බුද්ධ දර්මයත්, බුද්ධ චරිතයත් යන අංග ද්වය ම කියා පෑමට උත්සුක විය. බුදුන්වහන්සේ ගේ විවිධ ගුණ කියා පෑමට රුචිකත්වයක් දක්වූ විදුසක්විති අදාළ වස්තු විෂයෙහි විධිමත් භාවයක් ගැන ද සැලකිල්ලක් දක්වූ බවක් නො පෙනේ. මේ නිසා පරිච්ඡේද බෙදා දක්වීමක් හරිහැටි සිදු වී නොමැත. බුත්සරණ සංස්කරණය කළ වියතුන් අතර පරිච්ඡේද බෙද වෙන් කිරීමේ දී ඇති වෙනස්කම් මීට කදිම සාධකයකි.

බුත්සරණ අවසානයෙහි "විද්‍යාචක්‍රවර්තීන් විසින් කළ අමෘතාවහ නම් බුද්ධ චරිතය නිමි" යනුවෙන් සඳහන් වෙයි. ඒ අනුව ගත් කතුවරයා ග්‍රන්ථ නාමය ලෙස දක්වා ඇත්තේ "අමෘතාවහ නම් බුද්ධ චරිතය" යන්න බව පැහැදිලි ය. ඒ අනුව අද ව්‍යවහාරයේ ඇති "බුත්සරණ" යන ග්‍රන්ථ නාමය කතුවරයා ගෙන් සිදු වූ බවක් නො පෙනේ. එහෙත් ග්‍රන්ථය ප්‍රසිද්ධියට පත් ව ඇත්තේ එකී නාමයෙනි. දම්සරණ හා සඟසරණ යන ග්‍රන්ථ ද්වය ද රචනා වී ඇත්තේ බුත්සරණ නාමයට අනුකූල ව ය. "අමෘතාවහ" නම් බුද්ධ චරිතය යන ග්‍රන්ථ නාමයට අනුව විද්‍යාචක්‍රවර්ති අමෘතාවහ හා බුද්ධචරිතය යන මේ දෙක ම තම කෘතියට තබා ඇත. බුද්ධචරිතය ඉදිරිපත් කිරීම කතුවරයා ගේ මූලික අභිප්‍රාය වූ නිසා බුද්ධ චරිතය යන සාමාන්‍ය නාමය යොදා ඇතැ යි සිතේ. අමෘත+ආවහ යන වචන ද්වය සන්ධි වීමෙන් " අමෘතාවහ" යන්න ව්‍යවහාර වේ.

යි. මේ ගද්‍ය කාව්‍යය බුදුන්වහන්සේ ගේ 'පුරිසදම්මසාරථී' ගුණය උන්වහන්සේට අන්වර්ථ වන ආකාරය ගම්‍යමාන කිරීම සඳහා රචිත කෘතියකි. "ගුරුළුගෝමීන් විසින් කරන ලද අමාවතුරු නම් පුරිසදම්මසාරථී පද වර්ණනා නිමි." යනුවෙන් කර්තෘවරයා ගේ නම ගුරුළුගෝමී නම් අයකු බව ග්‍රන්ථාවසානයෙහි සඳහන් වේ. පරිච්ඡේද අටළොසකින් සමන්විත අමාවතුර සඳහා අදාළ බුදුගුණයට අවශ්‍ය තැන් බුද්ධ චරිතයෙන් තෝරාගනී. අමාවතුරින් අංගුලිමාල වැනි සොරුන් ද, උපාලි වැනි ගෘහපතීන් ද, නාලාගිරි වැනි ඇතුන් ද දමනය කළ අයුරු නිරූපණය කොට ඇත. එහි දී පුරිසදම්මසාරථී බුදුගුණයට පරිබාහිර වූ කිසිදු කථාවක් ඇතුළත් කිරීමට ගුරුළුගෝමී උත්සුක නො වී ය. මේ අනුව අමාවතුර අගනා සන්දර්භයකින් යුත් සම්භාව්‍ය ගද්‍ය කාව්‍යයක් වශයෙන් අගය කළ හැකි ය. කතුවරයා පාළි කථා රීතිය යොදාගැනීම නිසා කෙටි වැකිවලින් සමන්විත වීම ග්‍රන්ථය පුරා ම දක්නට ඇත. මේ නිසා වේගවත් කථා රීතියක් අනුව කළ අමාවතුර තද්‍යුග සිංහල සාහිත්‍ය කෘතීන් ගෙන් සුවිශේෂ වී ඇත. එහෙත් ඇතැම් විචාරකයෝ අමාවතුර පරිවර්තන කෘතියක් වශයෙන් ද හැඳින්වීමට උත්සුක වෙති.

සිංහල පද්‍යා කාව්‍යය සංස්කෘත රීතියකට වහල් ව කරන ලද්දක් වුව ද, මුල් ම සිංහල ගද්‍ය කාව්‍යය වූ අමාවතුර දේශීය මාර්ගයට හුරු වන රීතියකින් රචනා කොට ඇති බව පැවසේ. සංස්කෘත සාහිත්‍යයෙහි ද හසළ දැනුමැති ගුරුළුගෝමීහු සංස්කෘත ගද්‍ය රීතියට වඩා පාලි රීතිය ගුරු කොටගත් රචකයෙකි. ඉතා සියුම් විග්‍රහයකට ලක් කරන විට අමාවතුරේ වැඩි කොටසක් පදානුවාද වශයෙන් දැකිය හැකි ය. ඡායානුවාද හා භාවානුවාද ද කලාතුරකින් හමුවේ. කතුවරයා ඇතැම් තැනක පෙළ පමණක් ද, ඇතැම් තැනක අටුවාව පමණක් ද, තවත් අවස්ථාවක දී පෙළ අටුවා දෙක ම ද ඇසුරු කර ඇති බව පෙනේ. එහෙත් සමස්තයක් වශයෙන් ගත් විට අමාවතුරෙහි කථා මඟ නො බිඳෙයි. එමෙන් ම එකී කොටස් ඒකාත්මික ස්වරූපයක් දරයි. කෙසේ වෙතත් ශ්‍රේෂ්ඨ පරිවර්තකයා උසස් කලා නිර්මාණ ශිල්පියෙකි. එම නිසා ගුරුළුගෝමීන් ගේ කුශලතාපූර්ව පරිවර්තන එතුමා ගේ කාව්‍ය ශක්තිය වී යැ යි සිතේ.

දෙතිස් මහා පුරිස් ලකුණු, අසූ අනුව්‍යඤ්ජන, දසබල, ලෝක විභාග, නරක විස්තර, දන විභාග, කර්ම විභාග ආදිය විස්තර කෙරෙන ව්‍යාඛ්‍යාන ග්‍රන්ථයකි. ඇතැම් විචාරකයෝ මෙය කෝෂ ග්‍රන්ථයක් වශයෙන් ද හඳුන්වා දෙති. එසේ වුව ද ධර්මප්‍රදීපිකාවෙහි තැනින් තැන සාහිත්‍යික වටිනාකමක් ඇති රචනා කීපයක් දක්නට ඇත.

ඒවා අතර "දන්තපුරෙ රාජා හුත්වා" යන පාඨයට ලියා ඇති රචනාව විමසිය හැකිය. මෙහි වස්තු විෂය සපයාගෙන ඇත්තේ ජාතක අටුවාවේ එන කාලිඞ්ග බෝධි ජාතකයට වඩා බෙහෙවින් ම රසවත් නිර්මාණයකි. එය කුඩා නිර්මාණාත්මක රචනයක් වශයෙන් අගය කළ හැකි ය. භාව ප්‍රබෝධනයෙහිත් රසෝද්පාදනයෙහිත් සමර්ථ ය. මේ රචනය අපූර්වත්වයට පත් වීමේ සාධක කිහිපයක් වේ. ඉන් පළමුවැන්න නිර්මාණාත්මක වීම ය. දෙවැන්න අනුප්‍රාස බහුල මට සිලුටු හෙළ වහර භාවිතය, චමත්කාරජනක ස්වාභාවික සෞන්දර්යයෙන් සමුපේත වීම සහ ශෘංගාර වර්ණනාවන් ගෙන් උපලක්ෂිත වීම යන කරුණු ය. පහත සඳහන් වැණුම්වලින් ඉහත ලක්ෂණ ප්‍රකට වන්නේ මෙසේ ය.

1. "ජලලඹ කළඹින් වැදිලිගත් තැන් මැ දිවයුරු තෙදින් දම් නැත් සේ පැනිණ. බමරබර පුල් ලියනඟලා මැ දසනුදෙසෙහි සහඳුම් ළැව් දල සේ පැනිණ. වලාතෙලෙත් මමන සිහිලැල් නොවීය. සතැවුලි කරන මහගිමෙක් වී.[1]

2. "කියඟ සොඳුරි මහබඹ තෙමෙහි සඳීන් සොම් ගෙනැ. රත් ගලින් පහන් පැහැ උකාගෙනැ වනවිලින් මත්හස් යුවළක් ගෙනැ තුන් රත් පියුමක් ඇරැ එයින් එකක් තබා දෙකක් හිරා ගෙනැ සිනිඳු සුනිල් මහනෙල් මල් දෙකක් ගෙනැ ළහෝපල්ලෙහි මෙළෙ ගෙනැ......."

මේ අනුව විමසා බලන විට ගුරුළුගෝමීන් ගේ සුළුකලිඟුද බස කාව්‍යාත්මක ය. එසේ ම ඔහු දක්ෂ අනුවාදකයෙකි. පාණ්ඩිත්‍යයත්, සතතාභ්‍යාසයත් හිමි කරගත් කවියෙකි.

පොළොන්නරු යුගයේ රචිත අමාවතුර සිංහල සම්භාව්‍ය සාහිත්‍ය ග්‍රන්ථ වංශයට අයත් පැරණිතම නිර්මාණාත්මක ගද්‍ය කාව්‍යය

# පොළොන්නරු යුගයෙන් උදා වූ සිංහල සම්භාව්‍ය සාහිත්‍යය

මහාචාර්ය ආනන්ද අබේසිරිවර්ධන

සිංහල ලේඛන කලාව ක්‍රිස්තු පූර්ව අවධියේ සිට ශතවර්ෂ ගණනක් පුරා අනුක්‍රමයෙන් වැඩි දියුණු වී වර්ධනය වෙමින් පැවැතියේ ය. ඒ සඳහා විද්‍යමාන සාක්ෂ්‍ය බොහෝ ය. ඒවා ආගමික මුහුණුවරක් ගත් ශිලා ලිපිවලටත්, සීගිරි කුරුටු ගීවලටත්, සිඛවළඳ හා සිඛවළඳ විනිස, ධම්පියා අටුවා ගැටපදය හා සියලබස්ලකර යන ග්‍රන්ථ කිහිපයකටත් සීමා වූවකි. ඉහත කී සාධක අතුරින් සීගිරි ගීවලින් ඇතැම් නිර්මාණ කාව්‍යාත්මක අගයෙන් පරිපූර්ණ ය. එහෙත් සිඛවළඳ නිසා උපසපන් භික්ෂූන්-වහන්සේලා ගේ ශික්ෂාපද ඇතුළත් ග්‍රන්ථයකි. ධම්පියා අටුවා ගැටපදය පාළි ධම්මපදට්ඨ කථාවේ අන්තර්ගත ඇතැම් වචනවලට සපයන ලද අර්ථ විවරණ වේ. එය ව්‍යාඛ්‍යාන ග්‍රන්ථයක් වශයෙන් සැලැකිය හැකි ය. සියබස්ලකර දණ්ඩින් ගේ කාව්‍යාදර්ශයේ සෘජු අනුවාද ග්‍රන්ථයක් සේ සැලකිය හැකි ය.

පොළොන්නරු යුගය උදාවෙත් ම සම්භාව්‍ය සිංහල සාහිත්‍යයක සම්භවය ද දැකගත හැකි විය. ගුරුළුගෝමීන් විසින් විරචිත අමාවතුර ප්‍රථම සිංහල සම්භාව්‍ය ගද්‍ය කාව්‍යය වශයෙන් විචාරකයෝ පිළිගනිති. එහෙත් පොළොන්නරු යුගයේ ම රචිත ගුරුළුගෝමීන් ගේ ධර්මදීප්‍රදීපිකා හෙවත් බෝධිවංශ පරිකථා නම් කෘතිය ද ව්‍යාඛාන ග්‍රන්ථයක් ම නො වේ. එය සාහිත්‍යමය ආගයෙන් යුත් ග්‍රන්ථයක් ද වේ. මේ අනුව ගුරුළුගෝමීන් ගේ ධර්මප්‍රදීපිකාව ව්‍යාඛ්‍යාන ග්‍රන්ථයක් වශයෙන් ද සාහිත්‍යමය අගයෙන් යුත් කෘතියක් වශයෙන් ද නිර්ණය කළ හැකි ය. මහාබෝධි වංශයේ අන්තර්ගත පාඨ 205 ක් උද්ධරණය කොට රචිත අතර, එහි දී ඇතැම් පද එනම්,



මිල රු. 125/-

ටී.ඩී.කේ. ප්‍රින්ටර්ස් - 0714771457